
වාර්ෂික වාර්තාව 2023

ஆண்டு அறிக்கை 2023

ANNUAL REPORT 2023



ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனம்

National Building Research Organisation

ආරක්ෂක අමාත්‍යාංශය

பாதுகாப்பு அமைச்சு

Ministry of Defence

2023

2023 වාර්ෂික වාර්තාව ජා.ගොඩ.ප. සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව (IMC) විසින් 2024 පෙබරවාරි මස 27 වන දින පැවති රැස්වීමේදී අනුමත කරන ලදී.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
தேசிய கட்டிட ஆராய்ச்சி நிறுவனம்
NATIONAL BUILDING RESEARCH ORGANISATION
99/1, ජාවත්ත පාර, කොළඹ 5. 99/1, ஜாவத்தை வீதி, கொழும்பு 5. 99/1, Jawatta Road, Colombo 5.
Tele : 011-2588946 Fax : 011-2502611 e-mail : info@nbro.gov.lk Website : www.nbro.gov.lk

පටුන

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය	**6**
අපගේ දැක්ම	**8**
අපගේ මෙහෙවර	**8**
අපගේ ඉලක්කයන්	**8**
සභාපතිගේ සමාලෝචනය	**9**
විධායක වාර්තාව	**12**
ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය	**18**
මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය	**20**
රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ වන ව්‍යාපෘතීන්	20
නායයෑම් උපද්‍රව කළාප සිතියම්කරණ වැඩසටහන	*21*
නායයෑම් විමර්ශන	*22*
නායයෑම් අවම කිරීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන)	*23*
නායයෑම් අවදානම් ප්‍රදේශ සඳහා අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම	*23*
තත්‍යකාලීන නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම (පද්ධතිය නඩත්තු කිරීම)	*24*
ගොඩනැගිලි තක්සේරුකරණය සහ තත්ත්ව වාර්තාකිරීමේ ව්‍යාපෘතිය (BACR)	*24*
පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්	**25**
සමුළුව	**27**
ප්‍රධාන උපදේශක ව්‍යාපෘතීන්	**28**
යාබද ගොඩනගන ලද පරිසරය වෙත අත්විය හැකි අහිතකර බලපෑම් තක්සේරු කිරීම සඳහා භූතාක්ෂණික නිශ්කාෂණය නිකුත් කිරීම	28
මහනුවර ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) අස්ථායී බෑවුම් සහ හානියට පත් ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ස්ථායී කිරීම	28
උපදේශන අධීක්ෂණය අදියර 01 - ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)	30
මුතුරාජවෙල සේදුම් යන්ත්‍රයන් මඟින් නිකුත් කෙරෙන අක්වෙරළ වැලිවල තත්ත්වය පරීක්ෂාව	31
නව කැළණි පාලම ව්‍යාපෘතියෙහි වැරගන්වන ලද කොන්ක්‍රීට් ව්‍යුහයන් හි තත්ත්වය පරීක්ෂා කිරීම	31
ක්ෂේත්‍ර විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලසුම්	32
ගොඩනැගිලිවල ව්‍යුහාත්මක විමර්ශන සහ හානි තක්සේරු කිරීම	32
ව්‍යාපෘති කළමනාකරණ සහ උපදේශන සේවා	33
පරීක්ෂණ සහ උපදේශන මඟින් වූ ආදායම	**34**
වෙනත් තාක්ෂණික මැදිහත්වීම්	**35**
ජා. ගො. ප. සංවිධානයෙහි GeoAi_Lab පර්යේෂණාගාරය, තිරසාර මෙන් ම ඔරොත්තු දෙන ගොඩනඟන ලද පරිසරයක් කෙරෙහි තුඩු දෙන භූගෝලීය නව්‍ය උත්පාදනයන් බිහි කරයි	35
ජා. ගො. ප. සංවිධානය දීඝවාපි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙහි සම්බන්ධ වීම	36
අවට වායු තත්ත්ව අධීක්ෂණ ජාලය වැඩිදියුණු කිරීම සඳහා අතහැර දමා ඇති ජංගම වායු තත්ත්ව පර්යේෂණාගාරය අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම	37
විසරණ සහ රෙසින ඇතිරුම් ගල් ඇලවුම් (Dispersion & Resin Tile Adhesive) පරීක්ෂණ හඳුන්වා දීම	38
ජා. ගො. ප. සංවිධානය මඟින් නිෂ්පාදිත සම්මත වැලි	39
රසායනික කර්මාන්තවල හදිසි ගිනි ගැනීම් පිළිබඳ ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයේ මැදිහත් වීම	41
අවට වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ ද්විතීක තහවුරු කිරීමේ උපායමාර්ගයක් ලෙස ඉහළ නිරවද්‍ය අම්ල වැසි ජල රැස්කරණයක් සහ අනාවරකයක් සංවර්ධනය කිරීම	41
ද්විත්ව වළලු (විනිවිදයාම් මාපකය) භාවිතයෙන් ක්ෂේත්‍රයේ පස්වල විනිවිදයාම් සීඝ්‍රතාව නිගමනය කිරීම	42
කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ගස් කඩා වැටීම් හේතුවෙන් සිදු වන ජීවිත හානි සහ දේපළ හානි වැළැක්වීම සඳහා අනතුරුදායක ගස් හඳුනාගැනීම සඳහා වෘක්ෂ අවදානම් තක්සේරුකරණය	43
දත්ත සමුදා කළමනාකරණය සහ සාමාන්‍ය ජනතාව වෙත දෛනික වාර්තා ජනනය කිරීම සඳහා ඉන්ටර්නෙට් ඔෆ් තිංස් (IOT) පද්ධති සංවර්ධනය	44
ජා. ගො. ප. සංවිධානය විසින් සංවර්ධනය කරන ලද සම්ප්‍රදායික වර්ෂාමාන	44
ආපදා අවදානම් අවම කිරීම සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිතය	45



මෙම වාර්තාව අන්තර්ජාලයෙන් භාගත කිරීම සඳහා

https://www.nbro.gov.lk/downloads/AnnualReport2023S.pdf

2023 ලෝක ජනාවාස දිනය සැමරීම වෙනුවෙන් ජා. ගෙ. ප. සංවිධානය විසින් ඔරොත්තු දෙන නිවාස පිළිබඳ උපදේශන සේවාවක් දියත් කරයි	47
සිනමන් එයාර් සතු ජලය මත පාවෙන ගුවන් යානා ගොඩබැස්සවීමේ දී හා ගුවන්ගත කිරීමේ දී ජනනය වන ජල තරංග මඟින් කාශල්රී ජලාශ ඉවුර බාදනය වීම කෙරෙහි බලපෑම තක්සේරු කිරීම	47
නේවාසික ගොඩනැගිලිවල ගෘහස්ථ ශබ්දය පරීක්ෂා කිරීම සඳහා බිත්ති බදාමයේ ධ්වනි ගුණාංග විමර්ශනය	48
කොළඹ නාගරික ප්‍රදේශ තුළ වායු ගුණාත්මකභාවය කළමනාකරණය (AQM) පිළිබඳ සාක්ෂි පදනම් ප්‍රතිපත්ති සහ උපායමාර්ගයන් වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතිය	49
විදේශ/දායකත්ව සහයෝගීතා සහිත ව්‍යාපෘති	**50**
ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම් අවම කිරීම (RLVMMP)	50
ශ්‍රී ලංකාව සඳහා ගොඩනැගිලි කේත සංග්‍රහයක් සැකසීම සහ ස්ථාපනය කිරීම	53
2023 වසරේ USGS-NBRO නායයෑම් සහයෝගීතාවයන්	54
ශ්‍රී ලංකාවේ වැසි-ප්‍රේරිත වේගවත් හා දිගු-ගමන් සහිත නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය සංවර්ධනය - SATREPS (JICA)	55
STREPS - RRLL ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ භූ කම්පන මාන ස්ථාපනය කිරීම	56
බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයෑම් අවදානම සහ දේශගුණික බලපෑම් මත සිදු වන හානි පිළිබඳ විමසා බැලීමේ සහයෝගීතා ව්‍යාපෘතිය	57
කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල පූර්ව මෝසම් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සීමා සහිත "ජනතාක්ෂණ GTE" ආයතනය, ජා. ගෙ. ප. සංවිධානය සමඟ උපායමාර්ගික සහයෝගීතාවන්	58
ඉතාලියේ ප්ලොරන්ස් හි හයවන ලෝක නායයෑම් සංසදයේ ජා. ගෙ. ප. සංවිධාන සහභාගීත්වය	59
ඔරොත්තු දෙන ප්‍රජාවන් ගොඩනැගීම සඳහා "MOBILISE 3.0" ඩිජිටල් මෙවලම් කට්ටලය	60
ජා. ගෙ. ප. සංවිධානයෙහි ප්‍රකාශනයන්	**62**
ජා. ගෙ. ප. සංවිධානයෙහි 13වන වාර්ෂික පර්යේෂණ සමුළුවෙහි - සමුළු ප්‍රකාශනය	62
ඉලෙක්ට්‍රොනික පුවත් පත්‍රිකා	62
නායයෑම් අවදානම් කළමනාකරණය පිළිබඳ සමාජ මාධ්‍ය (Facebook, YouTube, Twitter සහ අනෙකුත්) හරහා නායයෑම් පිළිබඳ දැනුවත් කිරීම	63
පුහුණු වැඩසටහන්වල සම්මන්ත්‍රණය සහ වැඩමුළු	**65**
ජා. ගෙ. ප. සංවිධානය විසින් TECHNO 2023 ප්‍රදර්ශනයේදී ප්‍රවීණතා සහ නවෝත්පාදන ප්‍රදර්ශනය කරයි	65
නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨයේ සිවිල් ඉංජිනේරු කාර්මික ශිල්පීන් ජා. ගෙ. ප. සංවිධානයෙහි පාරිසරික සහ අධ්‍යාපනික චාරිකාවක නිරතවීම	66
විද්‍යාත්මක ලේඛන සහ ප්‍රකාශනයන් පිළිබඳ වැඩමුළුව	67
ජා. ගෙ. ප. සංවිධානය පාසල් ප්‍රදර්ශනයකට සහභාගී වීම	68
ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රථම ප්‍රතිචාර අභ්‍යාසලාභීන් නායයෑම් අවදානම කළමනාකරණ සහ පර්යේෂණාගාර සේවා පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම පිණිස ජා. ගෙ. ප. සංවිධානය වෙත පැමිණීම	68
විගණනය සහ කළමනාකරණ කමිටු වාර්තාව	**70**
විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන	**71**
විගණකාධිපති වාර්තාව	**76**
පසුගිය වසර 10ක මූල්‍යමය සුවිශේෂී අවස්ථා	**85**
ආයතනික පාලන වාර්තාව	**86**
මූල්‍ය ප්‍රකාශනවලට ඇමුණුම්	**90**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (ජා. ගො. ප. සංවිධානය) 1984 මාර්තු මස 04 වන දින අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබීමෙන් අනතුරු ව ස්ථාපිත කරන ලදී. වසර 39කට ආසන්න කාලයකට පසුව, අද වන විට ජා. ගො. ප. සංවිධානය ප්‍රමුඛ පෙළේ පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් මෙන් ම කීර්තිමත් තාක්ෂණික සේවා සම්පාදකයෙකු ලෙස කැපී පෙනෙන තත්ත්වයකට පත් ව ඇත. සංවිධානයේ කාර්යභාරය (i) නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා කේන්ද්‍රස්ථානය වීම (ii) නිවාස සහ ඉදිකිරීම් අංශය සඳහා සුදුසු තාක්ෂණය පිළිබඳ පර්යේෂණ සහ සංවර්ධනය දිරිමත් කිරීම (iii) ස්වාභාවික විපත්වල බලපෑමට ඔරොත්තු දිය හැකි ඉදිකිරීම් ප්‍රවර්ධනය කිරීම මෙන් ම ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා තාක්ෂණික මාර්ගෝපදේශනය සහ පරීක්ෂණ සේවා සැපයීම (*iv*) ආයතනික විශේෂඥතාව පවතින ක්ෂේත්‍රයන් හි තාක්ෂණික මාර්ගෝපදේශනය සහ පරීක්ෂණ සේවා සැපයීම දක්වා ව්‍යාප්ත ව පවතී

ජා. ගො. ප. සංවිධානය යනු, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශය, පරිසර අධ්‍යයන සහ සේවා අංශය, භූතාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය, මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය, නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය සහ ව්‍යුහාත්මක ඉංජිනේරු අංශය යන තාක්ෂණික අංශ හයකින් සමන්විත බහු-විනය සහිත ආයතනයක් වන අතර පරිපාලන අංශය, මුදල් අංශය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහ වැඩසටහන් ඒකකය මෙන් ම, අභ්‍යන්තර විගණන ඒකකය මඟින් සැලසෙන සහයෝගය මත ක්‍රියාත්මක ආයතනයකි.

කීර්තිමත් පර්යේෂණ ආයතනයක් ලෙස ජා. ගො. ප. සංවිධානය විසින් තම විෂය පථයට අදාළ ව මෙන් ම, පාර්ශවකාර ආයතන මඟින් සිදු කරනු ලබන ඉල්ලීම් අනුව පර්යේෂණ සිදු කරනු ලබයි. ශ්‍රී ලංකාව තුළ නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා වන ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන්





ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වගකීම් සහිත සේවා සපයන්නෙකු වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍රවල තාක්ෂණික ප්‍රවීණයන් සමඟ එක් ව සෑම පුරවැසියෙකුගේ ම ජීවන තත්ත්වය පවත්වා ගැනීමට සහ වැඩි දියුණු කිරීමට සුදුසු විසඳුම් ලබා දීමට උත්සුක ව කටයුතු කරනු ලබයි.

ජා. ගො. ප. සංවිධානය විසින් බෑවුම් අස්ථාවරත්වයන් හඳුනා ගැනීම, නායයෑම් ආශ්‍රිත අවදානම් තක්සේරුකරණය, නායයෑම් අන්තරාය කළාප සිතියම්කරණය, නායයෑම්වල භූ චලනයන් මෙන් ම නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනය නිරීක්ෂණය කිරීම, නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, නායයෑම් අවමකරණය සහ අස්ථාවර බෑවුම් මෙන් ම ගොඩනැගිලි පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීම සිදුකරනු ලබයි. මීට අමතර ව ජා. ගො. ප. සංවිධානය විසින් දිවයිනේ නායයෑමේ අවදානම් සහිත ප්‍රදේශවල සියලුම ඉදිකිරීම් සහ සංවර්ධන කටයුතු සඳහා නායයෑම් අවදානම් තක්සේරු වාර්තා (Landslide Research and Risk Assessment) නිකුත් කිරීම සුවිශේෂී සේවාවක් ලෙස ඉටු කරනු ලබයි. මහා භාණ්ඩාගාරය විසින් පර්යේෂණ සහ ජා. ගො. ප. සංවිධානය මඟින් ක්‍රියාත්මක කරනු ලබන නායයෑම් අවදානම් කළමනාකරණ ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන සපයනු ලබයි.

ජා. ගො. ප. සංවිධානය ස්වයං අරමුදල් සහිත ආයතනයක් වශයෙන් පරීක්ෂණ සහ තාක්ෂණික උපදේශන සේවා සැපයීම මඟින් උපයා ගන්නා ආදායම තුළින් තම ආයතනික පුනරාවර්තන වියදම් පියවා ගැනීම සිදු කරයි. ජා. ගො. ප. සංවිධානය සතු ජාත්‍යන්තර ප්‍රමිති ආයතන (ISO) ප්‍රතීතනය ලත් එමෙන් ම ඉතා උසස් හා ඉහළ පහසුකම්වලින් සමන්විත විද්‍යාගාර තුළින් භූ තාක්ෂණික ඉංජිනේරු පරීක්ෂණ සහ ඉදිකිරීම් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය පිළිබඳ යෝග්‍යතාව, ජලය, අපජලය, පස, අවසාදිත, වාතය සහ සමුච්ඡිත විමෝචනය, පරීක්ෂා කිරීම මෙන් ම, ගොඩනැගිලි තත්ත්වය සහ ව්‍යුහාත්මක අඛණ්ඩතාව තක්සේරු කිරීම, වෙනත් විවිධ තාක්ෂණික අධ්‍යයන වැනි තාක්ෂණික උපදේශනයන් තුළින් ජා. ගො. ප. සංවිධානය වෙත වඩාත් අවශ්‍ය කරන ආදායම් සම්පාදනය සිදුවේ.

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වගකීම් සහිත සේවා සපයන්නෙකු වශයෙන් විවිධ විෂය ක්ෂේත්‍රවල තාක්ෂණික ප්‍රවීණයන් සමඟ එක් ව සෑම පුරවැසියෙකුගේ ම ජීවන තත්ත්වය පවත්වා ගැනීමට සහ වැඩි දියුණු කිරීමට සුදුසු විසඳුම් ලබා දීමට උත්සුක ව කටයුතු කරනු ලබයි.



අපගේ දැක්ම

ආපදා ප්‍රත්‍යාස්ථිතික හා තිරසාර නිර්මිත සුරක්ෂිත
පරිසරයක වෙසෙන ජනතාවක්



අපගේ මෙහෙවර

ආපදා අවදානම අවමකිරීම උදෙසා ඔරොත්තුදීමේ හැකියාව
ගොඩනැගීම තුළින් සැමට සුරක්ෂිත හා තිරසාර නිර්මිත පරිසරයක්

අපගේ ඉලක්කයන්

ඉලක්කය 1 : ආපදා අවදානම් තක්සේරු කිරීමේ විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුළ තාක්ෂණික විශිෂ්ඨත්වය කරා ළඟාවීම

ඉලක්කය 2 : ආපදා අවදානම අවමකිරීම (DRR) හි අදාළ විෂයයන් හා විෂය ක්ෂේත්‍ර තුළ නෛතික තත්ත්වය සහ ව්‍යවස්ථාපිත බලතල ළඟාකර ගැනීම.

ඉලක්කය 3 : පාරිසරික, භූ තාක්ෂණ ඉංජිනේරු, ගොඩනැගිලි ද්‍රව්‍ය, ප්‍රත්‍යාස්ථිතික පාරිසරික සැළසුම්කරණය සහ ප්‍රත්‍යාස්ථිතික ඉදිකිරීම් තාක්ෂණය පිළිබඳ ප්‍රතීතනය ලත් පරීක්ෂණ සහ තාක්ෂණික සේවා සපයන ඉහළම ජාතික ආයතනයක් බවට පත්වීම

ඉලක්කය 4 : ආපදා අවදානම අවමකිරීම (DRR) සහ ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව සංවර්ධනය පිළිබඳ තාක්ෂණය හා නවෝත්පාදන ක්ෂේත්‍රවල පර්යේෂණ හා සංවර්ධන විශිෂ්ඨත්වය ළඟාකර ගැනීම.

ඉලක්කය 5 : ජාතික සහ කලාපීය සහයෝගීතා හා සම්බන්ධතා මඟින් ආපදා අවදානම අවමකිරීම (DRR) දිරිගැන්වීම හා පවත්වාගෙන යාම සඳහා ආපදා ප්‍රත්‍යාස්ථිතික විද්‍යා හා තාක්ෂණය යොදාගැනීම.

ඉලක්කය 6 : ඵලදායී ලෙස ආපදා අවදානම අවමකිරීම සඳහා අදාළ විෂයයන් හා විෂය ක්ෂේත්‍රය තුළ ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීම

ඉලක්කය 7 : ආපදා අවදානම අවමකිරීමේ ඵලදායී ක්‍රියාත්මකවීම උදෙසා ජා. ගො. ප. සංවිධානයෙහි මූල්‍ය තිරසාර බව ළඟාකර ගැනීම.

ඉලක්කය 8 : නායයෑම් අවදානම කළමනාකරණය සඳහා විශිෂ්ඨත්වයෙන් යුත් ජාතික කේන්ද්‍රස්ථානය බවට පත්වීම.

ඉලක්කය 9 : දේශගුණික සවිඥානික පූර්ව අනතුරු හැඟවීමේ තාක්ෂණය තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම

ඉලක්කය 10: පරිසරය මත පදනම් ආපදා අවදානම් අවමකිරීමේ තාක්ෂණය තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම

ඉලක්කය 11: ප්‍රජා විද්‍යාව පදනම් කරගත් ආපදා අවදානම අවමකිරීමේ ක්‍රියාවලීන් තුළින් ආපදාවන්ට ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම.

සභාපතිගේ සමාලෝචනය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වසර සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (ජා. ගො. ප. සං) වාර්ෂික වාර්තාව සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන් සඳහා ජා. ගො. ප. සංවිධාන අන්තර්වාර කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා වශයෙන් මෙන් ම රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයා ලෙස මෙම ප්‍රකාශය සිදු කිරීමට ලැබීම පිළිබඳ ව මා සතුටු වෙමි.

ආපදා අවදානම් කළමනාකරණය සහ ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීම සඳහා තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරන ප්‍රමුඛ පර්යේෂණ සහ සංවර්ධන ආයතනයක් ලෙස මෙම වාර්තාව ජා. ගො. ප. සංවිධානයෙහි තාක්ෂණික හැකියාවන් සහ එහි මූල්‍ය තිරසරභාවය පිළිබඳ සම්පූර්ණ හරස්කඩක් ඉදිරිපත් කරයි. රට තුළ ආපදා ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීමේ අරමුණින් ජා. ගො. ප. සංවිධානය විශාල කාර්යභාරයක් ආරම්භ කරමින් නව යුගයකට ප්‍රවිශ්ට වී ඇත. ප්‍රමුඛ හා කාර්යක්ෂම රාජ්‍ය ආයතනයක් ලෙස පෙරමුණේ රැඳී සිටින අතර ම, ජා. ගො. ප. සංවිධානය සිය යුතුකම් හා වගකීම් පූර්ණ ලෙස හා උපරිම අයුරින් ඉටු කර ඇත. අභියෝග ජයගනිමින් ජා. ගො. ප. සංවිධානය විසින් දිගින් දිගටම ඉහළම ආදායම් මට්ටමක් උපයා ගනිමින් මූල්‍ය ස්ථාවරත්වය සඳහා ලාභ ද පෙන්නුම් කරයි.

නායයෑම් ආපදා කළමනාකරණය සඳහා වන ජාතික කේන්ද්‍රස්ථානය වශයෙන් ජා. ගො. ප. සංවිධානය නායයෑම් කළාප කරණය සහ සිතියම් ගත කිරීම, පූර්ව අනතුරු ඇඟවීම, නායයෑම් ආපදා අවමකරණය සහ නැවත පදිංචි කිරීමේ කටයුතු අඛණ්ඩ ව ඉටු කරමින් සහ පැවරී ඇති වගකීම් ඉටු කිරීමෙහි සමත් ව ඇත. නායයෑම් අවදානම් ප්‍රදේශවල සංවර්ධන කටයුතු සඳහා උචිත තාක්ෂණික නිර්දේශයන් සහිත නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම, පළාත් පාලන ආයතන විසින් නිකුත් කරනු ලබන ගොඩනැගිලි බලපත්‍ර



සඳහා පූර්ව අවශ්‍යතාවයක් බවට පත් ව ඇති අතර එය නායයෑම් ආපදා සහිත දිස්ත්‍රික්කවල සිදු විය හැකි හානි අවම කර ගැනීමේ තීරණාත්මක පියවරක් වශයෙන් සැලකිය හැකි වේ.

ජා. ගො. ප. සංවිධානයෙහි කැපවීම නායයෑම්වලින් ඔබ්බට ව්‍යාප්ත වී තිබේ. විවිධ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා භූ තාක්ෂණික විශේෂඥතාව සැපයීම, ගොඩනැගිලි තත්ත්ව තක්සේරුකරණය, තත්ත්ව සහතිකයන් සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම, රසායනික ආපදා අවදානම් තක්සේරුකරණය හා කළමනාකරණය සඳහා වන නිර්දේශ නිකුත් කිරීම, වාතයේ ගුණාත්මකභාවයේ පාරිසරික තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූලභාවය අධීක්ෂණය කිරීම, ජලයේ තත්ත්වය සහ ශබ්ද මට්ටම් පිළිබඳ තාක්ෂණික විශේෂඥතාවන් සැපයීම යනාදිය එයට අයත් වේ. තිරසාර හා ඔරොත්තු දෙන පරිසරයක් සඳහා භූගෝලීය බුද්ධිය හඳුන්වා දීම මෙන් ම, මිල අධික ආනයනයන් අවම කරමින් රසායනාගාර පරීක්ෂණ ඔස්සේ ජාත්‍යන්තර ප්‍රමිති ආයතන ප්‍රතීතනයන්ට අනුකූල ව ප්‍රමිති වැලි නිෂ්පාදනය වැනි

රට තුළ ආපදා ඔරොත්තුදීමේ හැකියාව ගොඩනැගීමේ අරමුණින් ජා. ගෝ. ප. සංවිධානය විශාල කාර්යභාරයක් ආරම්භ කරමින් නව යුගයකට ප්‍රවිශ්ට ව ඇත.

නවෝත්පාදනයන් ඔස්සේ ජා. ගෝ. ප. සංවිධානය සිය නිම් වළලු පුළුල් කර ඇත.

ජාත්‍යන්තර හවුල්කාරිත්වය ජා. ගෝ. ප. සංවිධානයෙහි ප්‍රගතියෙහි ශක්තිමත් ශිලා ස්ථම්භයක් ලෙස පවතී. JICA, ICL, USGS, UN යන නියෝජිතායතන, සල්ෆර්ඩ් (Salford) විශ්වවිද්‍යාලය මෙන් ම ලෝක බැංකුව වැනි කීර්තිමත් ආයතන සමඟ පවත්නා සහයෝගිතාව තුළින් පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් මෙන් ම ධාරිතා සංවර්ධන වැඩසටහන්වල දී ද වර්තමානයෙහි ඵලදායී ප්‍රතිඵල ලබා දී ඇත. ශ්‍රී ලංකාව සඳහා ගොඩනැගිලි කේත සංග්‍රහයක් සංවර්ධනය සඳහා සමාරම්භය ඔවුන් ලද කැපී පෙනෙන ජයග්‍රහණයකි.

පිරිවැය අවමකරණයෙන් ඔබ්බට ගමන් කරමින් ජා. ගෝ. ප. සංවිධානය විසින් දැනට ක්‍රියාත්මක දැවැන්ත ව්‍යාපෘතියක් වන අවම කිරීමේ ක්‍රියාමාර්ග තුළින් නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP) වැනි ප්‍රධාන ව්‍යාපෘතීන් සඳහා විදේශ පරිත්‍යාගශීලීන් සහ සංවර්ධන ආයතනයන්ගේ වටිනා උපායමාර්ගික ප්‍රදාන අවස්ථාවන් හා අදාළ වන අරමුදල් සුරක්ෂිත කර ගැනීමට සක්‍රීය ව කටයුතු කර ඇත. මෙම දැවැන්ත ව්‍යාපෘතිය යටතේ 2023 වන විට නායයෑම් අවම කිරීම් රැසක් නියම කර ඇති අතර 2024-2025 කාලය තුළ නිම කිරීමේ අපේක්ෂාවෙන් AIIB සහ GOSL ආයතනයන් හි මූල්‍ය ආධාර මත පාසල්, රෝහල් සහ දුම්රිය මාර්ග මෙන් ම මාර්ග දෙපස අස්ථායී බෑවුම් ස්ථායීකරණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

ජා. ගෝ. ප. සංවිධානය 2023 වර්ෂය තුළ දී ද සිය දිගු කාලීන මූල්‍ය ස්ථාවරත්වය කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙමින් කටයුතු කර ඇත. උපදේශන සහ පරීක්ෂණ සේවා හරහා ස්වයං-උත්පාදන ආදායම සඳහා කාර්යමණ්ඩලයේ කැපවීම ජා. ගෝ. ප. සංවිධානයෙහි විශේෂඥතාවය සහ වටිනාකම් ප්‍රස්තුතය ප්‍රදර්ශනය කරමින් ආකර්ශනීය ප්‍රතිඵල අත්කරගෙන ඇත. පුද්ගල පුහුණුව, අති නවීන උපකරණ සහ නව්‍ය පර්යේෂණ මුලපිරීම් වැනි තීරණාත්මක ක්ෂේත්‍රය වෙත සම්පත් නැවත ආයෝජනය කිරීම සඳහා මෙම ස්වයං මූල්‍ය උත්පාදන අවස්ථා ජා. ගෝ. ප. සංවිධානය වෙත ඉඩ හසර ලබා දී ඇත.

ජා.ගෝ.ප. සංවිධානයනව අරමුදල් අවස්ථා ගවේෂණය කරන අතර ම ශ්‍රී ලාංකීය ජනතාව ආරක්ෂා කිරීමේ විශ්වාසනීය හවුල්කරුවෙකු ලෙස අඛණ්ඩ ව සේවය කිරීමේ හැකියාව තහවුරු කිරීම උදෙසා මූල්‍ය යහපැවැත්ම පවත්වා ගැනීමේ වැදගත් කම හඳුනා ගනිමින් තම ස්වයංපෝෂිත ආකෘතිය උදෙසා කැප වී සිටී.

කණ්ඩායමේ නොසැලෙන කැපවීම නොවන්නට මෙම ජයග්‍රහණය ළඟා කර ගත නොහැකි වනු ඇත. අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන මහතා සහ ඔහුගේ කණ්ඩායම වෙත, ඔවුන්ගේ නොපසුබට උත්සාහය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කරමි. විශිෂ්ඨත්වය සඳහා ඔවුන්ගේ කැපවීම ජා. ගෝ. ප. සංවිධානය ඉදිරියට රැගෙන යනු ඇත.

අපි අනාගතය දෙස බලන විට, අභියෝගාත්මක පරිසරයකට අනුවර්තනය වීමේ අවශ්‍යතාව හඳුනා ගනිමු. වඩ වඩාත් සංකීර්ණ ආපදා අවස්ථාවලට මුහුණ දීමේ දී නවෝත්පාදන සංස්කෘතියක් ඇති කිරීම ඉතා වැදගත් වනු ඇත. අනාගත අභියෝගයන්හට එරෙහි ව එක්සත් පෙරමුණක් ගොඩනැංවීම සහතික කිරීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය, රේඛීය ආයතන සහ ප්‍රාදේශීය ප්‍රජාවන් ඇතුළු පාර්ශවකරුවන් සමඟ සබඳතා ශක්තිමත් කිරීමට අපි ද කැප වී සිටිමු.

අවසන් කිරීමට පෙර, ජා. ගො. ප. සංවිධානයෙහි ගමනේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කළ අය වෙත මාගේ අවංක කෘතඥතාව ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. අතිගරු ජනාධිපතිතුමාට අපි අතිශය ණය ගැති යි; එමෙන් ම, ගරු රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා ඔහුගේ නායකත්වය සහ දූරදර්ශීභාවය අනුව, සාර්ථකත්වය කරා රැගෙන යාමට දායක වී ඇත. තව ද, අපගේ ඉලක්කයන් කරා ළඟා වීමේ දී අන්තර් කාලීන කළමනාකරණ කමිටුවේ (IMC) සාමාජිකයින්ගේ නොසැලෙන උපකාර සහ සහයෝගීතාව උදෙසා මාගේ අවංක කෘතඥතාව පුද කිරීමට කැමැත්තෙමි. ඔවුන්ගේ කැපවීම අභියෝග ජය ගැනීමට සහ අපව ඉදිරියට ගෙන යාමට ඉවහල් වී ඇත.

මීට අමතර ව, ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශය යටතේ ඇති ආයතනවල අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට සහ අපගේ පාර්ශවකරුවන්ට ජා. ගො. ප. සංවිධානය කෙරෙහි ඔවුන් දක්වන අඛණ්ඩ විශ්වාසය පිළිබඳ ව අප ස්තුතිවන්ත වෙමු. අපගේ ප්‍රයත්නයන් ශක්තිමත් කිරීමට සහ අර්ථවත් බලපෑමක් කිරීමට අපට හැකියාව ලබා දීම උදෙසා ඔවුන්ගේ හවුල්කාරිත්වය ඉතා වැදගත් වේ. එබඳු ශක්තිමත් සහයෝගීතාවයන් සහ නොසැලෙන සහයෝගය මඟින් ජා. ගො. ප. සංවිධානය වඩාත් ආරක්ෂිත සහ වඩාත් ඔරොත්තු දෙන ශ්‍රී ලංකාවක් ගොඩනැගීමට ඇති හැකියාව පිළිබඳ ව විශ්වාසය ඇති කරයි.

2023 වසර ජා. ගො. ප. සංවිධානයෙහි ඔරොත්තු දීමේ හැකියාව සහ අනුවර්තනය වීමේ හැකියාව පිළිබඳ සාක්ෂියක් විය. ආපදාවලට ඔරොත්තු දෙන ශ්‍රී ලංකාවක් පිළිබඳ අපගේ දැක්ම ඔස්සේ ඉදිරියට යනවිට, අඛණ්ඩ සහයෝගීතාව, නවෝත්පාදන සහ නොසැලෙන කැපවීම තුළින් අප සැමට සුරක්ෂිත, වඩාත් තිරසාර අනාගතයක් ගොඩනඟා ගත හැකි බව විශ්වාස කළ හැක.



General Kamal Guneratne (Rerd.)
WWV RWP RSP USP ndc psc MPhil
ජෙනරාල් කමල් ගුණරත්න (විශ්‍රාමික)
සභාපති
අන්තර්වාර කළමනාකරණ කමිටුව
ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය
(ලේකම්/ආරක්ෂක අමාත්‍යාංශය)

විධායක වාර්තාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන ජා. ගො. ප. සංවිධානයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය සමඟින් මෙම වාර්ෂික වාර්තාව ඉදිරිපත් කිරීමට ලැබීම මා ලැබූ ගෞරවක් ලෙස සලකමු. 2024 වසරට පෙර ජා. ගො. ප. සංවිධානය අභියෝග රාශියකට මුහුණ දුන්න ද, සිය වගකීම් යුහුසුළු ව ඉටු කරමින් පොදු ව්‍යාපාරයක් ලෙස දිගින් දිගට ම ප්‍රමුඛස්ථානය ගැනීමට අප ආයතනය සමත් ව ඇත. ජා. ගො. ප. සංවිධානය වසර පුරා ආයතනික ස්ථාවරත්වය සහතික කරමින් ප්‍රශංසනීය තාක්ෂණික හා මූල්‍ය කාර්යසාධනයක් පෙන්නුම් කරමින් සිය අරමුණු කඩිනමින් ශාක්සාත් කරගැනීමෙහි ලා කැප වී සිටී.

මෙහි ප්‍රතිඵලයක් ලෙස, පසුගිය වසර 39ක කාලය තුළ ජා. ගො. ප. සංවිධානය එක් එක් අමාත්‍යාංශ වෙත ගමන් කරමින් බොහෝ අමාත්‍යාංශ යටතේ සේවය සපයන ලදී. ඒ හේතුවෙන් ජා. ගො. ප. සංවිධානය තම රේඛීය දිශානතිය වෙනස් කරමින් විවිධ භූමිකාවන් භාරගැනීම මෙන් ම එකී අභියෝග තමන්ට යෝජිත පරිදි පරිවර්තනය කර ගනිමින් සේවය ඉටු කිරීමට සමත් වී සිටී. රටේ වැදගත් ජාතික සංවර්ධන ව්‍යාපෘති රාශියක සේවා සැපයීම සහ ඒ තුළින් නව්‍ය තාක්ෂණයන් ඉගැනීම, තම විෂය පථය පුළුල් කිරීම මෙන් ම, වඩාත් වැදගත් හා කැපී පෙනෙන අයුරින් ජා. ගො. ප. සංවිධානය අනුවර්තනය වීමේ හැකියාව ළඟා කරගෙන ඇත. 1985 වසරේ දී නායයෑම් ආශ්‍රිත අධ්‍යනයන් සහ සේවා සඳහා බලය ලත් ආයතනය ලෙස ජා. ගො. ප. සංවිධානය තෝරා ගන්නා ලද බැවින් ජා. ගො. ප. සංවිධානය හට ආපදා කළමනාකරණ ක්ෂේත්‍රය තුළ ගැඹුරට ප්‍රවිශ්ට වීම අත්‍යවශ්‍ය කරුණක් විය. 2007 වසරේ දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය සමඟ අනුබද්ධ වීමත් සමඟ ම ජා. ගො. ප. සංවිධානයෙහි නිම් වළලු පුළුල් වීම සිදුවූ අතර මේවන විට, (i) නායයෑම් ආපදා කළමනාකරණ සහ අදාළ පර්යේෂණ කටයුතු සිදු කිරීම මෙන් ම, එහි ජාතික කේන්ද්‍රස්ථායක් ලෙස සංවර්ධන කටයුතු සිදු කිරීම (ii) නිවාස සහ ඉදිකිරීම් ක්ෂේත්‍රයෙහි උචිත තාක්ෂණයන් සඳහා දිරි ගැන්වීම හා පර්යේෂණයන්



සිදු කිරීම (iii) ස්වාභාවික විපත් සඳහා ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම, ප්‍රවර්ධනය කිරීම මෙන් ම, (iv) ආයතනික විශේෂඥතාවක් සහිත ක්ෂේත්‍රයන් හි තාක්ෂණික උපදේශන සේවා සැපයීම සඳහා බලය පැවරී ඇති කීර්තිමත් බහුවිධ විනය සහිත මහජන ආයතනයක් බවට පත් ව ඇත.

ජා. ගො. ප. සංවිධානයෙහි කාර්ය මණ්ඩලය විසින් පෙන්නුම් කරන ලද ආදර්ශමත් කැපවීම සංවිධානයේ වත්මන් තත්ත්වයට සැලකිය යුතු දායකත්වයක් ලබා දී ඇත. ඔවුන්ගේ කැපවීමෙහි ප්‍රතිඵලයක් ලෙස ජා. ගො. ප. සංවිධානය ප්‍රමුඛ සහ විශ්වාසනීය තාක්ෂණික සේවා සපයන්නෙකු බවට පත් වී ඇති අතර ආපදා අවදානම් කළමනාකරණය, නිවාස, ඉදිකිරීම් හා පරිසරය වැනි තීරණාත්මක අංශ ආවරණය කරමින් සිටී.

ජා. ගො. ප. සංවිධානය සිය මෙහෙයුම් සහ පුනරාවර්තන වියදම් පවත්වා ගෙන යනු ලබන්නේ මූලික වශයෙන් රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශය වෙත ම උපදේශන සහ පරීක්ෂණ සේවා සැපයීම තුළින් ලැබෙන ආදායම මඟිනි. මෙම ස්වයං-උපයාගත් ආදායම ජා. ගො. ප. සංවිධානයෙහි මූල්‍ය සම්පත්වලින් සැලකිය යුතු කොටසක් වන අතර කාර්ය මණ්ඩල වැටුප් සහ බොහෝ ආයතනික වියදම්

සපුරා ගැනීම සඳහා තීරණාත්මක ලෙස වැදගත් වේ. සමාලෝචිත වර්ෂයේ දී රසායනාගාර පරීක්ෂණ සහ උපදේශන සේවා අංශයේ දැඩි වෙළෙඳපොළ තරඟකාරීත්වය මධ්‍යයේ සිය ඔරොත්තු දීමේ හැකියාව ප්‍රදර්ශනය කරමින් ජා. ගො. ප. සංවිධානය විසින් රු. මිලියන 793.8ක ඒකාබද්ධ පිරිවැටුපක් වාර්තා කර ඇත. තරඟකාරී නියෝජිතායතන විසින් එල්ල කරන ලද අභියෝග මධ්‍යයේ වූව ද, ජා. ගො. ප. සංවිධානයෙහි උපායමාර්ගික ප්‍රයත්නයන් හේතුකොට ගෙන විනිමය නොවන රු. මිලියන 132.5ක් හැරුණු විට රු. මිලියන 146.9ක ශුද්ධ ලාභයක් ලබා ඇත. එය පෙර වසරට සාපේක්ෂ ව ශුද්ධ ලාභයෙහි 31% ක කැපී පෙනෙන වර්ධනයක් වේ.

ආරක්ෂක අමාත්‍යාංශයේ ආපදා කළමනාකරණ අංශයෙහි තාක්ෂණික හස්තය ලෙස, ජා. ගො. ප. සංවිධානය වෙත එහි මෙහෙවර ඉදිරියට ගෙන යාමේ දී ප්‍රධාන ස්ථානයක් හිමිවේ. ජා. ගො. ප. සංවිධානයෙහි මෙහෙවර මූලික වශයෙන් අවධානය යොමු කර ඇත්තේ රට තුළ ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම, තිරසාර සංවර්ධන ඉලක්කයන් සාක්ෂාත් කර ගැනීම උදෙසා වන ප්‍රයත්නයන් මෙන් ම, සෙන්ඩායි ක්‍රියා රාමුවේ දක්වා ඇති මාර්ගෝපදේශ වෙත සමගාමී වීම යනා දී තාක්ෂණික අංශය කෙරෙහි ය. නිවාස සහ ඉදිකිරීම්, ආපදා අවම කිරීමේ උපායමාර්ග, පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය, ගොඩනැගිලිවල ව්‍යුහාත්මක ස්ථායීතාව, ආපදා පිළිබඳ මහජනයා දැනුවත් කිරීම සහ පුහුණුව මෙන් ම ව්‍යසනයන්ට එරෙහි ව ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම ශක්තිමත් කිරීම වැනි අනෙකුත් තාක්ෂණික මැදිහත්වීම් ඇතුළු ආපදා කළමනාකරණයේ විවිධ ක්ෂේත්‍රයන් පිළිබඳ ව පර්යේෂණ සහ සංවර්ධනය කෙරෙහි දැඩි අවධානයක් යොමු කරමින් ජා. ගො. ප. සංවිධානය තම උපායමාර්ගික සැලැස්ම තුළින් සිය කැපවීම ඉස්මතු කර ඇත.

නායයෑම් අවදානම් කළමනාකරණයේ ජාතික කේන්ද්‍රීය ආයතනය වශයෙන් වන භූමිකාව

ජා. ගො. ප. සංවිධානය විසින් ආයතනය වෙත පැවරී ඇති නායයෑම් උපද්‍රව කළාප සිතියම් ගත කිරීම හා නායයෑම් පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම, නායයෑම් අවමකරණය, නැවත පදිංචි කිරීම සහ ප්‍රතිපත්ති ම ය වශයෙන් මැදිහත් වීම් සිදු කිරීම වැනි වගකීම් ඉටු කිරීම අඛණ්ඩ ව ක්‍රියාත්මක කර ඇත. නායයෑම් අවදානම් දිස්ත්‍රික්කවල නායයෑම් අවදානම් සහිත ප්‍රදේශයන් හි සංවර්ධන කටයුතු සිදු කිරීමට පෙර තාක්ෂණික නිර්දේශයන් සහිත ව නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම, පළාත් පාලන ආයතන විසින් නිකුත් කරනු ලබන ගොඩනැගිලි බලපත්‍ර සඳහා පූර්ව අවශ්‍යතාවක් වන අතර එය ඉංජිනේරු ම ය නොවන මිනිස් ක්‍රියාකාරකමක් හේතුවෙන් සිදු වන නායයෑම් නිසා ඇතිවන ජීවිත හා දේපල හානි අවම කිරීම සඳහා වන සැලකිය යුතු මැදිහත් වීමකි.

2023 වසර පුරාවට ජා. ගො. ප. සංවිධානයට බෑවුම් අස්ථාවර වීම්, කණ්ඩි සහ රැඳවුම් බිත්ති කඩා වැටීම් මෙන් ම, ගල් පෙරළීම් ඇතුළු සිදු වීම් මාලාවකට ප්‍රතිචාර දැක්වීමට සිදු විය. මෙම සිදු වීම් විශේෂයෙන් අප්‍රේල් සිට මැයි දක්වා සහ සැප්තැම්බර් සිට දෙසැම්බර් දක්වා කාලය තුළ බහුල ව බදුල්ල, මාතර සහ රත්නපුර වැනි දිස්ත්‍රික්කවල කොටසකට බලපෑම් ඇති කර ඇත. මහනුවර, කෑගල්ල, නුවරඑළිය, මාතලේ, කළුතර සහ ගාල්ල යන දිස්ත්‍රික්කවල ද සුළු සිදුවීම් කීපයක් වාර්තා වී ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් ආයතනය වෙත පැවරී ඇති කාර්යභාරයන් කඩිනමින් ඉටු කරන ලද අතර නායයෑම් නිරීක්ෂණය කිරීම්, නායයෑම් අවදානම් පවුල් ඉවත් කිරීම සඳහා පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම්, නායයෑම් කඩිනම් පරීක්ෂණ පැවැත්වීම සහ මෙම සිදු වීම්වල බලපෑම අවම කිරීම සඳහා නිවැරදි කිරීමේ හා නායයෑම් වැලැක්වීමේ පියවරයන් ක්‍රියාත්මක කිරීම් ඇතුළත් වේ.

ස්වාභාවික විපත්වල බලපෑම අවම කිරීම සඳහා නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතිවල වැදගත් කම ජා. ගො. ප. සංවිධානය විසින් හඳුනාගෙන ඇත. ජා. ගො. ප. සංවිධානයේ ප්‍රධාන කාර්යාලයෙහි පූර්ව අනතුරු ඇඟවීමේ මධ්‍යස්ථානය (**EWC**) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මෙහෙයුම් මධ්‍යස්ථානය හරහා ආන්තික කාළගුණික සිදු වීම්වල නායයෑම් පූර්ව අනතුරු ඇඟවීමේ සහ ඉවත් කිරීමේ නිවේදනයන් නිකුත් කිරීමේ දී ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි. ප්‍රජාවගේ ආරක්ෂාව සහතික කිරීම සඳහා වන කැපවීමේ කොටසක් වන පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානය විසිහතර පැය පුරා ක්‍රියාත්මක වන අතර පවතින තත්ත්වයන් කඩිනමින් නිරීක්ෂණය කරමින් ක්ෂණික ව ප්‍රතිචාර දැක්වීම සිදු කරයි. ජා. ගො. ප. සංවිධානය සතුව 330ට අධික සංඛ්‍යාවකින් යුත් ස්වයංක්‍රීය වැසි මාපක ජාලයක් නායයෑමේ අවදානමට ලක් විය හැකි ප්‍රදේශවල උපායමාර්ගික ව ස්ථාපනය කර ඇත.



මහනුවර **NIFS** ආයතනයේ නායයෑම් අවම කිරීමේ කටයුතු



RLVMMP යටතේ කෑගල්ල bypass මාර්ගයෙහි නායයෑම් අවම කිරීමේ කටයුතු

අනෙකුත් තාක්ෂණික මැදිහත් වීම්

නාගරික ප්‍රදේශවල වාතයේ ගුණාත්මකභාවය නිරීක්ෂණය කිරීමේ වැදගත්කම ජා. ගො. ප. සංවිධානය විසින් තීරණාත්මක තාක්ෂණික මැදිහත් වීමක් ලෙස හඳුනාගෙන ඇත. නව නිරීක්ෂණ තාක්ෂණයන් හඳුන්වා දීම සහ 'ඉන්ටර්නෙට් ඔෆ් තින්ග්ස්' (IoT) පද්ධති සංවර්ධනය ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව අධ්‍යයනයේ නව යුගයක් අරඹා ඇත. රට පුරා අඛණ්ඩ වායු තත්ත්ව අධීක්ෂණ ජාලයක් ස්ථාපිත කිරීම සඳහා නව තාක්ෂණය ඒකාබද්ධ කර ගනිමින් ජා. ගො. ප. සංවිධානය විසින් මෙම පරිවර්තනීය වෙනස සිදු කොට ඇත. මෙම අධීක්ෂණ ජාලය මඟින් එක්රැස් කරන දත්ත භාවිතයෙන් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීම හා නඩත්තු කිරීම ජා. ගො. ප. සංවිධානය විසින් සිදු කරනු ලබන අතර ජා. ගො. ප. සංවිධානයේ වෙබ් අඩවිය හරහා දිනපතා මහජනතාව වෙත තොරතුරු ලබා ගත හැක.


2023 වසරේ දී ජා. ගො. ප. සංවිධානය විසින් GeoAi_Lab විද්‍යාගාරය පිහිටුවීමත් සමඟ ජා. ගො. ප. සංවිධානය වැදගත් සංධිස්ථානයක් සනිටුහන් කරයි. මෙම අති නවීන පහසුකම් සහිත විද්‍යාගාරය මඟින් භූ විද්‍යාව, භූගෝල විද්‍යාව, සංඛ්‍යාලේඛන සහ නාගරික තොරතුරු පිළිබඳ පුළුල් පරාසයක උපදේශන සේවා ලබා දෙමින් අවකාශීය දත්ත රැස් කිරීම සැකසීම හා විශ්ලේෂණය යනාදිය සිදු කරනු ලබයි. 2023 වසර පුරාවට විවිධ අංශයන්ට තාක්ෂණික බුද්ධිය හරහා නව්‍ය විසඳුම් සැපයීම සඳහා මෙම විද්‍යාගාරය (GeoAi_Lab) උපකාරී වී ඇත.

ජා. ගො. ප. සංවිධානය වාර්ෂික කර්මාන්ත උපදේශනය කැඳවීම තුළින් බොහෝවිට, පර්යේෂණ හා සංවර්ධන අවශ්‍යතා හඳුනාගැනීම සිදු කෙරේ. මෙම සහයෝගීතා ප්‍රයත්නය තුළින් ජා. ගො. ප. සංවිධානයෙහි පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන කර්මාන්ත ක්ෂේත්‍රයේ විකාශනය වන ඉල්ලීම් ඉළක්ක කර ගනිමින් සිදු කරනු ලබයි. ජා. ගො. ප. සංවිධානය විසින් වාර්ෂික පර්යේෂණ සමුළුව පැවැත්වීම සිදු කරනු ලබන අතර එහි දී ජා. ගො. ප. සංවිධානය විසින් සිදු කරනු ලබන පර්යේෂණවල

ප්‍රතිඵල සහ ජාත්‍යන්තර පාර්ශවකරුවන් සමඟ සිදු කරනු ලබන පර්යේෂණවල ප්‍රතිඵල ඉදිරිපත් කරනු ලබයි. මෙම පර්යේෂණයන් හි ප්‍රතිඵල අඩංගු කර සමුළු ග්‍රන්ථයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබයි. 13වන වාර්ෂික පර්යේෂණ සමුළුව 2024 පෙබරවාරි මස 29 දින කොළඹ දී පැවැත්වීමට සැළසුම් කර ඇත.

ස්වදේශ වැලි සඳහා වන අධික ආනයන වියදම අවම කිරීමේ අරමුණින් ජාත්‍යන්තර ප්‍රමිති ආයතන (ISO) ප්‍රතීතනයෙන් යුත් සමුද්දේශ වැලි (Standard Sand) වාණිජ පරිමාණයෙන් නිෂ්පාදනය කිරීම සඳහා රසායනාගාර පරීක්ෂණ කටයුතු 2023 දී ආරම්භ කර ඇත. පර්යේෂණ නවෝත්පාදනයක් ලෙස වාණිජ මට්ටමේ නිෂ්පාදනයක් බවට පත් කරමින් මෙම නිෂ්පාදනය එළිදැක්වීමට හැකි වීම ජා. ගො. ප. සංවිධානය ලැබූ විශාල ජයග්‍රහණයකි.

රජයට අයත් පොදු ගොඩනැගිලි සහ සාමාන්‍ය ජනතාව බහුල ව භාවිත කරන අනෙකුත් නේවාසික ගොඩනැගිලිවල ව්‍යුහාත්මක ස්ථායීතාව තක්සේරු කිරීම, ව්‍යුහාත්මක අසාර්ථක වීම් සහ වෙනත් විවිධ හේතූන් මත ගොඩනැගිලි කඩා වැටීමේ බලපෑම අවම කිරීම ජා. ගො. ප. සංවිධානය විසින් ගත් තීරණාත්මක පියවරයකි. ජා. ගො. ප. සංවිධානය විසින් ගොඩනැගිලි සඳහා තාක්ෂණික/ව්‍යුහාත්මක තක්සේරු වාර්තා නිකුත් කරන අතර ව්‍යුහාත්මක අඛණ්ඩතාව සහ දෝෂ නිවැරදි කිරීම ඇතුළත් නිර්දේශ ලබා දීම සිදු කරයි.



පරීක්ෂණ වැලි ආනයනය කිරීම - 2023

නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සැලසුම් සහ සංවර්ධන රෙගුලාසි යටතේ යාබද පරිසරයට ඇති විය හැකි බලපෑම් තක්සේරු කිරීම සඳහා වූ භූ තාක්ෂණික නිශ්කාෂණ ක්‍රියාවලිය ජා. ගො. ප. සංවිධානය විසින් හඳුන්වා දෙන ලද ඉතා වැදගත් නියාමන ක්‍රියාමාර්ගයකි. යෝජිත ගොඩනැගිල්ල උප ව්‍යුහය ඉදිකිරීමේ දී යාබද දේපලට සහ අවට ගොඩනඟා ඇති පරිසරයට සහ යෝජිත සංවර්ධිත ක්‍රියාවලිය සිදු කිරීමේ දී ඇති වන බලපෑම පුළුල් ලෙස තක්සේරු කිරීම මෙම ක්‍රියාවලියේ දී සිදු කෙරේ.

තාක්ෂණික උපදේශන සහ පරීක්ෂණ කටයුතුවල ගුණාත්මකභාවය සහ කලට වේලාවට සැපයීම සහතික කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි නොසැලෙන කැපවීම තම තරඟකාරී වාසිය පවත්වා ගැනීමට ඉවහල් වී ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි රසායනාගාරයන් 3ම ISO 17025 ප්‍රතීතනයන් පවත්වාගෙන ඉහළ තත්ත්ව ප්‍රමිතීන් ආරක්ෂා කරමින් ක්‍රියාත්මක වේ. මෙම ප්‍රතීතන තත්ත්ව සහතිකය ජා. ගො. ප. සංවිධානයේ කැප වීම පිළිබඳ සාක්ෂියක් ලෙස ක්‍රියාකරන අතර ජාත්‍යන්තර පිළිගත් ප්‍රමිතීන්ට අනුකූල වීම අවධාරණය කරයි.

තාක්ෂණික හවුල්කාරීත්වය

ජාත්‍යන්තර නියෝජිතායතන සහ ආයතන බොහෝවිට ජා. ගො. ප. සංවිධානය වෙත ඔවුන්ගේ තාක්ෂණික සහාය ලබා දීම සිදු කරයි. 2023 වසරේ දී ජපාන ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිත ආයතනය (JICA), ලෝක බැංකුව සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) ඔවුන්ගේ සහාය අඛණ්ඩ ව ජා.ගො. ප. සංවිධානය වෙත ලබා දී ඇත. මීට අමතර ව, එක්සත් ජනපදයේ භූ විද්‍යාත්මක සමාජය (USGS), එක්සත් රාජධානියෙහි සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලය ද ජා. ගො. ප. සංවිධානය වෙත විවිධ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා සහාය දක්වා ඇත.

ජපාන විද්‍යා හා ජපාන තාක්ෂණික නියෝජිතායතනයේ (JST) තිරසාර සංවර්ධනය සඳහා වූ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ හවුල්කාරීත්වය (SATREPS) හා

ශ්‍රී ලංකාව අතර පස් අවුරුදු ඒකාබද්ධ ව්‍යාපෘතියක් ක්‍රියාත්මක වේ. සෙන්ඩායි සහයෝගිතා 2015-2025 හි ගෝලීය හවුල්කරුවන් හරහා නායයෑම් ආපදා අවදානම අවම කිරීමේ ප්‍රයත්නයන් වැඩි දියුණු කිරීම සඳහා උසස් තාක්ෂණය උපයෝගී කරගැනීම මෙම ව්‍යාපෘතියේ අරමුණ යි. මෙම ව්‍යාපෘතිය මඟින් පහසුකම් සපයා ඇති පරිදි ජා. ගො. ප. සංවිධානයෙහි විද්‍යාඥයින් දෙදෙනෙකු සිය ආචාර්ය උපාධි සම්පූර්ණ කර ඇති අතර තවත් කීපදෙනෙකු ආචාර්ය උපාධි සහ පශ්චාත් උපාධි සඳහා මේ වන විට ජපානයේ විශ්වවිද්‍යාලවල තම අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටී.


ආදායම

ජා. ගො. ප. සංවිධානයෙහි පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් සපුරා ගනු ලබන්නේ රාජ්‍ය හා පෞද්ගලික අංශයන් සඳහා උපදේශන සහ රසායනාගාර පරීක්ෂණ සේවා සැපයීම තුළින් ලැබෙන ආදායම මඟිනි. 2010 වසරේ සිට අඛණ්ඩ ව සැලකිය යුතු ශුද්ධ වාර්ෂික ලාභයක් වාර්තා වී ඇත. වසර ගණනාවක් පුරා ආයතනයේ මූල්‍ය ස්ථායීතාව ස්ථීර ලෙස තහවුරු වී ඇති අතර එම කාලය තුළ ආදායම, ලාභය සහ සංචිත ක්‍රමයෙන් වර්ධනය වීම සිදු ව ඇත. මීට අමතර ව ජා. ගො. ප. සංවිධානය විසින් වාර්ෂික ව ආපදා අවදානම් කළමනාකරණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන අරමුදල් ඵලදායී ලෙස පරිහරණය කර ඇත.

කෘතඥතාව

අතිගරු ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමාට, ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මෙන් ම, ජා.ගො. ප. සංවිධානයෙහි අතුරු කළමනාකරණ කමිටුවේ සභාපතිවරයා ද වන (විශ්‍රාමික) ජනරාල් කමල් ගුණරත්න මහතා වෙත ජා. ගො. ප. සංවිධානයෙහි මෙම සාර්ථකත්වය උදෙසා ඔවුන්ගේ මඟ පෙන්වීම හා උපදේශනයන් වෙනුවෙන් ස්තුතිය පුද කිරීමට මම අවස්ථාවක් කර ගනිමි. එමෙන් ම, අතුරු කළමනාකරණ කමිටුවේ සහ විගණන හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්ට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සහ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරුන්ට, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ (ERD)

පසුගිය වසර 8 සඳහා මුළු මෙහෙයුම් ආදායම සහ ශුද්ධ ලාභය




සාමාජිකයින්ට මෙන් ම, ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානයේ (NDRSC) අධ්‍යක්ෂවරයා වෙත ද මාගේ කෘතඥතාපූර්වක ස්තුතිය පුද කර සිටිමි.

මෙම අවස්ථාවේ දී අපගේ ජාත්‍යන්තර පාර්ශවකරුවන් වන JICA, ලෝක බැංකුව, UNDP, ADPC, NGI, AIIB, USGS, ICL ජපානයේ SATREPS, එක්සත් රාජධානියෙහි සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලීය THINKlab මෙන් ම, විවිධ වැඩසටහන් සහ ව්‍යාපෘති වෙනුවෙන් මූල්‍ය හා තාක්ෂණික සහාය ලබා දී ඇති දේශීය සහයෝගීත්ව ආයතන සහ විශ්වවිද්‍යාලයන් වෙත අපගේ කෘතඥතාව පුද කර සිටිමු. ඊට අමතර ව, අපගේ දේශීය පාර්ශවකරුවන් සහ වටිනා පාරිභෝගිකයින් අප කෙරෙහි ඔවුන් දක්වන අඛණ්ඩ විශ්වාසය වෙනුවෙන් මාගේ අවංක ස්තුතිය පුද කර සිටිමි.

ජා. ගො. ප. සංවිධානය වෙනුවෙන් කැප වූ ආයතනයේ සේවකයින්හට මාගේ ස්තුතිය පුද කර සිටින අතර ඔවුන්ගේ උපකාරය නොවන්නට මෑත කාලීන අභිතකර ආර්ථික තත්ත්වයන් හමුවේ මෙතරම් කාර්යසාධනයක් ළඟා කර ගැනීමට හැකි නොවනු ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි කොදුනාරටිය බවට පත් ව ඇත දැනුම, හැකියාව සහ වෘත්තීයමයභාවයෙන් කැපී පෙනෙන දක්ෂ කණ්ඩායම වෙත අපගේ කෘතඥතාව පුද කර සිටිමු.

ඉදිරි වර්ෂයන් තුළ දී ද ජා. ගො. ප. සංවිධානයෙහි කාර්යසාධනය තව දුරටත් වැඩි කිරීමට සහ උපායමාර්ගික සැලසුම් මඟින් නියම කර ඇති මෙහෙවර සහ අරමුණු ඉටු කර ගැනීමට අපි සහයෝග යෙන් යුතු ව කටයුතු කරමු. අපගේ කණ්ඩායමේ සාමාජිකයන් එකිනෙකා වෙත සහයෝගයෙන් හා උපකාරීවන අයුරින් අදහස් හුවමාරු කර ගනිමින් විශාල සාර්ථකත්වයක් කරා ළඟා වනු ඇතැ යි අප විශ්වාස කරමු.



ඉංජිනෙරු (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

ජා. ගො. ප. සංවිධානයේ කළමනාකරණය

විෂයභාර ගරු අමාත්‍ය

ගරු රනිල් වික්‍රමසිංහ
ආරක්ෂක අමාත්‍ය

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්
ආරක්ෂක රාජ්‍ය ඇමති

වර්තමානයේ අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සහිත අන්තර් කළමනාකරණ කමිටුව රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් ජා. ගො. ප. සංවිධානයේ පරිපාලන ම ය, මූල්‍ය සහ කළමනාකරණ කටයුතු සඳහා උපදෙස් හා මඟපෙන්වීම් සිදු කරනු ලබයි.

ජා. ගො. ප. සංවිධානයේ අන්තර්වාර කළමනාකරණ කමිටුව

ජෙනරාල් (විශ්‍රාමික) කමල් ගුණරත්න
(සභාපති)
ලේකම්, ආරක්ෂක අමාත්‍යාංශය

මේජර් ජෙනරාල් සුදන්ත රණසිංහ
අධ්‍යක්ෂ ජනරාල්,
ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය

ආචාර්ය සුගත් යාලේගම මයා
අතිරේක ලේකම් (ප්‍රතිපත්ති හා පාලන)
නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය

ඒ. කේ. කරුණානායක මයා
අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ දෙපාර්තමේන්තුව

එච්. යූ. ආර්. ෆොන්සේකා මයා
ප්‍රධාන ගණකාධිකාරී,
ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය

එස්.ජාලදීපන් මිය
අධ්‍යක්ෂ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්/ලේකම්, අන්තර්වාර කළමනාකරණ කමිටුව, ජා. ගො. ප. සංවිධානය

විගණන හා කළමනාකරණ කමිටුව

එස්.ජාලදීපන් මිය
සභාපති
අධ්‍යක්ෂ, මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව

ඒ. කේ. කරුණානායක මයා
(සාමාජික) අධ්‍යක්ෂ ජනරාල්
කාලගුණ දෙපාර්තමේන්තුව

එච්. යූ. ආර්. ෆොන්සේකා මයා
(සාමාජික) ප්‍රධාන ගණකාධිකාරී
ආපදා කළමනාකරණ අංශය
ආරක්ෂක අමාත්‍යාංශය

නිරීක්ෂක

එල්. බී. ජී. සඳමාලි මිය
විගණනාධිකාරී
විගණන කාර්යාලය

ජේ. ඒ. ඩබ්. කේ. ජයකොඩි මිය
ප්‍රධාන අභ්‍යන්තර විගණක
ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය

සහභාගීත්වය


ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන
අධ්‍යක්ෂ ජනරාල්

කුමුදු රන්දෙනි මිය
අධ්‍යක්ෂ (මුදල්)

එච්. එල්. රුවන්තිලක මයා
අභ්‍යන්තර විගණක

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

සංවිධානයේ ව්‍යුහය



BMRTD - ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂණ අංශය
ESSD - පාරිසරික අධ්‍යයන හා සේවා අංශය
GETD - භූතාක්ෂණ ඉංජිනේරු හා පරීක්ෂණ අංශය
HSPTD - මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය
LRRMD - නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය
SER&PMD - ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය

ADMIN - පරිපාලන අංශය
FINANCE - මුදල් අංශය

ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය

ඉංජි. (ආචාර්ය) ආසිරි කරුණාවර්ධන	අධ්‍යක්ෂ ජනරාල්
සරත් ප්‍රේමසිරි මයා	අධ්‍යක්ෂ, පාරිසරික අධ්‍යයන හා සේවා අංශය
කිත්සිරි එන්. බණ්ඩාර මයා	අධ්‍යක්ෂ, භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය
සුනේත්‍රා මුතුරත්න මිය	අධ්‍යක්ෂ, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය
ධම්මිකා කහහේන්ගොඩ මෙනවිය	අධ්‍යක්ෂ, ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය
ආචාර්ය ගාමිණී ජයතිස්ස මයා	වැ. බ. අධ්‍යක්ෂ, නායයෑම් පර්යේෂණ හා අවදානම් කළමනාකරණ අංශය
චින්තක රත්නසිරි මයා	වැ. බ. අධ්‍යක්ෂ, මානව ජනාවාස සැලසුම්කරණය හා පුහුණු අංශය
කුමුදු රන්දෙනි මිය	අධ්‍යක්ෂ, මූල්‍ය
සරත් කුරේ මයා	වැ. බ. අධ්‍යක්ෂ, පරිපාලන
සෙනරත් බණ්ඩාර මයා	ව්‍යාපෘති අධ්‍යක්ෂ, (PMU), ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවමකිරීමේ ව්‍යාපෘතිය

මූල්‍ය සහ මෙහෙයුම් කාර්ය සාධනය පිළිබඳ විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය තුළ ජා. ගො. ප. සංවිධානය විසින් එහි නම් කරන ලද කාර්යයන් සහ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අනුකූල ව පහත සඳහන් නිශ්චිත කාර්යයන් ක්‍රියාත්මක කර ඇත.



රාජ්‍ය ආයෝජන වැඩසටහන යටතේ වන ව්‍යාපෘතීන්

නායයෑම් අවදානම් තක්සේරු වාර්තා කිරීමේ ක්‍රියාවලිය (LRAR)

කඳුකර ආශ්‍රිත ප්‍රදේශවල මිනිසා විසින් සිදුකරනු ලබන ක්‍රියාකාරකම් සහ අහඹු ලෙස සංවර්ධන කටයුතු සිදු කිරීම හේතුවෙන් සිදුවිය හැකි ජීවිත හා දේපළ හානි අවමකරණය ඉලක්ක කර ගනිමින් LRAR ක්‍රියාවලිය ක්‍රියාවට නංවා ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් පළාත් පාලන ආයතනයන් හා ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයන් වෙත නායයෑම් ආශ්‍රිත ප්‍රදේශයන් හි ගොඩනැගිලි බලපත්‍ර හෝ සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉදිකිරීමේ බලපත්‍ර නිකුත් කළ යුතු ද නැති ද යන්න නිර්දේශ කරමින් නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම සිදු කරයි. ජා. ගො. ප. සංවිධානය විසින් 2011 වසරේ මාර්තු මස වාර්තා නිකුත් කිරීම ආරම්භ කිරීමේ පටන් 2023 දෙසැම්බර් 31 දින වන විට අයදුම්පත් 102,000 ට අධික සංඛ්‍යාවක් සඳහා අනුමැතිය ලබා දීමට කටයුතු කර ඇත. 2023 වසරේ අනුමත කර ඇති අයදුම්පත් කිරීම් සංඛ්‍යාව 9,590ක් වන අතර මේ දක්වා කාලසීමාව තුළ ප්‍රතික්ෂේප වූ අයදුම්පත් සංඛ්‍යාව 836කි. ජා. ගො. ප. සංවිධානය විසින් අයදුම්පත් සැකසීම, අවශ්‍ය පරීක්ෂණ සිදු කිරීම සහ වාර්තා නිකුත් කිරීම වෙනුවෙන් නාමික ගාස්තු අය කිරීමක් සිදු කරනු ලබයි. මෙම ක්‍රියාවලියේ පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා මහාභාණ්ඩාගාරය වෙතින් රු. මිලියන 37.6ක් ලබා දී ඇති අතර ඉතිරි වියදම් ජා. ගො. ප. සංවිධානය විසින් ආයතනික සමාජ ම ය වගකීමක් ලෙස දරනු ලබයි.

වගුව: නායයෑම් අවදානම් සහිත ප්‍රදේශවල ඉදිකිරීම් හා සංවර්ධන කටයුතු සඳහා අනුමැතිය ලබා දීමේ වැඩපිළිවෙලෙහි ප්‍රගති සමාලෝචනය - (LRAB & LRAD) 2011.03.01 සිට 2023.12.31 දක්වා

#	දිස්ත්‍රික්කය	2011.03.01 සිට 2023.12.31 දක්වා				2023.01.01 සිට 2023.12.31 දක්වා				2023 දෙසැම්බර්				පොරොත්තු ඉල්ලුම්පත් විස්තර			
		ලැබුණු ඉල්ලුම්පත්	අනුමැතිය ලබා දී ඇති ඉල්ලුම්පත්	අනුමැතිය ලබා නොදුන් ඉල්ලුම්පත්	වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්	ලැබුණු ඉල්ලුම්පත්	අනුමැතිය ලබා දී ඇති ඉල්ලුම්පත්	අනුමැතිය ලබා නොදුන් ඉල්ලුම්පත්	වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්	ලැබුණු ඉල්ලුම්පත්	අනුමැතිය ලබා දී ඇති ඉල්ලුම්පත්	අනුමැතිය ලබා නොදුන් ඉල්ලුම්පත්	වෙනත් හේතූන් මත අවලංගු කරන ලද ඉල්ලුම්පත්	පොරොත්තු මුළු ඉල්ලුම්පත්	මූලික විමර්ශන/ වාර්තා සැකසීම සඳහා පොරොත්තුව ඇති	නැවත නිරීක්ෂණය/විභාග කිරීම සඳහා නිර්දේශිත	ඉල්ලුම්කරුවන් වෙතින් තොරතුරු අපේක්ෂිත
1	නුවර	23,311	21,185	319	1,754	1,774	1,864	3	87	74	89	1	2	53	48	0	5
2	මාතලේ	10,078	10,024	18	32	854	858	1	-	56	55	0	0	4	4	0	0
3	නුවරඑළිය	8,913	8,449	89	328	689	647	6	147	29	28	2	0	51	31	3	17
4	බදුල්ල/ මොනරාගල	14,850	14,269	252	320	1,486	1,543	31	-	41	61	0	0	9	9	0	0
5	කෑගල්ල	13,127	12,461	75	545	896	872	8	105	31	18	2	0	46	46	0	0
6	රත්නපුර	14,198	12,477	47	1,603	1,450	1,372	1	90	74	78	0	10	71	53	2	16
7	කළුතර	1,475	1,406	16	48	202	185	5	18	9	5	0	0	5	5	0	0
8	ගාල්ල	19,327	19,171	12	92	2,132	2,027	3	68	87	66	0	0	52	52	0	0
9	මාතර/ හම්බන්තොට	2,491	2,478	5	8	153	151	-	2	9	9	0	0	0	0	0	0
10	කුරුණෑගල	72	69	-	1	28	26	-	-	1	2	0	0	2	0	0	2
11	කොළඹ/ ගම්පහ	104	96	3	4	53	45	2	4	2	2	0	0	1	1	0	0
එකතුව		107,946	102,085	836	4,735	9,717	9,590	60	521	413	413	5	12	294	249	5	40

නායයෑම් උපද්‍රව කළාප සිතියම්කරණ වැඩසටහන

නායයෑම් උපද්‍රව කළාප සිතියම්කරණ වැඩසටහන (LHMP)

නායයෑම් උපද්‍රව කළාප සිතියම්කරණ වැඩසටහන යටතේ නායයෑමේ අවදානමක් සහිත දිස්ත්‍රික්ක 13ක් පුරා වර්ග කිලෝමීටර් 32,593.1ක් ආවරණය වන පරිදි 1:50,000 පරිමාණයෙන් යුත් නායයෑම් උපද්‍රව කළාප සිතියම් සැකසීම සිදු කර ඇත. මීට අමතර ව 2023 වසර අවසානය වන විට රු. මිලියන 19.27ක් යොදා ගනිමින් වර්ග කි.මී. 9,880ක ප්‍රමුඛතා ප්‍රදේශ ආවරණය වන පරිදි රත්නපුර දිස්ත්‍රික්කයේ ව. කි. මී. 480ක 1:10,000 පරිමාණයේ සිතියම්කරණය සිදු කර ඇත.

මෙම ව්‍යාපෘතිය තුළින් ජනනය කරන ලද සිතියම් මඟින් නායයෑම් පූර්ව අවදානම තක්සේරුකරණය කෙරෙහි තුඩු දෙන නායයෑම් පර්යේෂණ පැවැත්වීම මෙන් ම, විවිධ නායයෑම් අවමකිරීමෙහි තීරණාත්මක කාර්යභාරයන් ඉටු කරනු ලබයි. තව ද, මෙම සිතියම් නායයෑම් අවම කිරීමේ උපායමාර්ගික ක්‍රියාකාරකම් භාවිත කිරීමේදී ප්‍රමුඛතාව ලබා දිය යුතු, අවදානම් සහිත ස්ථානයන් හඳුනාගැනීම කෙරෙහි උපකාරී වේ. මෙම සිතියම් විවිධ ආයතනයන් විසින් ජාතික හා කළාපීය මට්ටමේ සැලසුම්කරණයන් හි දී භාවිතයට ගනු ලබයි. මෙම සිතියම්වලින් බොහොමයක් වෙත ජා. ගෙ. ප. සංවිධානයෙහි (www.nbro.gov.lk) වෙබ් අඩවිය ඔස්සේ පරිශීලනය කිරීමේ හැකියාව මහජනතාව වෙත සළසා ඇත.

නායයෑම් විමර්ශන (LI)

ජා. ගො. ප. සංවිධානය වෙත දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම්වරුන් සහ රාජ්‍ය ආයතනය මඟින් මානව ජනාවාස, යටිතල පහසුකම් ආශ්‍රිත සහ වතු නිවාස ආශ්‍රිත නායයෑම් අවදානම් ස්ථාන පරීක්ෂාව සඳහා නිරන්තරයෙන් ඉල්ලීම් සිදු කෙරේ. 2023 වර්ෂයේ දී නායයෑම් විමර්ශන 3,106ක් සිදු කර ඇත. මෙම කටයුතු සඳහා මහාභාණ්ඩාගාරය වෙතින් රු. මි. 68.8ක ප්‍රතිපාදන සපයා ඇත.



පේරාදෙනිය නගරයේ නායයෑම



බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල නායයෑම්



මාතර දිස්ත්‍රික්කයේ අකුරැස්ස නායයෑම



දක්ෂිණ අධිවේගී මාර්ගයේ පින්නදූව නායයෑම

නායයෑම් අවම කිරීමේ වැඩසටහන (ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපාදන)

ජා. ගො. ප. සංවිධානය විසින් රජයේ ප්‍රතිපාදන උපයෝගී කරගනිමින් ප්‍රමුඛතා පදනමක් යටතේ අස්ථායී බෑවුම් සහ හඳුනාගත් නාය යාහැකි ස්ථාන ව්‍යුහාත්මක ක්‍රමවේද භාවිත කරමින් නායයෑම් අවම කිරීම් සිදු කරනු ලබයි. 2023 වර්ෂයේ දී නුවරඑළිය දිස්ත්‍රික්කයේ මලපට්ටාව ප්‍රදේශයේ අස්ථායී බෑවුම් කොටසක ස්ථායීකරණය කිරීම රු. මිලියන 72.17ක් වැය කරමින් නිම කර ඇත. මීට අමතර ව මෙම වසරේ දී කොටහැර කන්ද නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය රු. මිලියන 41.6ක් යොදාගනිමින් නිම කරන ලදී. මේ වන විට බොල්තුඹේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය සහ නුවරඑළිය සහිරා විද්‍යාලයේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති පිළිවෙලින් රු. මිලියන 46.3ක් හා රු. මිලියන 28.9ක් යොදා ගනිමින් ක්‍රියාත්මක වෙමින් පවතී.



මලපට්ටාව නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

නායයෑම් අවදානම් ප්‍රදේශ සඳහා අවදානම් පැතිකඩ නිර්මාණය කිරීම

ප්‍රාදේශීය, කළාපීය සහ ජාතික මට්ටමේ තීරණ සම්පාදකයින් වෙත ආපදා අවදානම් අවම කිරීම සහ සංවර්ධන සැලසුම්කරණය සඳහා මඟපෙන්වීම පිණිස නායයෑම් අවදානම් පැතිකඩ සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය 2016 වසරේ දී ආරම්භ කරන ලදී. ආපදා අවදානම තක්සේරු කිරීම සහ කෙටි, මධ්‍යම කාලීන සහ දිගු කාලීන ආපදා අවදානම් අවම කිරීමේ තීරණ සැකසීමේ දී ජාතික හා උපජාතික මට්ටමේ ආයතනවල ධාරිතාවන් ඉහළ නැංවීම සඳහා නායයෑම් අවදානම් සහිත දිස්ත්‍රික්ක ආවරණය කරමින් අවදානම් පැතිකඩ සකස් කර ඇත.

නායයෑම් අවදානම් තොරතුරු ද්වාරය (Landslide Risk Information Portal), නායයෑමේ අවදානමට අදාළ දත්ත කාර්යක්ෂම ව සහ කඩිනමින් ලබා ගැනීම සඳහා පහසුකම් සැලසීම පිණිස නිර්මාණය කර ඇති මාර්ග ගත (Online) පද්ධතියකි. මේ වන විට අවදානම් ස්ථාන/ගොඩනැගිලි දත්ත 84,000ක් මෙම පද්ධතිය වෙත ඇතුළත් කර ඇත. අවදානම් ස්ථාන/ගොඩනැගිලි යනු යම් ප්‍රදේශයක උපද්‍රවවලට නිරාවරණය වන ජනගහණය, දේපළ, ආර්ථික ක්‍රියාකාරකම් හෝ වෙනත් අර්ථ දක්වා ඇති අංගයන් වේ. අවදානම් දත්ත විශ්ලේෂණයේ පරමාර්ථය වන්නේ නායයෑම් අවදානමකට ලක් විය හැකි වැසියන්, දේපළ සහ ගොඩනැගිලි භාවිතය යනාදියෙහි ලක්ෂණයන් තක්සේරු කිරීම යි. තව ද, ඉහත පද්ධතිය මඟින් 1:50,000 සහ 1:10,000 නායයෑම් උපද්‍රව සිතියම්, නායයෑම් විමර්ශන (LI) ස්ථාන, නායයෑම් අවම කිරීමේ ස්ථාන, ගොඩනැගිලි, නායයෑම් ගලා යන ප්‍රදේශ, හඳුනාගත් අවදානම් ස්ථාන සඳහා විසඳුම් සහ වැඩිදුර විශ්ලේෂණය යනාදිය වෙත ප්‍රවේශය සලසයි. https(//lrip.nbro.gov.lk/) සබැඳිය ඔස්සේ මෙම පද්ධතිය වෙත පිවිසිය හැකි වේ. මීට අමතර ව, පහත සඳහන් ක්‍රියාකාරකම් 2023 වසරේ දී ක්‍රියාවට නංවා ඇත.

- ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 29ක් සඳහා ප්‍රා. ලේ. කො. මට්ටමේ ලෙජර සකස් කිරීම
- පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ තීරණ ගන්නන් සඳහා නායයෑම් අවදානම් තොරතුරු බෙදා හැරීමේ වැඩමුළුව පැවැත්වීම - 9යි. (කෑගල්ල, රත්නපුර, මාතලේ සහ ගාල්ල දිස්ත්‍රික්ක)
- නායයෑම් අවදානම් තොරතුරු ද්වාරය (LRIP) වැඩි දියුණු කිරීම
- LHMP සිතියම් 26ක් සඳහා නායයෑම් ගලා යන මාර්ග (කහ කලාපය සහ රතු කලාපය) සමාකරණය
- අවදානම් පොකුරු සහ අවදානම් අවම කිරීමේ පියවර හඳුනාගැනීම - ප්‍රා. ලේ. කො. 10 සඳහා

තත්‍යකාලීන නායයෑම් පුරෝකථනය සහ පූර්ව අනතුරු ඇඟවීමේ ධාරිතාව වැඩි දියුණු කිරීම (පද්ධතිය නඩත්තු කිරීම)

අධික තීව්‍රතාවයකින් යුත් වර්ෂාපතනයත් සමඟ පාංශු තෙතමනය වැඩිවීමත් සමඟ නායයෑම් බහුලව සිදුවන බැවින්, ජා. ගෙ. ප. සංවිධානය විසින් නායයෑම් අවදානම් ප්‍රදේශවල වර්ෂාපතනයන් නිරීක්ෂණය කිරීම සඳහා ස්වයංක්‍රීය වර්ෂාමාපකයන් 330කින් යුත් ජාලයක් පවත්වාගෙන යනු ලබයි. ජා. ගෙ. ප. සංවිධානයෙහි පූර්ව අනතුරු ඇඟවීම් මධ්‍යස්ථානයේ විද්‍යාඥයින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන කාලගුණ අනාවැකි සහ ස්වයංක්‍රීය වර්ෂාමාපකයන් විසින් ලබා ගන්නා දත්තයන් විශ්ලේෂණය කිරීම මඟින් ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ හදිසි මෙහෙයුම් මධ්‍යස්ථානය සමඟ එක් ව පූර්ව අනතුරු ඇඟවීම් නිකුත් කිරීම සිදු කරනු ලබයි. මීට අමතර ව ජා. ගෙ. ප. සංවිධානය විසින් භූමි චලනයන් හඳුනාගැනීමේ උපකරණයන් සහ තෙතමන සංවේදන උපකරණ සමඟ නායයෑම් නිරීක්ෂණය කිරීමේ ධාරිතාවය වර්ධනය කර ඇත. 2023 වර්ෂයේ දී පූර්ව අනතුරු ඇඟවීම් 198ක් සිදු කර ඇති අතර, ස්වයංක්‍රීය වර්ෂාමාපක පද්ධතියේ අලුත්වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා රු. මි. 10.0 ක ප්‍රතිපාදන භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත.

ගොඩනැගිලි තක්සේරුකරණය සහ තත්ත්ව වාර්තාකිරීමේ ව්‍යාපෘතිය (BACR)

ගොඩනැගිලි තක්සේරුකරණ සහ තත්ත්ව වාර්තාකරණ සේවා සැපයීමේ දී ජා. ගෙ. ප. සංවිධානය විසින් තීරණාත්මක කාර්යභාරයක් ඉටු කරනු ලබයි. ස්වයං අරමුදල් සහිත ආයතනයක් වශයෙන් ජා. ගෙ. ප. සංවිධානය වෙත රාජ්‍ය හා පෞද්ගලික යන දෙඅංශයෙන් ම මෙම කාර්යන් සඳහා ඉල්ලීම් ලැබෙන අතර ඒ අනුව ගාස්තු අය කිරීම් සිදු කෙරේ. කෙසේ වෙතත් මෙම ගාස්තු ගෙවා ගැනීමේ අපොහොසත් හිමිකාරීත්වයන් සහිත අවස්ථාවන් හි දී අනතුරුදායක විය හැකි ව්‍යුහයන් තුළ තවදුරටත් පදිංචි ව සිටීමෙන් ඔවුන්ගේ මෙන් ම යාබද ප්‍රජාවන්ගේ ද ආරක්ෂාව අවදානම් සහගත වනු ඇත.

ගොඩනැගිලිවල ව්‍යුහාත්මක ඔරොත්තු දීමේ අවශ්‍යතාවය හඳුනා ගනිමින් විශේෂයෙන් පාසල්, රෝහල් සහ අනෙකුත් මහජනතාව රැස්වන ගොඩනැගිලි ඉලක්ක කර ගනිමින් තක්සේරු කිරීම් සඳහා රු. මි. 25.0ක් රජය විසින් ජා. ගෙ. ප. සංවිධානය වෙත වෙන් කර ඇත. ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා නිර්ණායක සැලසුම් කර ඇත්තේ රජයේ අංශ තුළ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා වන අතර, ඒ සඳහා ගොඩනැගිල්ලෙහි ආයු කාලයෙන් ඔබ්බට පරිහරණය කිරීම, දීර්ඝ කල් පිරීම් සහිත ව අබලන් වීම, ව්‍යුහාත්මක අඛණ්ඩතාව නොමැති වීම, ආපදා හෝ හානි සිදු වී තිබීම, දුර්වල නඩත්තුකරණය හෝ ආසන්න ඉදිකිරීම් කටයුතු මඟින් සිදු වන අහිතකර බලපෑම් යනාදිය අයත් වේ.



වැලිගම දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල



ගම්පහ පාසල් ගොඩනැගිල්ල

දැනට පවතින ගොඩනැගිලි පිළිබඳ විස්තරාත්මක අධ්‍යයනයන් හරහා ජා. ගො. ප. සංවිධානය විසින් අදාළ ගොඩනැගිල්ල කඩා ඉවත් කළ යුතු ද, නැතහොත් ප්‍රතිසංස්කරණය කළ යුතු ද යන්න සහ අනාගත භාවිතය සඳහා ව්‍යුහයන් ප්‍රතිස්ථාපනය කරන්නේ කෙසේ ද? යන්න පිළිබඳ උපදෙස් සැපයීම සිදු කරයි. ජා. ගො. ප. සංවිධානය විසින් 400කට අධික රජයේ විවිධ ගොඩනැගිලිවල ව්‍යුහාත්මක තත්ත්වයන් අගයමින් තක්සේරු වාර්තා නිකුත් කිරීම මෙම ව්‍යාපෘතියේ කැපී පෙනෙන ප්‍රතිඵලයක් වේ. 2023 වසරේ දී පමණක් ගොඩනැගිලි තක්සේරු කිරීම් සහ තත්ත්ව වාර්තාකරණ ව්‍යාපෘතිය යටතේ (BACR) වාර්තා 48ක් නිකුත් කර ඇත.

පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන්

ජා. ගො. ප. සංවිධානයෙහි පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන (R & D) 2013 දී ආරම්භ කරන ලද අතර මහාභාණ්ඩාගාරයෙන් ලැබෙන පර්යේෂණ ප්‍රදානයන් යොදා ගනිමින් අඛණ්ඩ ව ක්‍රියාත්මක වේ. පර්යේෂණ හා සංවර්ධන වැඩසටහන සිදු කිරීම සඳහා රජයේ වර්ෂික ප්‍රතිපාදන වශයෙන් රු. මිලියන 5.3ක් වෙන් කර ඇත. 'ආරක්ෂිත ගොඩනගා ඇති පරිසරයක් නිර්මාණය කිරීම' කෙරෙහි අවධානය යොමු කරමින් පර්යේෂණ සහ සංවර්ධන ව්‍යාපෘති සඳහා අරමුදල් ඵලදායී ලෙස භාවිතා කර ඇත. ජා. ගො. ප. සංවිධානය විසින් ක්‍රියාත්මක කරනු ලබන පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් බොහෝවිට කර්මාන්ත ක්ෂේත්‍රය සමඟ සාකච්ඡා කිරීම තුළින් හඳුනාගැනීම සිදු කෙරේ. ජා. ගො. ප. සංවිධානය විසින් කර්මාන්ත පර්යේෂණ අවශ්‍යතා අධ්‍යයනය සඳහා එහි පාර්ශවකරුවන් සමඟ වසර ආරම්භයේ දී වාර්ෂික උපදේශන රැස්වීම් පැවැත්වීම සිදු කරනු ලබයි. වෙන් කරන ලද අරමුදල් 2022 වසරේ සිට අඛණ්ඩ ව සිදු කරන ලද පර්යේෂණ සඳහා මෙන් ම, 2023 වසරේ දී ආරම්භ කරන ලද නව පර්යේෂණ සඳහා භාවිතා කරන ලදී. ඒ අනුව, 2023 වසර තුළ පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහනෙහි පර්යේෂණයන් 13ක් සිදු කර ඇත. ජා. ගො. ප. සංවිධානයෙහි පර්යේෂණ කමිටුව මඟින් විද්‍යාඥයින්හට ඔවුන්ගේ පර්යේෂණ සිදු කිරීම සඳහා අවශ්‍ය මඟපෙන්වීම නිරන්තරයෙන් සිදු කොට ඇති අතර ව්‍යාපෘති සඳහා අවශ්‍ය පහසුකම් ජා. ගො. ප. සංවිධානය විසින් සපයා ඇත. පහත වගුව තුළින් 2023 වසරේ පර්යේෂණ සහ සංවර්ධනය ව්‍යාපෘති පිළිබඳ තොරතුරු ඉදිරිපත් කර ඇත.

වගුව : 2023 වසරේ පර්යේෂණ හා සංවර්ධන වැඩසහටනෙහි පර්යේෂණ ශීර්ෂයන්

Division	Research Title	Principal Researcher
LRRMD	Strengthening the prediction power of landslide hazard zonation maps by incorporating zone-based rainfall thresholds through infiltration modeling.	Mr. Milinda Amarasinghe
	Calibration and evaluation of the available NGI Ground Penetrating Radar (SF-GPR) system using model tests for absolute utility detection	Mr. N K R Senevirathne
SE & PMD	Development of manual/guidelines for repair and retrofitting of damaged/deteriorated/unstable buildings	Ms. Ajantha Basnayake, Ms Sathya Bandaranayake
	Experimental study on Fly Ash-Based Alkali-Activated Geopolymer concrete blocks	Ms. H S N Perera
	The implications of adopting Eurocodes for designing disaster-resilient buildings in Sri Lanka.	Ms. H A Pathirana
ESSD	Investigate the acoustic properties of internal wall plaster with recycled material as a fine aggregate replacement for screening indoor noises in multistory buildings.	Mr. Kasthuri Chandrasena
	Tree Risk Assessment for identification of hazardous trees for issuing Early Warning to prevent casualties and damages to properties due to tree failures within the Colombo Municipal Council area	Mr. VDW Sumanaseka
	Development of a high-precision acid rainwater collector & detector as a secondary confirmation strategy of ambient air quality	Mr. Ruwan Ruhunuge
HSPTD	Self-assessment tool for assessing Disaster Resilience of low–rise buildings/Houses in Sri Lanka.	Mr. Anuruddha Vijekumara
GETD	Cyclic shear resistance of typical Sri Lanka soil	Ms. Amali Palliyaguruge
BMRTD	The contribution of the NBRO to Sri Lankan ancient stupa	Mr. Akila Sandaruwan
	Exploring a suitable solution to recycle/dispose of shredded currency notes particles/briquettes (currency waste)	Mr. Chirath Weerasena
	Introducing local ISO Standard sand for cement testing	Mr. Heshan Ellegama

වාර්ෂික පර්යේෂණ ප්‍රතිඵලයන් ජා. ගො. ප. සංවිධානයේ වාර්ෂික පර්යේෂණ සමුළුවේ දී ඉදිරිපත් කර ප්‍රකාශයට පත් කරනු ඇත.

සමුළුව

BUILDING RESILIENCE
40 Years in Retrospect

13TH ANNUAL RESEARCH SYMPOSIUM 2023

29th February 2024 | Colombo, Sri Lanka

ජා. ගො. ප. සංවිධානයෙහි 13වැනි වාර්ෂික පර්යේෂණ සමුළුව 2024 පෙබරවාරි 29වැනි දින කොළඹ දී පැවැත්වීමට නියමිත ව ඇත. 1984 දී ජා. ගො. ප. සංවිධානයෙහි මෙහෙයුම් ආරම්භයේ සිට 40වැනි වර්ෂ පූර්ණ සංවත්සරයට සමගාමී ව මෙවර මෙම උත්සවය සංවිධානය කර ඇත. ගොඩනගන ලද පරිසරය තුළ ඔරොත්තු දීමේ හැකියාව වර්ධනය කිරීමේ ක්‍රියාවලිය තුළ ජා. ගො. ප. සංවිධානයෙහි මෙහෙවර ඉලක්ක කරගනිමින් 'ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම: 40 වසරක අතීතාවර්ජනය' යන පුළුල් තේමාව යටතේ මෙවර සම්මන්ත්‍රණය පැවැත්වීමට සැලසුම් කොට ඇත.

මෙම සමුළුව රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනය, විශ්වවිද්‍යාල, වෘත්තීය ආයතන, ජාත්‍යන්තර හා කලාපීය හවුල්කාර ආයතනවල මෙන් ම ඒ හා සමාන විෂය ක්ෂේත්‍රයන් හි කීර්තිමත් ප්‍රවීනයන්ගේ සහභාගීත්වයෙන්, සහයෝගීතා වේදිකාවක් වශයෙන් සැලසුම් කර ඇත.

ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී වන තාක්ෂණ රාජ්‍ය අමාත්‍ය ගරු කනක හේරත් මැතිතුමාගේ ආරාධිත දේශනයෙන් අනතුරු ව; 'දේශගුණික විපර්යාස සඳහා අනුවර්තනය වීමේ උපායමාර්ගයක් ලෙස ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම' යන මැයෙන් ජයිකා-ශ්‍රීලංකා ප්‍රධාන නියෝජිතයාගේ ප්‍රධාන දේශනයක් සමඟ සමුළුවේ සමාරම්භය සනිටුවන් කිරීමට සැලසුම් කර ඇත. තව ද, විශේෂ හඳුන්වා දීමේ සැසියක් පැවැත්වීමට ද සැලසුම් කර ඇත.

'ගොඩනගන ලද පරිසරයෙහි ඔරොත්තු දීමේ හැකියාව: උපායමාර්ගික මැදිහත්වීම්' යන තේමාව යටතේ විද්වත් සාකච්ඡාවක්, විශේෂඥයින්ගේ සහභාගීත්වයෙන් පැවැත්වීම සඳහා සැලසුම් සකස්කොට ඇත.

මෙම සමුළුව තුළින් 2023 වර්ෂයේ දී ජා. ගො. ප. සංවිධානය විසින් සිදු කරන ලද පර්යේෂණ අධ්‍යයනයන් හි ප්‍රතිඵල එළිදැක්වෙන සාරාංශයන් 30කට අධික සංඛ්‍යාවක් අන්තර්ගත නාමික සැසිවාර හතරක් ඔස්සේ අධ්‍යයනයන් 25ක් පමණ ඉදිරිපත් කිරීමට නියමිත ව ඇත. ඒවා නම්;

- පළමු තාක්ෂණික සැසිය : නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා තාක්ෂණික දියුණු කිරීම්
- දෙවන තාක්ෂණික සැසිය : ඔරොත්තු දීමේ ගොඩනැගිලි සඳහා නවෝත්පාදන
- තෙවන තාක්ෂණික සැසිය :ඔරොත්තු දිය හැකි ජනාවාස වෙනුවෙන් ප්‍රජාවන් සවිබල ගැන්වීම
- හතරවන තාක්ෂණික සැසිය : සෞඛ්‍ය සම්බන්ධ ජීවන රටාවක් උදෙසා තිරසාර පරිසරය

මෙම සමුළුව තුළින් හවුල්කාරී ආයතන සමඟ සහයෝගීත්වය ශක්තිමත් කිරීම මෙන් ම ජා. ගො. ප. සංවිධානයෙහි ධාරිතාවන් තවදුරටත් වැඩිදියුණු කර ගැනීම උදෙසා පහසුකම් සැලසෙනු ඇත.

ප්‍රධාන උපදේශක ව්‍යාපෘතීන්

යාබද ගොඩනගන ලද පරිසරය වෙත අත්විය හැකි අහිතකර බලපෑම් තක්සේරු කිරීම සඳහා භූතාක්ෂණික නිශ්කාෂණය නිකුත් කිරීම

ජා. ගො. ප. සංවිධානය විසින් ඉදිකිරීම් සඳහා පයිලින් (piling) හෝ ගැඹුරු කැනීම් ඇතුළු යෝජිත සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා භූ තාක්ෂණික නිශ්කාෂණ නිකුත් කිරීම සිදු කරනු ලබයි. මෙම භූ තාක්ෂණ නිශ්කාෂණයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ යම් යෝජිත සංවර්ධනයක; විශේෂයෙන් ම ගොඩනැගිල්ලෙහි උප ව්‍යුහය ගොඩනැගීමේ දී යාබද දේපලවලට සහ අවට ඉදිකරන ලද පරිසරයට ඇති බලපෑම තක්සේරු කිරීම යි.

මෙහි ඇති අවශ්‍යතාවය නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) සැලසුම් සහ සංවර්ධන රෙගුලාසි 2021; 57 (3) (ඇ) වගන්තිය මඟින් පනවනු ලැබ ඇති 2021 ජූලි 08 දින ප්‍රකාශයට පත් කරන ලද අංක 2235/54 දරණ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර බලාත්මක කර ඇත. තව ද, නිශ්කාෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානය, සංචාරක සංවර්ධන අධිකාරිය (SLTDA) සහ නාගරික සංවර්ධන අධිකාරියේ (UDA) ‘one stop ඒකකය’ (OSU) සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ ඇත.

ඒ අනුව, ජා. ගො. ප. සංවිධානය විසින් 2023 වසර සඳහා භූ තාක්ෂණික නිශ්කාෂණයන් සහ නිශ්කාෂණ අළුත් කිරීම් 15ක් නිකුත් කර ඇති අතර සේවාව සැපයීම සඳහා රු. මිලියන 3.7ක් ලබා ඇත. 2017 සිට 2023 දක්වා කාලය තුළ සිදු කරන ලද නිශ්කාෂණයන් සහ අලුත් කිරීම් පිළිබඳ තොරතුරු පහත වගුව තුළින් පෙන්නුම් කර ඇත.

වර්ෂය	2017	2018	2019	2020	2021	2022	2023
නිශ්කාෂණ සහ නිශ්කාෂණ අළුත් කිරීම් ගණන	32	38	20	09	35	21	15

වගුව: 2017 සිට 2023 දක්වා නිකුත් කරන ලද නිශ්කාෂණයන් සහ අළුත් කිරීම්

මහනුවර ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) අස්ථායී බෑවුම් සහ හානියට පත් ශ්‍රවණාගාර ගොඩනැගිල්ල ස්ථායී කිරීම

ජාතික මූලික අධ්‍යයන ආයතනයේ (NIFS) ලේකම්වරයාගේ ඉල්ලීමකට ප්‍රතිචාර වශයෙන්, භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත ජා. ගො. ප. සංවිධානය විසින් මහනුවර හන්තාන පාරේ පිහිටි ජා. මූ. අ. ආ. (NIFS) මූලස්ථානයේ ප්‍රධාන ගැටලු දෙකක් සඳහා විසඳුම් සැපයීම සිදු කරන ලදී.

භූ තාක්ෂණික විමර්ශනය සහ සැලසුම්:

ජා. ගො. ප. සංවිධානය විසින් අභ්‍යන්තර පාංශු තත්ත්වය එවැනි පාංශු ගුණාංගයන් තක්සේරු කිරීම සඳහා පුළුල් භූ තාක්ෂණික විමර්ශනයක් සිදු කරන ලදී. මීට අමතර ව, ප්‍රශ්න ගත ප්‍රදේශයෙහි භූ විද්‍යාත්මක ලක්ෂණ විශ්ලේෂණය කිරීම සඳහා භූ විද්‍යාත්මක සමීක්ෂණයක් සිදු කරන ලදී. ක්ෂේත්‍ර

චාරිකා, භූ තාක්ෂණික විමර්ශන, භූ විද්‍යාත්මක සිතියම්ගත කිරීම් සහ ආශ්‍රිත විශ්ලේෂණයන් තුළින් රැස්කර ගන්නා ලද දත්තයන් උපයෝගී කර ගනිමින් ජා. ගෙ. ප. සංවිධානය විසින් ජා. මූ. අ. ආ (NIFS) පරිශ්‍රයට යාබද ව ඇති අස්ථායී බෑවුම ස්ථාවර කිරීම සඳහා උචිත අවම කිරීමේ ක්‍රියාමාර්ග ඇතුළත් විස්තරාත්මක සැලැස්මක් සකස් කරන ලදී.

අවම කිරීමේ පියවරයන්:

ශ්‍රවණාගාරයේ ගොඩනැගිල්ලට යටින් ඇති අස්ථායී බෑවුම ස්ථායීකරණය සඳහා යෝජිත අවම කිරීමේ ක්‍රියාමාර්ගයන්, Soil Nailing, රැඳවුම් බැම් ඉදිකිරීම, බෑවුම් හැඩය සැකසීම මෙන් ම, පෘෂ්ඨීය සහ අභ්‍යන්තර යන දෙයාකාරය ම ඇතුළත් ජලාපවාහනය වැඩි දියුණු කිරීම යන පියවරයන්ගෙන් සමන්විත වේ. බෑවුමෙහි දිගු කාලීන ස්ථාවරත්වය සහතික කිරීම පිණිස මෙම අවම කිරීමේ පියවරයන් ක්‍රියාවට නංවා අවසන් කර ඇත.

බෑවුම් ස්ථායීකරණ කටයුතු සාර්ථක ව නිම කිරීම

ව්‍යාපෘතියෙහි වැදගත් සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් බෑවුම් ස්ථායීකරණ කටයුතු සාර්ථක ව ක්‍රියාවට නංවා ඇත. ඉදිකිරීම් කොන්ත්‍රාත් මුදල බදු හැර දළ වශයෙන් ශ්‍රී ලංකා රු. මිලියන 137.0ක් වූ අතර නිශ්චිත කාලසීමාවන් තුළ උසස් තත්ත්වයේ ප්‍රතිඵල ලබා දීමෙහි ලා, ජා. ගෙ. ප. සංවිධානයෙහි කාර්යක්ෂමතාව මෙන් ම කැපවීම පෙන්නුම් කරමින් මාස 8ක කාලයක් තුළ නිම කිරීමට සමත් ව ඇත.

හානියට පත් ශ්‍රවණාගාර ගොඩනැගිල්ලේ නිවැරදි කිරීම්

හානියට පත් ශ්‍රවණාගාර ගොඩනැගිල්ලේ ව්‍යුහාත්මක ගැටලු විසඳීම සඳහා අවශ්‍ය පරිදි බාල්ක, කුලුනු සහ ස්ලැබ් වැනි ව්‍යුහාත්මක ඒකකයන් ශක්තිමත් කිරීම ඉලක්ක කර ගත් ප්‍රතිනිර්මාණ ශිල්පීය ක්‍රමයන් ජා. ගෙ. ප. සංවිධානය විසින් යෝජනා කර ඇත. ශ්‍රවණාගාර ගොඩනැගිල්ලේ නැවත සකස් කිරීමේ ටෙන්ඩර් කටයුතු සඳහා මඟ සලසමින් ව්‍යුහාත්මක නිර්දේශයන් අවසන් කිරීම මේ වන විට සිදුවෙමින් පවතී.



ජා. මූ. අ. ආ. (NIFS) ඉරිතැලීම් සහිත බිත්ති





බෑවුම් ස්ථායීකරණ කටයුතු

උපදේශන අධීක්ෂණය අදියර 01 - ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘතිය (RLVMMP)

ජා. ගො. ප. සංවිධානයෙහි සෘජු අධීක්ෂණය යටතේ ව්‍යාපෘතියෙහි පළමු අදියර 2023 වසරේ දී සාර්ථක ව නිම කරන ලදී. පළමු අදියර නායයෑම් ස්ථාන 24කින් සමන්විත වූ අතර සියලුම ස්ථාන 100% ක භෞතික ප්‍රගතියක් අත් කර ගෙන ඇත. කෙසේ වෙතත්, ඇතැම් පැකේජයන් සම්පූර්ණ කරමින් අවසාන අදියරේ පවතී. සම්පූර්ණ කිරීමේ වාර්තා වැනි අවසාන ලේඛන සකස් කරමින් පවතී. තව ද, සියලුම ස්ථාන (site) විධිමත් ලෙස සේවා යෝජක ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත භාර දී ඇත.

වගුව: පළමු අදිය පිළිබඳ දළ විශ්ලේෂණය

පැකේජය	අඩවි සංඛ්‍යාව	නිමකිරීම් පිරිවැය (රු. මි.)	තත්ත්වය
01R	04	420.41	සිවිල් වැඩ 100% නිමකර ඇත. දෝශයන් සඳහා වගකීම් කාලය ක්‍රියාත්මක වේ. සම්පත් දායකයන් වෙත අඩවි භාර දී ඇත.
02R	07	553.62	
03R	02	306.63	
04A	06	433.74	සිවිල් වැඩ 100%ක් අවසන් කර ඇත. දෝශයන් සඳහා වගකීම් කාලය ක්‍රියාත්මක වේ.
04B	04	290.77	
04C	01	430.53	



කළවාන නායයෑම් අවම කිරීමේ ස්ථානය

මුතුරාජවෙල සේදුම් යන්ත්‍රයන් මඟින් නිකුත් කෙරෙන අක්වෙරළ වැලිවල තත්ත්වය පරීක්ෂාව

මුතුරාජවෙල සේදුම් යන්ත්‍රයන් මඟින් නිකුත් කෙරෙන අක්වෙරළ වැලිවල තත්ත්වය පරීක්ෂාව 2020 වසරේ සිට ජා. ගොා. ප. සංවිධානය, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධන සංස්ථාව (SLLDC) සමඟ සහයෝගීතාවයෙන් දේශීය ඉදිකිරීම් කර්මාන්තය සඳහා සපයනු ලබන සෝදන ලද අක්වෙරළ වැලිවල ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා තෙවන පාර්ශවීය පර්යේෂණ සැපයුම්කරුවෙකු ලෙස කටයුතු කරමින් සිටී.

විශේෂිත රසායනාගාර පහසුකම්වලින් සමන්විත ජා. ගොා. ප. සංවිධානය විසින් ශ්‍රී ලාංකීය ප්‍රමිතීන් (SLS) සහ බ්‍රිතාන්‍ය ප්‍රමිතීන්ට (BS) අනුව, සියලු සමස්ථ පරීක්ෂණයන් සිදු කරනු ලබයි. ශ්‍රී ලාංකීය ප්‍රමිතීන් (SLS) 1397 හි දක්වා ඇති මාර්ගෝපදේශයන්ට අනුගත වෙමින් ජා. ගොා. ප. සංවිධානයෙහි නිලධාරීන් විසින් සම්මත අවශ්‍යතාවන් කෙරෙහි අනුකූලතාව තහවුරු කරගැනීම පිණිස සතිපතා සහ මාසික කාලසීමාවන් තුළ දී නියැදීන් මෙන් ම පරීක්ෂණයන් ක්‍රියාත්මක කරනු ලබයි.



ගොඩගසා ඇති වැලි අතරින් නියැදි ලබා ගැනීම

නව කැළණි පාලම ව්‍යාපෘතියෙහි වැරගන්වන ලද කොන්ක්‍රීට් ව්‍යුහයන් හි තත්ත්වය පරීක්ෂා කිරීම

නව කැළණි පාලම ව්‍යාපෘතියේ මැද පෙට්ටි ගර්ඩරයන්හි ප්‍රාචීර බිත්තිවල (diaphragm walls of the centre box girder) සිරස් ඉරිතැලීම් මතු වීම සම්බන්ධ ව ප්‍රතිචාර ලෙස මාර්ග සංවර්ධන අධිකාරිය සහ ව්‍යාපෘති කොන්ත්‍රාත්කරු විසින් ගැඹුරු සහ පළල් සාධක කෙරෙහි අවධානය යොමු කරමින් ඉරිතැලීම් පැතිකඩ තහවුරු කරගැනීමේ අවශ්‍යතාව ප්‍රකාශ කර ඇත. පාලම් ව්‍යුහයේ සේවා සැපයීම් හැකියාව සහ ආරක්ෂාව තක්සේරු කිරීම සඳහා මෙම පරාමිතීන් ඉතා වැදගත් වේ.

කාලෝචිත හා නිවැරදි විමර්ශනවල වැදගත්කම හඳුනා ගනිමින්, සිවිල් යටිතල පහසුකම් විමර්ශනයන් හි කීර්තිමත් පුරෝගාමීන් වශයෙන් ජා. ගොා. ප. සංවිධානයේ ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂා කිරීමේ අංශය (BMRTD) විසින් ඉරිතැලීම් විමර්ශනයන් කඩිනමින් සිදු කරන ලදී. නිසි පර්යේෂණ සහ විශ්ලේෂණයන් තුළින් ජා. ගොා. ප. සංවිධානයෙහි ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂා කිරීමේ අංශය (BMRTD) විසින් නිරීක්ෂණය කරන ලද විශේෂිත තත්ත්වයට අනුකූල ව උචිත අලුත්වැඩියා කිරීමේ උපායමාර්ගයන් සකසා ගැනීමට ඉඩ සලසමින් ඉරිතැලීම්වල තත්ත්වය තීරණය කරන ලදී.



ප්‍රාචීර බිත්තියෙහි හානිකර නොවන පරීක්ෂාව

ක්ෂේත්‍ර විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලසුම්

ජා. ගොා. ප. සංවිධානය විසින් දිවයිනේ පළාත් 6ක් තුළ දිස්ත්‍රික්ක 11ක අධි අවදානම් ප්‍රදේශයන් 127ක අස්ථායී බෑවුම් ස්ථායී කිරීම කටයුතු ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුවේ (AIIB) මූල්‍යාධාර මත ක්‍රියාත්මක ස්ථායීකරණ ව්‍යාපෘතිය වන RLVMMP යටතේ නායයෑම් අවදානම අවම කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන්නේ AIIB හි සහ ශ්‍රී ලංකාවේ පාරිසරික හා සමාජ ආරක්ෂණයන් මෙන් ම අභිමතයන්ට අනුකූල වන පරිදි ය. ව්‍යාපෘති ක්‍රියාවන් ක්‍රියාත්මක කිරීමේ දී AIIB ආරක්ෂණ සහ ජාතික පාරිසරික සහ සමාජ අභිමතයන් භාවිතය සඳහා මාර්ගෝපදේශ සැලසීම සඳහා AIIB පාරිසරික සහ සමාජ ආරක්ෂණ ප්‍රතිපත්තීන්ට අවශ්‍ය පරිදි පාරිසරික හා සමාජ කළමනාකරණ රාමුවක් (ESMF) සකස් කරන ලදී. ව්‍යාපෘතිය ක්‍රියාත්ම කිරීමේ නියෝජිතායතනය (ජා. ගොා. ප. සංවිධානය) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සෑම අදියරකදී ම ESMF යටතේ සකසන ලද පාරිසරික හා සමාජ කළමනාකරණ සැලසුම් ක්‍රියාත්ම කිරීම සහතික කිරීමට අපේක්ෂා කරන අතර එමඟින් පරිසරයට සහ ප්‍රජාවට ඇතිවන බලපෑම අවම වනු ඇත. ESMF හි නිර්දේශයට අනුව, පාරිසරික සහ සමාජීය සැකසුම මෙන් ම සෞඛ්‍ය හා ආරක්ෂිත තත්ත්වයන් වඩාත් ක්ෂේත්‍ර විශේෂිත වන බැවින්, සියලු ක්ෂේත්‍රයන් සඳහා ක්ෂේත්‍ර විශේෂිත පාරිසරික සහ සමාජ කළමනාකරණ සැලසුම් (SSE&SMP) සකසා ඇත. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ දී සලකා බැලිය යුතු සැලසුම්, නිර්මාණයන්, ඉදිකිරීම් සහ පාරිසරික මෙහෙයුම් අදියර, සමාජීය මෙන් ම සෞඛ්‍ය හා ආරක්ෂිත කළමනාකරණ පියවරයන් SSE&SMP මඟින් ලබා දේ. පරිසර අධ්‍යයන හා සේවා අංශය විසින් දිස්ත්‍රික්ක 11ක මාර්ගවලට ආසන්න ක්ෂේත්‍ර 46ක්, උඩරට දුම්රිය මාර්ගයට ආසන්න ක්ෂේත 11ත්, පාසල් ආශ්‍රිත ක්ෂේත්‍ර 18ත්, ආගමික ස්ථානයන්ට ආසන්න ක්ෂේත්‍ර 6ක් සහ රජයේ ගොඩනැගිලිවලට ආසන්න ක්ෂේත්‍ර 5ක් සඳහා SSE&SMP 86ක් සකස් කර ඇත. එම ක්ෂේත්‍ර අතරින් අඩවි 30ක් රත්නපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇත. සියලු SSE&SMP පත්‍රිකාවන් ව්‍යාපෘති වෙබ් අඩවිය වෙත උඩුගත කර ඇත.



ව්‍යාපෘති කණ්ඩායම විසින් සිදුකරන ක්ෂේත්‍ර චාරිකාව

ගොඩනැගිලිවල ව්‍යුහාත්මක විමර්ශන සහ හානි තක්සේරු කිරීම

ජා. ගොා. ප. සංවිධානයෙහි ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ හා ව්‍යාපෘති කළමනාකරණ අංශය (SER & PMD) විසින් පාසල්, විශ්වවිද්‍යාල, පුහුණු ආයතන, කර්මාන්තශාලා, රෝහල්, කාර්යාල ගොඩනැගිලි, සුපිරි වෙළෙඳසැල්, හෝටල්, නිවාස මෙන් ම තවත් බොහොමයක් ව්‍යුහයන්ගේ ඇගයුම් අවශ්‍යතා සපුරාලමින් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සේවාදායකයින් වෙත තම පුළුල් සේවාවන් ව්‍යාප්ත කර ඇත. ගොඩනැගිලිවල ව්‍යුහාත්මක අඛණ්ඩතාව සහ ආරක්ෂාව සහතික කිරීම කෙරෙහි අවධානය යොමු කරමින් SER&PMD විසින් එක් එක් ව්‍යාපෘතියේ අනන්‍ය අවශ්‍යතාවලට ගැලපෙන පරිදි පුළුල් පරාසයක උපදේශන සේවා සපයයි.

මෙම සේවාවන්ට සැලසුම් සමාලෝචනය, ක්ෂේත්‍ර විමර්ශනයන්, ගොඩනැගිලි තත්ත්ව තක්සේරුකරණය, ව්‍යුහාත්මක ස්ථායිතාව තක්සේරු කිරීම සහ අලුත්වැඩියා කිරීමේ/ප්‍රතිනිර්මාණය කිරීමේ කටයුතු ද ඇතුළත් වේ. SER&PMD විසින් පිරිවැය සැලසුම් සහ තීරණ ගැනීම් ක්‍රියාවලියේ දී ගනුදෙනුකරුවන්ගේ උපකාරය පිණිස පිරිවැය අස්තමේන්තු සේවාවන් ද සපයනු ලබයි. තව ද, නව ඉදිකිරීම් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී දැනට පවතින ගොඩනැගිලි සඳහා පූර්ව, අතරමැදි සහ පශ්චාත් ඉරිතැලීම් සමීක්ෂණයන් සිදු කරනු ලබන අතර, පූර්ණ තක්සේරුවක් සහ ව්‍යුහාත්මක ප්‍රමිතීන්ට අනුකූල වීම සහතික කරයි.

2023 වර්ෂයේ දී පමණක් ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණ අංශය විසින් විවිධ ගොඩනැගිලි සහ ව්‍යුහයන් පිළිබඳ විමර්ශනයන් සිදු කරන ලද අතර, පෞද්ගලික අංශයේ සිය සේවාදායකයින් වෙත වාර්තා 97ක් නිකුත් කර ඇත.

ව්‍යාපෘති කළමනාකරණ සහ උපදේශන සේවා

ජා. ගෙ. ප. සංවිධානය විවිධ ව්‍යාපෘති කළමනාකරණ උපදේශන සේවා, ගොඩනැගිලි ඉදිකිරීම්, අලුත්වැඩියා කටයුතු, නායයෑම් අවම කිරීම සහ අනෙකුත් විවිධාකාර සිවිල් ඉංජිනේරු ම ය කාර්යන් ඉටු කිරීම සඳහා කැපවී සිටී. ප්‍රමාණ බිල්පත් (BOQ) සහ ටෙන්ඩර් ලේඛන සැකසීම, රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලීන් හරහා කොන්ත්‍රාත්තු පරිපාලනය සහ සමස්ත ඉදිකිරීම් අධීක්ෂණය මෙම සේවාවන්ට ඇතුළත් වේ.

සුවිශේෂී කරුණක් ලෙස, පුළුල් පරාසයක අභියෝගවලට මුහුණදීමේ දී සිය විශේෂඥභාවය සහ තාක්ෂණික දක්ෂතාවය ප්‍රදර්ශනය කරමින් ජා. ගෙ. ප. සංවිධානය විසින් බාහිර පාර්ශවයන් වෙත ගොඩනැගිලි ව්‍යාපෘති ගණනාවක් සඳහා උපදේශන සේවා සපයා ඇත. උදාහරණ වශයෙන්, කොළොන්නාව නගර සභාවේ කාර්යාල ගොඩනැගිල්ලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු, ගම්පහ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල ආදිය අලුත්වැඩියා කටයුතු සහ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ පවතින ආපදා කළමනාකරණ අංශයෙහි වහල පුවරුවේ ජල කාන්දු වීම, විමර්ශනය, සැලසුම් කිරීම හා නිවැරදි කිරීමේ කටයුතු ගත හැක.

තව ද, ජා. ගෙ. ප. සංවිධානය විසින් කැළණිය විශ්වවිද්‍යාලයේ කණ්ඩි කඩා වැටීමේ ස්ථානයක් ස්ථාවර කිරීම සඳහා සැලසුම් කිරීම, ඉදිකිරීම් අධීක්ෂණය සහ කොන්ත්‍රාත්තු පරිපානය සඳහා උපදේශන සේවා සපයන ලදී. මෙම මුලපිරීම සිසුන්ගේ සහ ප්‍රදේශයේ වෙසෙන ජනතාවගේ ආරක්ෂාව තහවුරු කොට ඇත. රු. මිලියන 48.8ක් වටිනාකම සහිත ව්‍යාපෘතිය 2023 වසරේ දී සාර්ථක ව අවසන් කර ඇත.



කැළණිය විශ්වවිද්‍යාලයේ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය

පරීක්ෂණ සහ උපදේශන මගින් වූ ආදායම

නායයෑම් අධ්‍යයන හා සේවා, භූ තාක්ෂණික ඉංජිනේරු සේවා, ව්‍යාපෘති කළමනාකරණ සේවා, ගොඩනැගිලි ද්‍රව්‍ය, මානව ජනාවාස සැලසුම්කරණය සහ පාරිසරික කළමනාකරණය යන ක්ෂේත්‍රවල තාක්ෂණික පරීක්ෂණ සහ උපදේශන සේවා සැපයීම පහතින් සාරාංශ ගත කර ඇති පරිදි අඛණ්ඩ ව සිදු කර ඇත.

වගුව: පරීක්ෂණ සහ උපදේශන කටයුතුවලින් ලැබූ ආදායම

ක්‍රියාකාරකම/අංශය	උපදේශන කාර්යයන් සංඛ්‍යාව	පරීක්ෂණ/ විමර්ශන කාර්යයන් සංඛ්‍යාව	උත්පාදනය කරන ලද සමස්ත ආදායම (රු.මි.)
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	723	6908	82.80
භූ තාක්ෂණික ඉංජිනේරු හා පරීක්ෂණ අංශය	103	38	198.80
පාරිසරික අධ්‍යයන හා සේවා අංශය	590	590	63.33
ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ හා පරීක්ෂණ අංශය	3	1846	43.07
ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ හා ව්‍යාපෘති කළමනාකරණ අංශය	157	-	44.97
මානව ජනාවාස සැලසුම් හා පුහුණු කිරීමේ අංශය	27	-	16.33
උපදේශන කටයුතු RLVMMP ව්‍යාපෘති	-	-	25.64
වෙනත් ආදායම්	-	-	137.04
එකතුව			611.98

වෙනත් තාක්ෂණික මැදිහත්වීම්

ජා. ගෝ. ප. සංවිධානයෙහි GeoAi_Lab පර්යේෂණාගාරය, තිරසාර මෙන් ම ඔරොත්තු දෙන ගොඩනඟන ලද පරිසරයක් කෙරෙහි තුඩු දෙන භූගෝලීය නව්‍ය උත්පාදනයන් බිහි කරයි.

භූ ගෝලීය අවකාශයෙහි කැපී පෙනෙන දියුණුවක් සනිටුහන් කරමින් ජා. ගෝ. ප. සංවිධානයෙහි Geo-Ai විද්‍යාගාරයක් 2023 සැප්තැම්බර් මස 27 දී පිහටුවන ලදී. මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය තුළ ස්ථාපිත මෙම විද්‍යාගාරයෙහි ඉහළ නිපුනතාවයන්ගෙන් යුත් විශේෂඥයින්ගෙන් සමන්විත වේ. (such as Geospatial and Remote Sensing Analysts, Cartographers and Visualisation Experts, IT & Database Administrators and Software Developers / Programmers) භූ විද්‍යාව, භූ ගෝල විද්‍යාව, සංඛ්‍යාලේඛනය සහ නාගරික තොරතුරු විද්‍යාව පිළිබඳ විශේෂඥ දැනුමක් සහිත GeoAi_Lab අවකාශීය දත්ත එක්රැස් කිරීම, සැකසීම සහ විශ්ලේෂණ යන ක්ෂේත්‍රයන් හි දැඩි වෙනසක් සිදු කිරීමට සූදානම් ව සිටී. ඔරොත්තු දීමේ හැකියාව සහිත ජනාවාස නිර්මාණය කිරීම සඳහා අති නවීන විසඳුම් ලබා දෙමින් විවිධ සේවාවන් සැපයීම තුළින් GeoAi_Lab තම කැපවීම විහිදා දක්වයි.

- ඩ්‍රෝන සමීක්ෂණ, ඩ්‍රෝන පදනම් වූ භූ ගෝලීය දත්ත ලබා ගැනීම, සැකසීම සහ විශ්ලේෂණය
- දුරස්ථ සංවේදනය (Remote Sensing) - දුරස්ථ සංවේදන සහ චන්ද්‍රිකා ඡායාරූප විශ්ලේෂණය
- අවකාශීය දත්ත ගබඩා (Spatial Databases) - අවකාශීය දත්ත ගබඩා සහ ක්ෂේත්‍ර සමීක්ෂණ යෙදුම් Esri Platform මත සංවර්ධනය කිරීම
- අවකාශීය දත්ත දෘෂ්‍යකරණය (Spatial Data Visualization) - අවකාශීය දත්ත දෘශ්‍යකරණය සහ වාර්තා කිරීම
- පිරිසැලසුම් සහ භූමි අනු බෙදුම් සැකැස්ම වටා ඔරොත්තු දිය හැකි ජනාවාසකරණය සඳහා භූමි අනු බෙදීම් සැලසුම් කිරීම

GeoAi Lab
GEOSPATIAL & INTELLIGENCE LABORATORY

- පුහුණු කිරීම් - Geospatial Intelligence පිළිබඳ ධාරිතාව ගොඩනැගීම සහ පුහුණු කිරීම්

අලුතින් පිහිටුවන ලද මෙම පර්යේෂණාගාරය 2023 වසරේ දී විවධ උපදේශන සේවාවන් සඳහා ක්‍රියාකර ඇති අතර යාපනය වඩමාරච්චි හි සුළං බලාගාර ව්‍යාපෘතිය සඳහා ද පර්යේෂණාගාර උපදේශන සේවාවන් සපයන ලදී. වර්ග කි. මී. 33ක ව්‍යාපෘතියට අදාළ විස්තීරණ රූපමය දත්තයන් ඩ්‍රෝන තාක්ෂණික තුළින් ලබා ගැනීමට පර්යේෂණාගාරයට හැකියාව ලැබී ඇත. මෙම දත්තයන් සහ රූපයන් භූ විෂමතාවන්, වෘක්ෂලතාවන් සහ යටිතල පහසුකම්වලින් සමන්විත වේ. පර්යේෂණාගාරය විසින් කෑගල්ල නගර ගොඩනැගිලි මුහුණත පර්යේෂණ අධ්‍යයනය සඳහා උපදේශන සේවා සපයන ලද අතර, අධ්‍යයන සුවිශේෂී මට්ටම් විස්තර සහිත ත්‍රිමාණ ආකෘතියක්, වීඩියෝ දර්ශන සහ ඡායාරූප සැපයීමට පර්යේෂණාගාරයට හැකි විය. තව ද අධ්‍යයනයේ අරමුණ සඳහා අවශ්‍ය තොරතුරු රැස් කිරීම පිණිස නම් කරන ලද ප්‍රදේශය තුළ පුළුල් ගොඩනැගිලි සමීක්ෂණයක් සිදු කරන නායයෑම්වලට අදාළ වැදගත් තොරතුරු තීරණ

ගන්නන්හට ඉදිරිපත් කිරීමට ජා. ගෝ. ප. සංවිධානය සමත් ව ඇත. ලදී. තව ද, මෑතකාලීන ව නායයෑම් සිදු වූ රත්නපුර, බදුල්ල, ගාල්ල, මාතර සහ කෑගල්ල යන දිස්ත්‍රික්කවල ඩ්‍රෝන සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම ඩ්‍රෝන සමීක්ෂණය මඟින් අනාගත පරීක්ෂණයන් සඳහා පහසුකම් සැලසීම පිණිස නායයෑම්වලට අදාළ වැදගත් තොරතුරු තීරණ ගන්නන් හට ඉදිරිපත් කිරීමට ජා. ගෝ. ප. සංවිධානය සමත් ව ඇත.





GeoAi_Lab පර්යේෂණාගාරය විවෘත කිරීම

ජා. ගෝ. ප. සංවිධානය දීඝවාපි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියෙහි සම්බන්ධ වීම

ශ්‍රී ලංකා ආරක්ෂණ හමුදාවන් සහ විවිධ රාජ්‍ය ආයතනවල සහයෝගය ඇති ව පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලද දීඝවාපි ස්තූපයේ සංරක්ෂණ කටයුතු නැවත ආරම්භ කර ඇත. මෙම ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතියේ දී ඉදිකිරීම් ද්‍රව්‍යවල ගුණාත්මකභාවය සහ ඉරිතැලීම් අධීක්ෂණය සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ලබා දෙමින් ජා. ගෝ. ප. සංවිධානය විසින් ප්‍රධාන භූමිකාවක් සපයා ඇත.

තම දැනුම සහ පළපුරුද්ද තුළින් ජා. ගෝ. ප. සංවිධානය විසින් ඉදිකිරීම් ද්‍රව්‍යයන් හි තත්ත්වය ඇගැයීම සහ ඵලදායී ඉරිතැලීම් අධීක්ෂණ ක්‍රමවේදයන් ක්‍රියාත්මක කිරීම ඔස්සේ සංරක්ෂණ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා දායකත්වයක් ලබා දීම සිදු කරයි.

ගඩොල් නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය

ජා. ගෝ. ප. සංවිධානය විසින් සපයන ලද ක්‍රමානුකූල ක්‍රියාවලියක් මඟින් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා නිපදවන ලද විශේෂ මැටි ගඩොල් තෝරා ගනු ලැබේ. සියලුම ගඩොල් තොගයන් සම්මත ක්‍රමයට අනුව, පරීක්ෂා කරනු ලබන අතර ගඩොල් තොග යේ ගුණාත්මකභාවය සම්මත පිරිවිතරයන් සපුරාලන බවට සහතික කෙරේ. ගඩොල් නිෂ්පාදන ක්‍රියාවලියේ ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා ජා. ගෝ. ප. සංවිධානයේ නියෝජිතයින් විසින් ගඩොල් නිෂ්පාදනය ඉතා සමීපව නිරීක්ෂණ සිදු කරයි.

ඉරිතැලීම් අධීක්ෂණය

ජා. ගෝ. ප. සංවිධානයේ නිලධාරීන් විසින් 2022 වසරේ දෙසැම්බර් මාසයේ සිට දැනට ස්තූපයේ පවතින ඉරිතැලීම් දෙක නිරන්තර ව අධීක්ෂණය කර ඇත. විවිධ බර සහ පාරිසරික තත්ත්වයන්ට ප්‍රතිචාර වශයෙන් නිශ්චිත ස්ථානවල සිදුවන වෙනස්වීම් හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙම ක්‍රියාත්මක වෙමින් පවතින අධීක්ෂණය කාලයත් සමඟ ඉරිතැලීම්වල හැසිරීම් අවබෝධ කර ගැනීම සහ නඩත්තු කිරීම මෙන් ම සංරක්ෂණය සඳහා සුදුසු පියවරයන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ඉතා වැදගත් වේ.



දීඝවාපි ස්ථූපයෙහි වර්තමාන දර්ශන



මැටි ගඩොල් නිෂ්පාදනයේ තත්ත්ව පාලනය

අවට වායු තත්ත්ව අධීක්ෂණ ජාලය වැඩිදියුණු කිරීම සඳහා අතහැර දමා ඇති ජංගම වායු තත්ත්ව පර්යේෂණාගාරය අලුත්වැඩියා කිරීම සහ වැඩිදියුණු කිරීම

වාහන විමෝචන පරීක්ෂා කිරීමේ කාර්යාලය විසින් 2023 නොවැ. මස 27 දින භාර දෙන ලද අවට වායුගෝලීය වායු තත්ත්ව විමර්ශන ජංගම පර්යේෂණාගාරයක් (MAAQML) සහිත රථයක් 2014 දී අනතුරකට ලක් ව එතැන් සිට බත්තරමුල්ල මධ්‍යම පරිසර අධිකාරියෙහි (CEA) අතහැර දමා තිබී ඇත. මෙම MAAQML රථය 2013 දී ග්ලෝබල් සයන්ටිෆික් සිස්ටම් (පුද්) සමාගම වෙතින් වාහන විමෝචන පරීක්ෂා භාර අරමුදලෙහි මූල්‍යාධාර මත මිළදී ගෙන මෙහෙයුම් කටයුතු සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත භාර දී ඇත. MAAQML පද්ධතිය ජර්මනියේ 'Environment SA' ආයතනය විසින් නිෂ්පාදනය කර ඇති අතර මූල්‍ය ම ය දුෂ්කරතාවයක් හා අනතුර නිසා සිදුවූ හානිය පිළිසකර කිරීම සඳහා සැපයුම්කරු ප්‍රතිචාර නොදැක්වීම යන කරුණු හේතුවෙන් වසර හයක් පමණ කාලයක් ක්‍රියාත්මක නොවී පැවතී ඇත. 2023 නොවැ. මාසයේ දී MAAQML පද්ධතිය ජා. ගො. ප. සංවිධානය වෙත භාරදීමෙන් පසුව, අපගේ තාක්ෂණික කණ්ඩායම විසින් වායු සහ අංශු විශ්ලේෂකයන් අධ්‍යයනය කළ අතර බොහෝ විශ්ලේකයන් ක්‍රියාත්මක වන තවමත් ඒවා ක්‍රමාංකනය කිරීමෙන් පසුව වාතයේ තත්ත්ව අධීක්ෂණය සඳහා භාවිත කළ හැකි බව සොයා ගන්නා ලදී.

පර්යේෂණාගාරය අමුණා ඇති වාහනය ද හොඳ ක්‍රියාකාරී තත්ත්වයක පවතින අතර, බදෙහි යම් යම් සුළු හානි වීම් සහිත විය. MAAQML පද්ධතියෙහි වාහනය නිවැරදි කිරීම් විශ්ලේෂක සහ බලපද්ධතිය අවට වායු තත්ත්ව අධීක්ෂණ වැඩසටහන් සඳහා පද්ධතිය එක් කිරීමේ යාවත්කාලීන කිරීම් සිදු කෙරෙමින් පවතී. කෙසේ වෙතත්, මෙම MAAQML පද්ධතිය අධීක්ෂණ ජාලයට එක් කිරීම සඳහා දත්ත එක් රැස් කිරීමේ මෘදුකාංග පද්ධතිය යාවත්කාලීන කළ යුතු ව ඇත.



ජංගම පරිසර වායු තත්ත්ව අධීක්ෂණ පර්යේෂණාගාරය

විසරණ සහ රෙසින ඇතිරුම් ගල් ඇලවුම් (Dispersion & Resin Tile Adhesive) පරීක්ෂණ හඳුන්වා දීම


ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ පෙළේ පරීක්ෂණ පහසුකම් සපයන්නෙකු වශයෙන් ජා. ගෙ. ප. සංවිධානයෙහි ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ පර්යේෂණාගාරය එහි ටයිල් ඇලවුම් පරීක්ෂණ සේවා පුළුල් කර ඇත. විශිෂ්ටත්වය සඳහා කීර්තියක් ඇති කර ගෙන ඇති ජා. ගෙ. ප. සංවිධානය 2017 වසරේ සිට ඉදිකිරීම් අංශය සහ නිෂ්පාදකයින්හට සිමෙන්ති ටයිල් ඇලවුම් පරීක්ෂණ පහසුකම් සලසනු ලබයි. මෑතක දී ජා. ගෙ. ප. සංවිධානය විසින් ඉදිකිරීම් ද්‍රව්‍ය නිෂ්පාදකයින්ගේ විකාශනය වන අවශ්‍යතා සපුරාලමින් විසරණය සහ රෙසින-පාදක ඇතිරුම් ටයිල් ඇලවුම් සඳහා නව පරීක්ෂණ සේවා හඳුන්වා දී ඇත.

අපගේ ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂණ විද්‍යාගාරය මේ වන විට, විසරණය සහ රෙසින-පදනම් ටයිල් ඇලවුම් සඳහා වන පුළුල් පරීක්ෂණයන්; සම්මත සහ තෙත් තත්ත්වයන් හි දී සහ වැඩි කළ තාපය යටතේ (shear adhesion strength) වැනි මූලික පරාමිතීන් ආවරණය කරමින් සිදු කරයි. ජා. ගෙ. ප. සංවිධානය විසින් තාප ප්‍රතිරෝධීතාවය, බලපෑම් කෙරෙහි ප්‍රතිරෝදය සහ විවෘත කාලය පිළිබඳ ව ද පරීක්ෂා කිරීම සිදු කරයි.

මෙම පරාමිතීන් ANSI 136.1, ISO 13007-2 සහ EN 12004-2 වැනි ජාත්‍යන්තර ප්‍රතීතනයන්ට අනුකූල ව පරීක්ෂා කරනු ලබන අතර, කර්මාන්ත ක්ෂේත්‍රයේ මිණුම් සලකුණු සපුරාලන විශ්වාසදායක ප්‍රතිඵල සහතික කෙරේ.

ජා. ගෙ. ප. සංවිධානය ඉදිකිරීම් අංශය වෙත නිවැරදි සහ දියුණු පරීක්ෂණ සේවා සැපයීමට කැප වී සිටී. ජා. ගෙ. ප. සංවිධානයෙහි Dispersion සහ රෙසින-පදනම් ඇලවුම් පරීක්ෂාව කර්මාන්තයේ දියුණුවෙහි ඉදිරියෙන් ම සිටීම උදෙසා තම කැපවීම විදහා දක්වයි. ජා. ගෙ. ප. සංවිධානය අඛණ්ඩ කර්මාන්ත ක්ෂේත්‍රය සඳහා සහයෝගීතාවය මෙන් ම, පරීක්ෂණ සහ නවෝත්පාදනවල විශිෂ්ඨත්වය වර්ධනය අඛණ්ඩ ව පවත්වා ගැනීම අපේක්ෂා කර ඇත.





නව්‍යකරණ සිදුකරන ලද පරීක්ෂණ යන්ත්‍ර සැකැස්ම


ජා. ගෙ. ප. සංවිධානය මඟින් නිෂ්පාදිත සම්මත වැලි



ජා. ගෙ. ප. සංවිධානය විසින් අදාළ ප්‍රමිතීන් හි දක්වා ඇති අවශ්‍යතා පරිදි වැලි නිෂ්පාදනය කරයි. ශ්‍රී ලංකාවේ ඉල්ලුමට සරිලන පරිදි සම්මත වැලි නිෂ්පාදනය කිරීමේ හැකියාව ජා. ගෙ. ප. සංවිධානය සතු ව ඇත.

සහතික කිරීමේ ක්‍රියාවලිය, තොග සඳහා ද්‍රව්‍ය නිශ්කාෂණය සහ ඉදිකිරීම්වල දී මූලාශ්‍ර අනුමැතිය සඳහා සිමෙන්ති පරීක්ෂාව අත්‍යවශ්‍ය වේ. SLS සහතිකය ලබාදීමේ ක්‍රියාවලියේ දී සිමෙන්ති නිෂ්පාදකයින් SLSI ප්‍රමිතියෙහි දක්වා ඇති පරීක්ෂණ පරාමිතීන්ට අනුකූල වන පරිදි තම නිෂ්පාදනයන් සිදු කර තිබිය යුතු ය.

SLS 107, 515, 1247, 1253 සහ 1697 ප්‍රමිතීන්වල ප්‍රධාන ගුණාංග තුන: යාන්ත්‍රික, භෞතික සහ රසායන ගුණ ලෙස සඳහන් වේ. යාන්ත්‍රික ගුණාංග යටතේ සිමෙන්තිවල කල්පැවැත්ම තීරණය කරන ප්‍රධාන පරාමිතීන් වන්නේ සම්පීඩතා ශක්තිය යි. පරීක්ෂණ ප්‍රිස්මයේ සවිවීමේ කාලය සැලකිල්ලට ගනිමින් එය පූර්ව ශක්තිය සහ සම්මත ශක්තිය ලෙස වර්ගීකරණය කර ඇත. සම්මත වැලි චීනය, ජර්මනිය සහ ප්‍රංශය වැනි රටවලින් ආනයනය කිරීම සිදු කෙරේ. 2021 වසරේ දී ඇසුරුම් 37,600ක් මිළදී ගෙන ඇති අතර එහි වටිනාකම රු. මිලියන 28.0ට අධික විය. රට තුළ පවතින ආර්ථික අර්බුදය හේතුවෙන් ද්‍රව්‍ය ආනයනය සීමා කිරීම සම්බන්ධයෙන් රජය විසින් රෙගුලාසි රැසක් පනවා ඇත. ඒ අනුව, සිමෙන්ති පරීක්ෂාවන් සඳහා සම්මත වැලි ආනයනය කිරීමේ දී සිමෙන්ති නිෂ්පාදන සමාගම් වෙත දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදු විය. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය (SLSI) විසින් දේශීය වශයෙන් සම්මත වැලි නිපදවීමේ ප්‍රභවයන් සොයා ගැනීම සඳහා ජා. ගෙ. ප. සංවිධානය වෙත ඉල්ලීම් ඉදිරිපත් කෙරිණි. ජා. ගෙ. ප. සංවිධානය සැමවිටම විශේෂඥයන්ගේ මඟපෙන්වීම යටතේ පර්යේෂණ අධ්‍යයනයන් තුළින් ක්ෂේත්‍රයේ කාර්මික ගැටලු සඳහා විසඳුම් ලබා



ශ්‍රී ලංකාවේ සම්මත වැලි පරිභෝජනය

දීමට සූදානමින් සිටී. මෙම අධ්‍යයනය මොරටුව විශ්වවිද්‍යාලයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය එස්. එම්. ඒ. නානායක්කාරයන්ගේ අධීක්ෂණය යටතේ සිදු කරන ලදී.

මේ වන විට, ජා. ගො. ප. සංවිධානය ලබා දී ඇති ප්‍රතීතනයන්ට අදාළ වන පරිදි සම්මත වැලි නිෂ්පාදනය සිදු කරනු ලබයි. ජා. ගො. ප. සංවිධාන පරිශ්‍රයේ දී ඒවා සාධාරණ මිළ ගණන් යටතේ ලබා ගැනීමේ හැකියාව ඇත. ශ්‍රී ලංකාවේ ඉල්ලුමට සරිලන පරිදි සම්මත වැලි නිපදවීමේ හැකියාව ජා. ගො. ප. සංවිධානය සතු ව පවතී. තාක්ෂණික වශයෙන් සුදුසුකම් ලත් කාර්යමණ්ඩලය සෑම විටම මෙම ක්‍රියාවලිය නිරීක්ෂණය සඳහා සූදානම් ව සිටී. ටෝකියෝ සිමෙන්ති පීඑල්සී සමාගම, ලංවා සංස්ථා සිමෙන්ති (පුද්.) සමාගම, මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය සහ ඩී. එච්. ටී. සිමෙන්ති (පුද්.) සමාගම ප්‍රධාන ගැනුම්කරුවන් වේ.



නිකුත් කිරීම සඳහා සුදානම් කර ඇති ජා. ගො. ප. සංවිධානය විසින් නිෂ්පාදනය කරන ලද සම්මත වැලි නිෂ්පාදනය

රසායනික කර්මාන්තවල හදිසි ගිනි ගැනීම් පිළිබඳ ආපදා අවදානම කළමනාකරණය කිරීම සඳහා ජා. ගො. ප. සංවිධානයේ මැදිහත් වීම

ලෝකයේ කාර්මීකරණයේ සහ ජනගහනයේ වර්ධනය වීමත් සමඟ රසායනික කර්මාන්ත විශාල ලෙස ඉහළ යෑම හේතුවෙන් රසායනික කම්හල් ආශ්‍රිත අනතුරු සීග්‍ර ලෙස වර්ධනය වෙමින් ශ්‍රී ලංකාව රසායනික විපත් අත්විඳිමින් සිටී. කඳාන, ග්ලෝබල් කෙයා ප්‍රොඩක්ට්ස් සහ හෝමාගම, වෝටර් කෙයාර් ටෙක්නොලොජීස් (පුද්) සමාගම යන ස්ථානයන් හි පිළිවෙලින් 2023 අගෝ. 08 හා 2023 අගෝ. 17 යන දිනයන් හි දී සිදුවූ ගිනි ගැනීම් ඒ සඳහා වන මෑත කාලීන උදාහරණයන් වේ. කර්මාන්තයන් දෙකම ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලියෙහි අමුද්‍රව්‍ය ලෙස වාෂ්පශීලී සහ ගිනිගන්නා සුළු රසායනික ද්‍රව්‍ය භාවිත කර ඇත. දුම මඟින් වන ප්‍රධාන අන්තරාය වනුනේ දෘශ්‍යතාව අවම වීමයි. ගින්නක් අතර තුර ජනනය වන දුම් සහ විෂ සහිත වායූන් මෙන් ම වාෂ්ප ස්වසන අපහසුතාවන්, ඇස, කන, නාසය සහ සමෙහි මෘදු සංකූලතාවන් වැනි හානිකර බලපෑම් සඳහා හේතුවේ.

මෙම සිදුවීම් දෙකම පිළිබඳ ව මධ්‍යම පරිසර අධිකාරිය (CEA) සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය (DMC) විසින් ජා. ගො. ප. සංවිධානය වෙත දැනුම් දෙන ලදී. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඒ ඒ අවස්ථාවන් හි දී පරිසර අධ්‍යයන හා සේවා අංශයේ අධ්‍යක්ෂවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් කණ්ඩායම් එකී ස්ථානයන් වෙත ළඟා වී අවට ප්‍රජාවන්ගේ ආරක්ෂාව සඳහා අවදානම් මට්ටම් හඳුනාගැනීම සඳහා වායු සාන්ද්‍රණය නිරීක්ෂණයන් සිදු කළ අතර හදිසි අවස්ථාවන් හි දී ගනු ලබන ක්‍රියාමාර්ග, ජීවිත බේරා ගැනීම් සහ අවදානමට ලක් විය හැකි ජනතාවගේ ජීවනෝපායන් ආරක්ෂා කිරීම ඉතා වැදගත් වන බැවින් ඒ සඳහා අදාළ බලධාරීන් මෙන් ම වගකිව යුතු ආයතන වෙත වාර්තා සිදු කිරීම් සිදු කරන ලදී.



හෝමාගම - වොටර් කෙයා ටෙක්නොලොජීස් (පුද්) සමාගමේ හටගත් ගින්න

අවට වාතයේ ගුණාත්මකභාවය පිළිබඳ ද්විතීක තහවුරු කිරීමේ උපායමාර්ගයක් ලෙස ඉහළ නිරවද්‍ය අම්ල වැසි ජල රැස්කකරණයක් සහ අනාවරකයක් සංවර්ධනය කිරීම

මානව ක්‍රියාකාරකම් නිසා සිදුවන වායු දූෂණය නාගරික ප්‍රදේශයන් හි ප්‍රධාන පාරිසරික ගැටලුවක් බවට පත් ව ඇත. ප්‍රධාන වායු දූෂක වන්නේ සල්ෆර්ඩයොක්සයිඩ් (SO2) සහ නයිට්‍රජන් ඔක්සිඩ (N2O) වැනි ආම්ලික වායූන් මෙන් ම අංශූන් වේ. මෙම දූෂක ද්‍රව්‍යයන් තෙත් සහ වියලි තැන්පත් වීම් ලෙස පොළොව මත තැන්පත් වීමෙන් වැසි ජලයේ PH අගය අඩුවී පරිසර පද්ධතීන්ට හානි සිදුවේ. PH අගය 4.0 පමණ අගයක් සහිත අම්ල වැසි මඟින් පරිසර පද්ධතිය හා ගොඩනැගිලි කෙරෙහි විශාල පරිමාන බරපතල බලපෑම් ඇති විය හැකිය. එබැවින් වැසි ජලයේ ආම්ලිකතාව හඳුනාගැනීමට සහ අනාගත අපවිත්‍ර වීම් වැළැක්වීම් සඳහා තත්කාලීන නිරීක්ෂණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම වැදගත් වේ.

ශ්‍රී ලංකාවේ වැසි ජලයේ තත්ත්වය අධීක්ෂණය වායු දූෂණ මට්ටම් සමඟ කිසිදු සම්බන්ධයක් නොමැති ව PH අගය මැනීම පමණක් සීමාවී පවතී. දුරස්ථ

සංවේදන ඒකකයන් භාවිතය ක්‍රමාංකන නිරවද්‍යතා ගැටලු හේතුවෙන් විශ්වාසනීය නොවන තත්ත්වයක පවතී. මෙම දුර්වලතා මඟහරවා ගැනීම සඳහා තත්‍ය කාලීන අවස්ථාවන්වල දී PH අගය, සන්නායකතාව සහ TDS මැනීම සඳහා ඉහළ නිරවද්‍යතාවයකින් යුත් වැසි ජලය රැස්කරණයන් සංවර්ධනය කරමින් සිටී.

2023 ඔක්තෝම්බර් මාසයේ දී අක්‍රිලික් ද්‍රව්‍ය භාවිතයෙන් වැසි මාපකයක් සැලසුම් කිරීමත් සමඟ ව්‍යාපෘතිය ආරම්භ විය. මූලික වශයෙන් සංවේදකයන් රහිත ව මාපක පරීක්ෂා කරන ලද අතර, නොවැම්බර් මාසයේ දී අදාළ සංවේදකයන් මිළදී ගෙන වැඩි දුර පිරිසැකසුම්, අත්හදා බැලීම් සහ දෝෂ කටයුතු නිවැරදි කිරීම් සිදු කරන ලදී. සැලසුම්කරණයන් සහ ක්‍රමලේඛන කටයුතු තවදුරටත් සිදුවෙමින් පවතින අතර මූලාකෘති නිර්මාණ ක්ෂේත්‍ර තුළ පරීක්ෂා කටයුතු සඳහා යෙදවීම් 2024 අගෝස්තු අග භාගය වන විට සිදු කිරීමට නියමිත ව ඇත.

ද්විත්ව වළලු (විනිවිදයාම් මාපකය) භාවිතයෙන් ක්ෂේත්‍රයේ පස්වල විනිවිදයාම් සීඝ්‍රතාව නිගමනය කිරීම

මෙම පරීක්ෂණ ක්‍රමය ද්‍රව අපද්‍රව්‍ය බැහැර කිරීම, විභව මළ අපද්‍රව්‍ය බැහැර කිරීම් ක්ෂේත්‍ර ඇගැයීම්, කාන්දුවීම් සහ ජලාපවාහන කාර්යක්ෂමතාව, වාරිමාර්ග අවශ්‍යතා, ජල ව්‍යාප්තීන් හා නැවත ආරෝපණය කිරීම්, ඇල හෝ ජලාශ්‍රයන් හි කාන්දුවීම් සඳහා පසෙහි විනිවිද යාමේ සීඝ්‍රතාව මැනීම වැනි ක්ෂේත්‍රයේ වෙනත් යෙදුම් අතර මිනුම් සඳහා ප්‍රයෝජනවත් වේ. 2022.01.27 දින අංක 2264/17 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කර ඇති ජාතික පාරිසරික (ආරක්ෂාව හා තත්ත්ව) රෙගුලාසි මඟින් පනවා ඇති කෘෂි කාර්මික කටයුතු සඳහා වන ඉඩම් මත අපජලය හෝ අපවහන ජලය බැහැර කිරීම්වල සහනතා සීමාවන් අනුව, පාරිභෝගිකයින්ගේ ඉල්ලීම් මත මුදාහැරීමේ සීඝ්‍රතාවයන් ද්‍රව රැස්කිරීම් පිළිබඳ මෙම පරාමිතීන් තක්සේරුකරණය ජා. ගො. ප. සංවිධානය විසින් සිදු කරනු ලබයි. පනතෙහි සඳහන් පරිදි ASTMD3385-09 මඟින් නියමකර ඇති ක්ෂේත්‍රයේ පස තුළ ද්විත්ව වළලු විනිවිදයාමේ මාපක භාවිතයෙන් සම්මත පරීක්ෂා ක්‍රමයන්ට අනුකූල ව අපජලය බැහැර කළ යුතු භූමියෙහි ස්ථානීය විනිවිදයාම් අනුපාතය මැනීම් සිදු කළ යුතු ය.

ද්විත්ව වළලු විනිවිදයාමේ මාපක ක්‍රමයේ දී උස ආසන්න වශයෙන් මිමී. 500 (අගල් 20) පමණ වන විශ්කම්භයක්, මිමී 300 (අගල් 12) සහ මිමී. 600 අගල් 24 වන විවෘත සිලින්ඩරයන් දෙකක් එකක් මත අනෙක වන පරිදි භූමිය මත තබා වළලු කොටසක් ජලය හෝ දියරයන්ගෙන් පුරවනු ලබන අතර, ද්‍රව මට්ටම් නියත ව පවත්වා ගැනීම සිදු කරයි. අභ්‍යන්තර වළල්ලට එකතු කරනු ලබන ද්‍රව පරිමාව, පස තුළට විනිවිද යන ද්‍රව පරිමාවෙහි මිනුම වේ. කාල පරාසයන් තුළ පස තුළට විනිවිද ගිය පරිමාව වර්ධක විනිවිදයාම් වේගයකට පරිවර්තනය කරනු ලබන අතර, සාමාන්‍යයෙන් පැයකට සෙන්ටිමීටර් (සෙ.මී./පැය) හෝ පැයට අගල් (අගල්/පැය) ලෙස ප්‍රකාශ කිරීම හා ගත වූ කාලයට එදිරි ව ප්‍රස්ථාර ගත කිරීම සිදු කෙරේ. නිරීක්ෂණයේ අරමුණ/භාවිතය මත පදනම් ව උපරිම ස්ථායී තත්ත්වය හෙවත් සාමාන්‍ය විනිවිද යාමේ වේගය විනිවිද යාමේ සීඝ්‍රතාවට සමාන වේ.



ද්විත්ව වළලු විනිවිදයාමේ මාපකය

කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ ගස් කඩා වැටීම් හේතුවෙන් සිදු වන ජීවිත හානි සහ දේපළ හානි වැළැක්වීම සඳහා අනතුරුදායක ගස් හඳුනාගැනීම සඳහා වෘක්ෂ අවදානම් තක්සේරුකරණය

නගරාශ්‍රිත ශාක, ශතවර්ෂ ගණනාවක් තිස්සේ නාගරික නිර්මාණයට අනුකලනය වී දර්ශනීය සුන්දරත්වයකින් යුත් සිසිල් අවකාශයන් වැඩි දියුණු කරන අතර, විවිධ මානව, පාරිසරික සහ ආර්ථික ප්‍රතිලාභ ළඟා කර දෙයි. කෙසේ වෙතත්, ඒවා එවායේ යහ පැවැත්ම කෙරෙහි බලපාන තාප දූපත් බලපෑම, සීමිත මූල අවකාශය, විනාශයන් සහ පෝෂක ඌනතාවන් වැනි නාගරික අභියෝග යන්ට මුහුණ පා ඇත. රූප විද්‍යාත්මක වෙනස් කිරීම් ජීව ශක්තියට බලපෑම් කරන අතර නාගරික සේවාවන්ට බාධා සිදුවීම්, ජනතාව සහ දේපලවලට අවදානම් එල්ල කිරීම සිදු කරයි. අධික සුළං සහ වර්ෂාපතනය වැනි ස්වභාවික සිදුවීම්වල දී ශාකයන් කඩා වැටීම් සිදු විය හැකි අතර, එමඟින් හානි හා ජීවිත හානි පවා සිදු විය හැක. මෙම අභියෝගයන් හඳුනාගැනීමෙන් තිරසාර නාගරික සැලසුම්කරණය සහ නඩත්තුකරණයෙහි අවශ්‍යතාව පැන නගින අතර, නාගරික වෘක්ෂයන්ගේ අඛණ්ඩ ප්‍රතිලාභ සහතික කිරීමත් අවදානම් පරිපූර්ණ ලෙස අවම කිරීම කළ යුතු වේ.

2023 ඔක්තෝම්බර් 6වැනි දින සිදු වූ ඛේදජනක සිදුවීමත් සමඟ ශ්‍රී ලංකාවේ නාගරික වීදි ආශ්‍රිත වෘක්ෂයන් අවට ආරක්ෂාව පිළිබඳ ගැටලු උග්‍ර විය. කොළඹ 2, ප්‍රදේශයේ දී දැවැන්ත වෘක්ෂයක් බස් රථයක් මතට ඇදවැටීමෙන් පුද්ගලයින් 5 දෙනෙකුගේ ජීවිත අහිමි විය. 20 දෙනෙකුට ආසන්න සංඛ්‍යාවක් තුවාල ලැබීමට සිදු විය. මෙම සිද්ධියෙන් අනතුරු ව, වෘක්ෂයන් බිඳ වැටීම් සම්බන්ධ ආපදා අවම කිරීම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමේ ප්‍රයත්නය වෙනුවෙන් නායකත්වය ලබා දෙන ලෙස ආපදා කළමනාකරණ අංශය විසින් ජා. ගෙ. ප. සංවිධානය වෙත උපදෙස් ලබා දී ඇත. විස්තීරණ වෘක්ෂ අවදානම කළමනාකරණ සැලැස්මක් ස්ථාපිත කිරීම අරමුණු කරගත් තීරණාත්මක තීන්දුවලට එළඹීමට ඒ තුළින් හැකි විය.

- වෘක්ෂයන් කඩා වැටීම හා සම්බන්ධ අනාගත ප්‍රතිවිපාකයන් අවම කිරීම සඳහා පූර්ව අනතුරු ඇගවීම් නිකුත් කිරීමේ කේන්ද්‍රස්ථානය ලෙස ජා. ගෙ. ප. සංවිධානය වෙත පැවරීම
- වෘක්ෂයන් කඩා වැටීමේ හා බිඳ වැටීමේ අවදානම වර්ගීකරණය කරමින් ලැයිස්තුවක් සංවර්ධනය කිරීම
- අනතුරුදායක බව ප්‍රකාශයට පත් කරන ලද වෘක්ෂයන්ගේ සෞඛ්‍ය කළමනාකරණය සඳහා විස්තරාත්මක නිවැරදි කිරීමේ මාර්ගෝපදේශයක් සකස් කිරීම

ජා. ගෙ. ප. සංවිධානයේ පරිසර අධ්‍යයන හා සේවා අංශය විසින් කොළඹ මහ නගර සභා බල ප්‍රදේශය තුළ වෘක්ෂ අවදානම් තක්සේරුව පිළිබඳ පර්යේෂණ වැඩසටහනක් දියත් කර ඇත. මූලික අරමුණ ලෙස පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සහ වෘක්ෂයන් කඩා වැටීම හේතුවෙන් සිදු විය හැකි අනතුරු සහ කඩා වැටීම් හේතුවෙන් සිදු විය හැකි අනතුරු සහ දේපල හානි කල් ඇති ව වළක්වා ගැනීම් ඇතුළත් වේ.



ක්‍රියාකාරී කණ්ඩායම් විසින් ක්ෂේත්‍ර චාරිකාව

දත්ත සමුදා කළමනාකරණය සහ සාමාන්‍ය ජනතාව වෙත දෛනික වාර්තා ජනනය කිරීම සඳහා ඉන්ටර්නෙට් ඔෆ් තිංස් (IOT) පද්ධති සංවර්ධනය

නව අධීක්ෂණ තාක්ෂණයන් හඳුන්වා දීම සහ දත්ත සමුදා කළමනාකරණය සඳහා ඉන්ටර්නෙට් ඔෆ් තිංස් (IoT) පද්ධති සංවර්ධනය කිරීම ශ්‍රී ලංකාවේ වායු තත්ත්ව අධ්‍යයනයේ නව යුගයක් නිර්මාණය කර ඇත. ජා. ගෙ. ප. සංවිධානය විසින් අඛණ්ඩ අවට පරිසර වායු තත්ත්ව අධීක්ෂණ ජාලයක් සංවර්ධනය කිරීම සඳහා ඒකාබද්ධ තාක්ෂණයක් සමඟින් වායු තත්ත්ව අධීක්ෂණයේ මෙම වෙනස සිදු කර ඇත. වර්තමාන අධීක්ෂණ ජාලය අංශු ම ය පදාර්ථ (PM) (අංශු ම ය පදාර්ථ10 සහ අංශු ම ය පදාර්ථ 25) නිරීක්ෂණය සඳහා තත්‍යකාලීන වායු අධීක්ෂණ ඒකක 20කින් සමන්විත වේ. දත්ත ජා. ගෙ. ප. සංවිධානයේ නිල වෙබ් අඩවියේ (www.aq.nbro.gov.lk) ප්‍රකාශයට පත් කර ඇති අතර, ප්‍රදර්ශන පුවරුවල ප්‍රදර්ශනය කිරීමත්, හදිසි ක්‍රියාමාර්ග සඳහා දිනපතා අදාළ ආයතන වෙත දැනුම් දීමත් සිදු කරනු ලැබේ. උදා: ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය)

එමෙන් ම විද්‍යාත්මක ප්‍රකාශයන් හි ප්‍රවනතා විශ්ලේෂණ, බලපෑම් විශ්ලේෂණ සහ සම්බන්ධතා විශ්ලේෂණ ආදිය සඳහා දත්තයන් බහුල ව භාවිතා කෙරේ. තව ද, පරිසර අමාත්‍යාංශය (වායු සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය), මධ්‍යම පරිසර අධිකාරිය, මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව, වෙනත් අදාළ නියාමන ආයතන, පර්යේෂකයින්, උපාධි අපේක්ෂකයින් සහ පශ්චාත් උපාධි සිසුන්, වෘත්තිකයන්, ප්‍රතිපත්ති සංවර්ධකයින්, ජනමාධ්‍ය සහ සාමාන්‍ය ජනතාව ආදී පුළුල් පරාසයක පාර්ශවකරුවන් වෙත දත්ත ලබා දීම සිදු කෙරේ.

Ambient Air Quality Status in Major Urban Areas in Sri Lanka

Past 24 Hour Average Particulate Matter (Dust) level at 8:00 am on 05th February 2024

Location	Particulate Matter Level ($PM_{2.5}$) µg/m³	Air Quality Index for Sri Lanka (SL AQI)
Colombo 07 (MET Department)	34	68
Jaffna (MET Department)	22	44
Kurunegala (PEA)	20	40
Vavuniya (MET Department)	21	42
Kandy (Railway Station)	26	52
Kegalle (Post Office)	25	51
Galle (Karapitiya)	27	54
Nuwara Eliya (Magasthota)	35	70
Rathnapura (Gatangama)	23	46
Embilipitiya (Post Office)	24	48
Puttalam (MET Department)	23	46
Badulla (District Secretariat)	36	72
Trincomalee (MET Department)	24	48
Mullaitivu (MET Department)	25	51
Batticaloa (MET Department)	21	42
Kalutara (Post Office)	24	48
Hambantota (Post Office)	23	46
Polonnaruwa (MET Department)	21	42
Anuradhapura (MET Department)	24	48
Monaragala (MET Department)	19	38

Air Quality Index (AQI) for Sri Lanka

Index Range	Level of Concern	Meaning of Air Quality Index Level
0 - 50	Good	Air Quality is considered to be healthy or the potential risk is negligible.
51 - 100	Moderate	Air Quality is acceptable; may pose a minor or moderate health concern for sensitive groups.
101 - 150	Slightly Unhealthy	May experience health effects for sensitive groups, impacts are unlikely to general public.
151 – 200	Unhealthy	May experience negative health effects to all, where serious health effects for sensitive groups.
201 - 300	Very Unhealthy	Trigger a health alert, everyone may experience more serious health effects.
301 - 500	Hazardous	Trigger health warnings in emergency condition. The entire population is likely to be affected by serious health impacts

Sri Lanka Air quality index level with respect to $PM_{2.5}$ for past 24 hours ending from 8:00 am, 05/02/2024 indicate moderate level at Colombo 07, Kandy, Kegalle, Galle, Nuwaraeliya, Badulla, Mullaitivu and good level at other cities in the country. It is forecasted that air quality level within next 24 hrs will be moderate at most of the cities in the country. These forecast levels are subjected to the weather condition and wind profile of the country.

Environmental Studies & Services Division,
National Building Research Organisation
99/1, Jawatte Road, Colombo 05
Tel : 011 2588946 Email : nbro@sltnet.lk Web: www.nbro.gov.lk

අවට වායු තත්ත්ව තත්ව වාර්තාව


ජා. ගෙ. ප. සංවිධානය විසින් සංවර්ධනය කරන ලද සම්ප්‍රදායික වර්ෂාමාන

ශ්‍රී ලංකාව දේශගුණික විපර්යාස බලපෑම්වලට ගොදුරු විය හැකි බවට පිළිගෙන ඇති අතර 2017 ND-GAIN දර්ශකයේ රටවල් 181ක් අතරින් 100 වැනි ස්ථානයට පත් ව තිබේ. ගෝලීය දේශගුණික විපර්යාස නිසා ආන්තික කාලගුණික සිදු වීම් වැඩි වීමත් සමඟ රට තුළ වර්ෂාපතන රටාවල අනපේක්ෂිත විචල්‍යතාවන් සිදු විය හැක. ගංවතුර, නායයෑම් සහ නියඟය, රටේ දළ දේශීය නිෂ්පාදනයට පරපතල ලෙස බලපාන අතර, පරිසරික හා ආර්ථික වශයෙන් සැලකිය යුතු අලාභයක් සිදු කරන බැවින් විශ්වසනීය වර්ෂාපතන අනාවැකි මත පදනම් වූ අනතුරු ඇඟවීම් තුළින් රට තුළ සිදු වන මෙම ආපදා අවදානම් කල් ඇති ව කළමනාකරණය කර ගනිමින් මානව හා ආර්ථික හානි අවම කිරීමේ අවශ්‍යතාවක් පවතී.

ජා. ගෙ. ප. සංවිධානය විසින් නිරවද්‍ය මිණුම් අගයන් සහ පූර්ව අනතුරු ඇඟවීම් සඳහා වර්ෂාපතන අගයන් පිළිබඳ දත්ත ස්ථාන ම ය වශයෙන් පුළුල් විස්තර

කිරීමක අවශ්‍යතාව හඳුනාගෙන ඇත. ඒ අනුව, සංවිධානය විසින් මිමී. 300ක ධාරිතාවයක් සහිත ප්‍රමිතියෙන් හා කල්පැවැත්මෙන් යුත් සම්ප්‍රදායික වැසිජල මාපකයක් නිර්මාණය කර ඇත. කිසියම් කාල පරිච්ඡේදයක් තුළ යම් ප්‍රදේශයක වර්ෂාපතන ප්‍රමාණය මැනීම, ගෘහ ම ය මට්ටමේ සිට ගොවිතැන, ගංවතුර මෙන් ම නායයෑම් ආදියෙහි අනතුරු ඇඟවීම් දක්වා ජල මට්ටම් පුරෝකථනයන් සඳහා පුළුල් පරාසයක් තුළ භාවිතා කිරීමේ හැකියාව ඇත.

මෙම උපකරණය පරිශීලක-හිතකාමී අයුරින් පාරිභෝගික අවශ්‍යතාවන්ට සැකසිය හැකි බැවින් (භාෂාව සහ උපදෙස්) නිසි අලෙවියෙන් පසු සේවාවන් ද සහිත ව දැරිය හැකි මිළ ගණන් යටතේ ලබා ගැනීමේ හැකියාව ඇත.



ජා. ගෙ. ප. සංවිධානය විසින් නිපදවා ඇති සම්ප්‍රදායික වර්ෂාමානය

ආපදා අවදානම් අවම කිරීම සඳහා ඩ්‍රෝන තාක්ෂණය භාවිතය

ඩ්‍රෝන පාදක තාක්ෂණය ආපදා කළමනාකරණයේ විප්ලවීය වෙනසක් සිදු කරයි. මිනිසුන් රහිත ඩ්‍රෝන තාක්ෂණය භාවිතයෙන් ආපදාවලට පෙර මෙන් ම පසුකාලීන වශයෙන් වේගවත් හා නිරවද්‍යතාවෙන් යුත් දත්ත රැස්කිරීමේ හැකියාව සැලසී ඇත. ආපදා පෙර සූදානම් කටයුතුවලදී, හදිසි ප්‍රතිචාර සහ ආපදා අවම කිරීමේ ප්‍රයත්නයන් හි දී කාලීන තීරණ ගැනීම මෙන් ම ඵලදායී සම්බන්ධීකරණ කටයුතු සඳහා මෙම තාක්ෂණය මහත් සේ ඉවහල් වේ. නායයෑම් අවදානම් හඳුනාගැනීමේ සහ අවම කිරීමේ ක්‍රියාකාරකම්වල දී තීරණාත්මක ක්ෂේත්‍රයන් තුළ වසර ගණනාවක් පුරා ඩ්‍රෝන තාක්ෂණය භාවිතා කිරීමෙහි ලා ජා. ගෙ. ප. සංවිධානය පෙරමුණ ගෙන සිටී. වසර ගණනාවක් පුරා ජා. ගෙ. ප. සංවිධානය විසින් ඩ්‍රෝන තාක්ෂණය යොදා ගැනීම පමණක් නොව, එහි හැකියාවන් වැඩි දියුණු කිරීමට සහ එහි භාවිතයන් පුළුල් කිරීම පිණිස දේශීය ව මෙන් ම ජාත්‍යන්තර වශයෙන් ද සහයෝගිතාවන් පිළිබඳ සොයා බැලීම සිදු කර ඇත.



යාපනයේ වඩමාරච්චි සමීක්ෂණ උපදේශනය

ජා. ගෙ. ප. සංවිධානය නායයෑම් අවදානම් කළමනාකරණය සඳහා ඩ්‍රෝන තාක්ෂණය ඒකාබද්ධ කිරීම, ආපදා අවදානම් ප්‍රදේශවල තීරණාත්මක අභියෝගවලට ප්‍රවේශ වන ආකාරය සහ ඒවාට මුහුණ දෙන ආකාරය පිළිබඳ සුසමාදර්ශී

වෙනසක් පෙන්නුම් කරයි. නායයෑම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම පිණිස වඩාත් විස්තරාත්මක ඡායාරූපයන් සහ දත්තයන් ගුවනේ සිට ග්‍රහණය කර ගැනීමට ජා. ගෙ. ප. සංවිධානය සතු ඩ්‍රෝනයන් මඟින් හැකියාව ලැබී ඇත.

ජා. ගෙ. ප. සංවිධානයෙහි ඩ්‍රෝන පාදක මූලපිරීම්වල සඵලතාව වැඩිදියුණු කිරීම සඳහා විවිධ ඉදිරිදර්ශනයන්, විශේෂඥ දැනුම සහ සම්පත් ගෙන එමින්, ඍභය ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම සහ ඒරෝ ඉන්දියා (පුද්) සමාගම වැනි ජාත්‍යන්තර ආයතන ජා.ගෙ.ප. සංවිධානය සමඟ සහයෝගයෙන් කටයුතු කර ඇත.



යාපනයේ වඩමාරච්චි සමීක්ෂණ උපදේශනය





කෑගල්ල නගරයේ ඩ්‍රෝන සමීක්ෂණ උපදේශනය





ධාරිතා වර්ධන වැඩමුළුව

2023 ලෝක ජනාවාස දිනය සැමරීම වෙනුවෙන් ජා. ගො. ප. සංවිධානය විසින් ඔරොත්තු දෙන නිවාස පිළිබඳ උපදේශන සේවාවක් දියත් කරයි

ශ්‍රී ලංකාව ගංවතුර, නායයෑම්, අධික සුළං, නියඟය සහ සුනාමි වැනි විවිධ ස්වභාවික විපත්වලට ලක් වීමේ නැඹුරුතාවක් සහිත වේ. තව ද, දේශගුණික විපර්යාසවල බලපෑමත් සමඟ ආන්තික කාලගුණික විෂමතාවන් වැඩිවීමත් සමඟ මෙම ස්වභාවික විපත් ඇති වීම තීව්‍ර වීම සිදුවේ.

දේශගුණය ආශ්‍රිත මෙම උවදුරුවලට ශ්‍රී ලංකාවේ නිවාස සහ යටිතල පහසුකම්වල ඇති ගොදුරු වීමේ හැකියාව පිළිබඳ අවධානය වැඩි වී තිබේ. රට පුරා නිවාස සහ ප්‍රජාවන් විනාශකාරී අලාභයන්ට මුහුණ දී ඇති අතර ඔරොත්තු දෙන නිවාස විසඳුම් කෙරෙහි ඇති අවශ්‍යතාව වැඩි වී ඇත.

මෙම අභියෝග හඳුනාගනිමින්, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය (හඊසෘධ) විසින් ඔරොත්තු දෙන නිවාස සඳහා උපදේශන සේවාවක් ස්ථාපිත කරමින් මෙම තීරණාත්මක ගැටලු විසඳීම සඳහා ක්‍රියාකාරී පියවර ගනිමින් සිටී. 2023 වර්ෂයේ ලෝක ජනාවාස දිනය සැමරීම වෙනුවෙන් මෙම මුල පිරීම දියත්කර ඇත්තේ පුරවැසියන් සඳහා ඔරොත්තු දීමේ හැකියාව සහ ආරක්ෂාව ඉහළ නැංවීම කෙරෙහි ශ්‍රී ලංකාවේ කැපවීම පිළිබඳ ව සාක්ෂියක් වශයෙනි.

ඔරොත්තු දෙන නිවාස පිළිබඳ උපදේශන සේවා:

ඉඩම් තෝරා ගැනීම සහ පිරිසැලසුම් සැලසුම්කරණය පිළිබඳ මඟපෙන්වීම:
ස්වභාවික විපත්වලට හා පාරිසරික අවදානම්වලට ගොදුරුවීමේ අවදානම අවම ප්‍රදේශවල නිවාස ඉදිකිරීම් සහතික කිරීම සඳහා ඉඩම් තෝරා ගැනීම, පිරිසැලසුම් සැලසුම් කිරීම සහ ඉඩම් සංවර්ධනය සඳහා නිර්දේශ ලබා දීම.


පිරිසැලසුම් සහ අනුබෙදුම් සැලසුම් සමාලෝචනය කිරීම සහ වැඩිදියුණු කිරීම:
පිරිසැලසුම් සැලැස්ම සහ අනු බෙදුම් යෝජනා සමාලෝචනය කිරීම, ඔරොත්තු දීමේ හැකියාව ඉහළ දැමීම සඳහා උපදේශ ලබා දීම. උදා: ජලාපවහන ජාල, රැඳවුම් ව්‍යුහයන්, නිවාස සැලසුම් සැකසීම ආදිය.

ඔරොත්තු දීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා නිවාස සැලැස්ම සඳහා නිර්දේශ:
නිවාස සැලසුම් පිළිබඳ සවිස්තරාත්මක ඇගයීම් (නව ඉදිකිරීම් හෝ පවතින නිවාස නැවත සකස් කිරීම) උදා: නිවාස ඉදිකිරීමේ උප-ව්‍යුහය සහ උපරි-ව්‍යුහය සඳහා තාක්ෂණික නිර්දේශ

"සිනමන් එයාර්" සතු ජලය මත පාවෙන ගුවන් යානා ගොඩබැස්සවීමේ දී හා ගුවන්ගත කිරීමේ දී ජනනය වන ජල තරංග මඟින් කාශල්රි ජලාශ ඉවුර බාදනය වීම කෙරෙහි බලපෑම තක්සේරු කිරීම

පාවෙන ගුවන් යානා ගොඩබෑමේ දී හා ගුවන්ගත කිරීමේ දී ඇතිවන තරංග හේතුවෙන් කාශල්රි ජලාශ ඉවුර වෙත ඇති වන බලපෑම පිළිබඳ ව අධ්‍යයනයක් සිදු කරන ලෙස ලං.වි.ම. ඉල්ලීමක් මත සැෆ්රොන් ස්විට්සර්ලන්ත් (පුද්) සමාගම විසින් ජා. ගො. ප. සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව, බලපෑම් තක්සේරුව සිදු කිරීම සඳහා පහත ක්‍රමවේද අනුගමනය කරන ලදී.

1. සිදු වීම් ආශ්‍රිත තරංග උස මැනීම සඳහා ජලාශ ඉවුරෙහි ස්ථානයන් නිර්ණය කිරීම
2. ස්ථානීය මිණුම් නිර්ණායක සැකසීම
3. ජලතරංග උස සහ ඉවුරු බෑවුම මැනීම
4. පර්යේෂණාගාර සමාකරණ අත්හදා බැලීම
5. සැලසුම් සහ බාදන පරීක්ෂණය
6. දත්ත අර්ථ නිරූපනය



පර්යේෂණාගාර සමාකරණය




අඩවිය තුළ තරංග උප නියාමනය (සංවේදක පදනම්)


නේවාසික ගොඩනැගිලිවල ගෘහස්ථ ශබ්දය පරීක්ෂා කිරීම සඳහා බිත්ති බදාමයේ ධ්වනි ගුණාංග විමර්ශනය

මෙම අධ්‍යයනයේ අරමුණු බහු මහල් නේවාසික ගොඩනැගිලිවල එදිනෙදා ක්‍රියාකාරකම් හේතුවෙන් ජනනය වන සෝෂාවන් පෙරහන්කරණය සඳහා හොඳම මධ්‍යස්ථ ආදේශකයක් වශයෙන් ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය සහිත අභ්‍යන්තර බිත්ති බදාමයන් හි ධ්වනි ගුණාංග විමර්ශන කිරීමයි. බහු මහල් නේවාසික ගොඩනැගිලිවල ගෘහස්ථ ශබ්දවල සංඛ්‍යාත පරාසයන් හඳුනාගැනීම සඳහා පුළුල් සංයුති සමීක්ෂණයක් සිදු කරන ලද අතර ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය සමඟ අභ්‍යන්තර බිත්ති බදාමයන් හි ධ්වනි ගුණාංග විමර්ශනය කිරීම සඳහා තෝරා ගත් සංඛ්‍යාතයන් භාවිත කරන ලදී.

ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය සමඟ ISO-105342 (ශබ්ද අවශෝෂක සංගුණකය සහ සම්බාධක නල මඟින් සම්බාධනය ඇති කිරීම) ප්‍රතීතනය යටතේ පරීක්ෂණයන් සිදු කරන ලද අතර, පර්යේෂණ සැකසුම සම්බාධක නලයක්, මයික්‍රොෆෝන දෙකක්, පූර්ණ ශබ්ද පරාස ස්පීකරයක්, ශබ්ද වර්ධකයක් සහ ශබ්ද කාඩ් පතක් සහිත ලැප්ටොප් පරිගණකයකින් සමන්විත විය. ප්‍රතිචක්‍රීකරණය කරන ලද ද්‍රව්‍ය විවිධ මිශ්‍රන අනුපාතයන් සහිත ව සකස් කරන ලද බිත්ති බදාම ආදර්ශයන් හි සාමාන්‍ය සිදු වීම් ශබ්ද අවශෝෂක සංගුණකය සහ සාමාන්‍ය නිශ්චිත ධ්වනි සම්බාධක අනුපාතයන් නිර්ණය කිරීම සිදු විය.



සම්බාධක නලයක හරස්කඩ පෙනුම



ශබ්ද අවශෝෂක සංගුණක මැණීම

කොළඹ නාගරික ප්‍රදේශ තුළ වායු ගුණාත්මකභාවය කළමනාකරණය (AQM) පිළිබඳ සාක්ෂි පදනම් ප්‍රතිපත්ති සහ උපායමාර්ගයන් වැඩිදියුණු කිරීම සඳහා වන ව්‍යාපෘතිය

පරිසර අමාත්‍යාංශය, ජා. ගො. ප. සංවිධානය සහ මධ්‍යම පරිසර අධිකාරිය (CEA) විසින් සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනයේ (AFD) මූල්‍ය සහයෝගීතාව සහ Air Pariff තාක්ෂණික සහකාරීත්වය සහිත ව 'කොළඹ නාගරික ප්‍රදේශය තුළ (CMR) වායු ගුණාත්මකභාවය කළමනාකරණය පිළිබඳ සාක්ෂි පදනම් ප්‍රතිපත්ති සහ උපායමාර්ග සංවර්ධනය කිරීම' ව්‍යාපෘතිය ක්‍රියාවට නංවා ඇත. සංවර්ධනය සඳහා වන ප්‍රංශ නියෝජිතායතනය (AFD), Air Pariff තාක්ෂණික සහකරු සහ පරිසර අමාත්‍යාංශය අතර ත්‍රයි පාර්ශවීය හවුල්කාරීත්ව ගිවිසුම 2023 මාර්තු මාසයේ දී අත්සන් කරන ලදී.

තාක්ෂණික සහයෝගීතා වැඩසටහනෙහි අරමුණ ශ්‍රී ලංකාවේ වායු ගුණාත්මකභාවය හා සම්බන්ධ අධිකාරීන්ගේ ධාරිතාවයන් ශක්තිමත් කිරීමයි.



ව්‍යාපෘති කණ්ඩායම සමඟ ක්ෂේත්‍ර පරීක්ෂාව

විදේශ/දායකත්ව සහයෝගීතා සහිත ව්‍යාපෘති

ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම් අවම කිරීම (RLVMMP)


අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද ඒකාබද්ධ නායයෑම් අවම කිරීමේ වැඩසටහනේ ආරම්භය වන 'ස්ථායීකරණ ක්‍රමවේද මඟින් නායයෑම් අවදානම අවම කිරීම' (RLVMMP) ව්‍යාපෘතිය ජා. ගො. ප. සංවිධානය විසින් දියත් කරන ලදී. වසර 5ක් පුරා ක්‍රියාත්මක වන මෙම දැවැන්ත ව්‍යාපෘතියට හඳුනාගත් අධික අවදානමක් සහිත නායයෑම් ස්ථානයන් මෙන් ම මාර්ග ආශ්‍රිත අස්ථාවර බෑවුම්, කඳුකර දුම්රිය මාර්ග ආශ්‍රිත අස්ථාවර බෑවුම් අවම කිරීම් ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන සංරචකයන් වන්නේ:

- සිවිල් වැඩ සහ ආශ්‍රිත සැලසුම් හා ඉදිකිරීම් අධීක්ෂණ/කළමනාකරණ කටයුතු
- ප්‍රතිපත්ති සහ නියාමනයන් වැඩි දියුණු කිරීම
- ආයතනික ධාරිතාව ගොඩනැගීම
- තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය

මෙම දැවැන්ත ව්‍යාපෘතිය ක්‍රියාවට නැංවීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව (AIIB) අරමුදල් සපයනු ලබයි. ව්‍යාපෘති මූල්‍යකරණය 2022 ජූනි මාසයේ දී ඇ. ඩොලර් මිලියන 110.0 ක් ලෙස සඳහන් ව තිබූ අතර මෑතක දී සිදු කරන ලද සංශෝධනයන් අනුව, එය ඇ. ඩොලර් මිලියන 101.3 කි. ඒ අනුව, අවම කිරීම් ක්‍රියාත්මක කිරීමට නියමිත ව තිබූ ක්ෂේත්‍ර සංඛ්‍යාව 147 සිට 127 දක්වා සංශෝධනය කරන ලදී. පළාත්/දිස්ත්‍රික්ක වශයෙන් තෝරාගත් ක්ෂේත්‍ර වල සාරාංශය සහ ක්ෂේත්‍ර ස්ථානයන් හි සිතියම පහතින් දක්වා ඇත.

වගුව : අවම කිරීමේ ක්ෂේත්‍ර බෙදා හැරීම

පළාත	දිස්ත්‍රික්කය	ක්ෂේත්‍ර සංඛ්‍යාව
බස්නාහිර	කොළඹ	1
	ගම්පහ	1
	කළුතර	20
මධ්‍යම	මහනුවර	16
	මාතලේ	10
	නුවරඑළිය	7
දකුණ	ගාල්ල	2
	මාතර	6
වයඹ	කුරුණෑගල	4
ඌව	බදුල්ල	18
සබරගමුව	රත්නපුර	26
	කෑගල්ල	16
එකතුව		**127**



තෝරාගත් නායයෑම් අඩවි පිහිටීම් සිතියම

පළමු අදියරේ පැකේජ 06 (අවදානම් නායයෑම් ස්ථාන 24) සහ දෙවන අදියරේ පැකේජ 01 (නල්ලතන්නිය - හදිසි නායයෑම් ස්ථානය) සඳහා සිවිල් වැඩ කොන්ත්‍රාත්තු 100% අවසන් කර ඇත. එමෙන් ම දෙවන අදියරේ පැකේජ දහයක (10) (නායයෑම් ස්ථාන 51) මේ වන විට ප්‍රදානයන් සිදු කර ඇති ඉතිරි සිවිල් වැඩ කොන්ත්‍රාත්තු (නායයෑම් ස්ථාන 51) සඳහා ප්‍රසම්පාදන ක්‍රියාලිය සිදුවෙමින් පවතී. පළමු සහ දෙවන අදිරයන් හි වර්තමාන ප්‍රගතිය පහත වගු මඟින් දක්වා ඇත.

වගුව : පළමු අදියරෙහි ප්‍රගතිය - සංරචක 01

පැකේජය	ක්ෂේත්‍ර සංඛ්‍යාව	දිස්ත්‍රික්කය	තත්ත්වය
පැකේජය 01	04	රත්නපුර	සිවිල් වැඩ 100% අවසන්. පැකේජ 01 සහ පැකේජ 02 සඳහා දෝෂ වගකීම් කාලය සම්පූර්ණ කර ඇති අතර අවසන් භාරදීම සිදුවෙමින් පවතී. අනෙකුත් පැකේජයන් හි දෝෂ වගකීම් කාලය ක්‍රියාත්මක වෙමින් පවතී.
පැකේජය 02	07	රත්නපුර, කළුතර	
පැකේජය 03	02	මාතර	
පැකේජය 04A, 04B, 04C	11	කෑගල්ල, කුරුණෑගල, මහනුවර, ගම්පහ කොළඹ	

වගුව - දෙවන අදියරෙහි ප්‍රගතිය - සංචරක 01

පැකේජය	ක්ෂේත්‍ර සංඛ්‍යාව	දිස්ත්‍රික්කය	තත්ත්වය
පැකේජය 09	01	නුවරඑළිය	සිවිල් වැඩ 100% අවසන් කර ඇත.
පැකේජය 07 (Lot 1-6)	32	රත්නපුර, කළුතර, ගාල්ල, මාතර	ඉදිකිරීම් සිදුවෙමින් පවතී.
පැකේජය 05 (A-E)	25	මහනුවර, මාතලේ, කෑගල්ල, කුරුණෑගල නුවරඑළිය, කෑගල්ල, රත්නපුර, බදුල්ල, මාතර, ගාල්ල	05A, 05B, 05C සහ 05D ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතී.
පැකේජය 06 (A-F)	23	දුම්රිය මාර්ගය රඹුක්කන - බදුල්ල	ප්‍රසම්පාදන ක්‍රියාවලිය ක්‍රියාත්මක වේ.
පැකේජය 08 (Lot 1-3)	22	දුම්රිය මාර්ගය රඹුක්කන - බදුල්ල	කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා කැබිනට් අනුමැතිය බලාපොරොත්තුවෙන් සිටී.



නායයෑම් අවම කිරීම් සම්පූර්ණ කරන ලද ක්ෂේත්‍රය - ක්ෂේත්‍ර අංක 148 නල්ලතන්නිය (පැකේජ 09)



නායයෑම් අවම කිරීමේ සම්පූර්ණ කරන ලද ක්ෂේත්‍රය - ක්ෂේත්‍ර අංක 011- කෑගල්ල මඟහැර යෑමේ මාර්ගය (04C පැකේජය)

ශ්‍රී ලංකාව සඳහා ගොඩනැගිලි කේත සංග්‍රහයක් සැකසීම සහ ස්ථාපනය කිරීම

ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ දූපත් රාජ්‍යයක් වන අතර එහි ගොඩනගන ලද පරිසරය තුළ සැලකිය යුතු අභියෝග සමඟ ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ දූපත් රාජ්‍යයක් වන අතර එහි ගොඩනගන ලද පරිසරය තුළ සැලකිය යුතු අභියෝගවලට මුහුණ දෙමින් සිටින අතර, එහි ගොඩනැගිලිවලින් 80% කට වැඩි ප්‍රමාණයක් ඉංජිනේරු ම ය නොවන අතර ස්වභාවික විපත්වල දී අවදානමට ගොදුරු වීමේ හැකියාව සහිත වේ. ශ්‍රී ලංකාව ගංවතුර, නායයෑම්, සුළි කුණාටු, නියඟයන්, සුනාමි ආදී අවදානම් රාශියකට මුහුණ දෙමින් සිටී. ස්වභාවික විපත් මඟින් සිදුවන සාමාන්‍ය වාර්ෂික අහිමිවීම ඇ. ඩො. මිලියන 380ක් පමණ වන අතර, දේශගුණික ඇස්තමේන්තු අනුව, ප්‍රක්ෂේපණයන් සමඟ 2050 වන විට දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1.2ක අලාභයක් සිදු වීමේ හැකියාව පවතී.

මෙම දැවෙන ගැටලුවට විසඳුම් සෙවීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් 2016 වසරේ දී ජාතික ගොඩනැගිලි කේත සංග්‍රහයක් සකස් කිරීම සහ ස්ථාපිත කිරීම සඳහා වූ ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. 2019 අප්‍රේල් මාසයේ දී ජාතික ගොඩනැගිලි කේත සංග්‍රහයක් සකස් කිරීමේ යෝජනාව අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරන ලද අතර ජා. ගො. ප. සංවිධානය (NBRO), CIDA සහ නාගරික සංවර්ධනය අධිකාරිය (ඖ) වෙත නව කේත සංග්‍රහයට ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කෙරෙන අංග ඇතුළත් කිරීම සඳහා සහයෝගීව කටයුතු කිරීමට වගකීම පවරන ලදී.

මෙම ප්‍රයත්නයේ තීරණාත්මක පියවර වූයේ ගොඩනැගිලි නියාමන ධාරිතා තක්සේරුකරණය යි. මෙහිදී රටේ ගොඩනැගිලි නියාමන රාමුව වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශයන් සපයන ලද අතර ඒ තුළින් ඉදිකිරීම්වල ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ අවකාශ සැලසේ.

2023 වසරේ දී ලෝක බැංකුව ප්‍රධාන කාර්යයන් තුනක් යටතේ ව්‍යාපෘතිය සඳහා තාක්ෂණික සහාය ලබා දී ඇත.

- ශ්‍රී ලංකා ගොඩනැගිලි කේත සංග්‍රහයේ සං කල්පියකරණය
- ගොඩනැගිලි අනුමත කිරීමේ ක්‍රමවේදය සමාලෝචනය කිරීම
- ගොඩනැගිලි ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගේ ධාරිතා තක්සේරු කිරීම

මූලික පර්යේෂණයන්, ලිඛිත සමාලෝචනයන් සහ පාර්ශවකරුවන්ගේ උපදේශන ඇතුළත් මෙම කර්තව්‍යයන් 2023 වසර පුරා සිදු කරන ලදී. ජුනි මාසයේ දී පවත්වන ලද පාර්ශවකරුවනගේ උපදේශනය, ප්‍රධාන රාජ්‍ය ආයතන, ශාස්ත්‍රීය අංශය, වෘත්තීය ආයතන සහ දේශගුණික අංශයේ නියෝජිතයින් සමඟ සාකච්ඡා කිරීමේ පහසුව සලසන ලදී.



මූලික සොයා ගැනීම් වලංගු කිරීමේ වැඩමුළුව

පාර්ශවකරුවන්ගේ උපදේශනයෙන් පසුව, ගොඩනැගිලි කේත සංවර්ධනය, ගොඩනැගිලි පාලන ක්‍රියාවලි, ප්‍රතිසංස්කරණය සහ ධාරිතා ගොඩනැගීම් ඇතුළු විවිධ කාණ්ඩ හරහා විශ්ලේෂණය සහ නිර්දේශ සංවර්ධනය කරන ලදී.

2023 දෙසැම්බර් මාසයේ පවත්වන ලද වලංගුකරණ වැඩමුළුව ප්‍රධාන සංධිස්ථානයක් වූ අතර එහිදී පුළුල් පාර්ශවකරුවන් කණ්ඩායම් සහභාගිත්වයෙන් කේත තාක්ෂණික අවශ්‍යතා සැකසීම, කේත ලේඛන බෙදාහැරීම, සංවිධානය කිරීම, අනුමැතිය සහ බලාත්මක කිරීමේ ක්‍රියාවලීන් යාවත්කාලීන කිරීම මෙන් ම දැනුවත් කිරීම, පුහුණු කිරීම සහ ධාරිතා ගොඩනැගීමේ මූලපිරීම් සැලසුම් කිරීම යනාදිය පිළිබඳ සාකච්ඡාවල නිරත විය.

2023 දෙසැම්බර් වන විට ගොඩනැගිලි කේත සංග්‍රහයේ සංකල්පකරණ අදියර අවසන් වීමත් සමඟ ශ්‍රී ලංකා රජයේ මඟපෙන්වීම මත, ජා. ගො. ප. සංවිධානය (NBRO), ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය (CIDA), නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ සියලු අදාළ පාර්ශවකරුවන්ගේ සහයෝගීතාවයෙන් සැබෑ කේත සංවර්ධනය කිරීම ආරම්භ කිරීම මීළඟ අදියරට ඇතුළත් වේ. මෙය ශ්‍රී ලංකාවේ ගොඩනගන ලද පරිසරයේ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සහ ස්වභාවික උපද්‍රව හා සම්බන්ධ අවදානම් අවම කිරීම සඳහා කැපී පෙනෙන ඉදිරි ගමනක් සනිටුහන් කරයි.





මූලික සොයාගැනීම් වලංගු කිරීමේ වැඩමුළුව

2023 වසරේ USGS-NBRO නායයෑම් සහයෝගීතාවයන්

2023 වර්ෂයේ දී එක්සත් ජනපද භූවිද්‍යා සමීක්ෂණ ආයතනය (USGS) විසින් ජා. ගො. ප. සංවිධානයේ නිලධාරීන් සඳහා සංවිධානය කරන ලද දින 5ක වැඩමුළුවක් ඔක්තෝම්බර් මස 2 දින සිට 6 දක්වා සාර්ථක ව පවත්වන ලදී. මෙම වැඩමුළුවේ මූලික අවධානය යොමු වූයේ නායයෑම් අවදානම් සිතියම්කරණ ක්ෂේත්‍රයේ ජා. ගො. ප. සංවිධාන නිලධාරීන්ගේ විශේෂඥතාව ඉහළ නැංවීම යි. PISA සංවේදිතා ආකෘතිය සහ ලොජිස්ටික් ප්‍රගමන ශිල්පීය ක්‍රමවල යෙදීම, විශේෂයෙන් අතුළත් කරමින්, උසස් මෙවලම් හා ක්‍රමවේද භාවිතය සම්බන්ධ ව ප්‍රායෝග සැසිය සකස් වී තිබිණ.

වැඩමුළුව සාර්ථක ව අවසන් කිරීමෙන් පසුව, USGS සහ ජා. ගො. ප. සංවිධානය අතර සහයෝගිතා ව්‍යාපෘති පිළිබඳ ව සාකච්ඡා ආරම්භ කරන ලදී. මෙම සහයෝගිතා ප්‍රයත්නයන් ආයතන දෙක අතර දැනුම හා සම්පත් හුවමාරු කරගැනීමට පහසුකම් සලසමින් වැඩමුළුවේදී ලබාගත් නව දැනුව ප්‍රයෝජනයට ගැනීම අපේක්ෂා කෙරේ. එම සහයෝගිතා ව්‍යාපෘති නායයෑම් පර්යේෂණ සහ කළමනාකරණ පිළිවෙත් ඉදිරියට ගෙන යාමේ අවස්ථාවක් ලෙස සඳහන් කළ හැක.

ශ්‍රී ලංකාවේ වැසි-ප්‍රේරිත වේගවත් හා දිගු-ගමන් සහිත නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීමේ තාක්ෂණය සංවර්ධනය - SATREPS (JICA)

ජපාන විද්‍යා හා තාක්ෂණික නියෝජිතායතනය (JST) තිරසාර සංවර්ධනය සඳහා වූ විද්‍යා හා තාක්ෂණ පර්යේෂණ හවුල්කාරිත්වය (SATREPS) යටතේ ජාත්‍යන්තර නායයෑම් සම්මේලනය (ICL) සහ ජා. ගො. ප. සංවිධානය එක් ව 'වර්ෂා-ප්‍රේරිත වේගවත් සහ දිගු-ගමන් සහිත නායයෑම්වල ආපදා අවදානම අවම කිරීම' නැමති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබයි. මෙම පස් අවුරුදු ජපාන-ශ්‍රී ලංකා ඒකාබද්ධ ව්‍යාපෘතිය 2019 - 2023 කාලය තුළ ක්‍රියාත්මක වේ. මෙම ව්‍යාපෘතිය 2015 - 2025 ISDR-ICL සෙන්ඩායි හවුල්කාරිත්වය යටතේ ගෝලීය හවුල්කරුවන් හරහා වැසි-ප්‍රේරිත වේගවත් සහ දිගු ගමන් සහිත නායයෑම් මඟින් ඇතිවන ආපදා අවදානම අවම කිරීම සඳහාඋසස් තාක්ෂණය හඳුන්වා දීම සිදු කරයි. දේශීය සහ ජපාන සහයෝගීතා හා උපකාරක ආයතන කිහිපයක් මේ ව්‍යාපෘති කටයුතු සඳහා සහභාගී වේ.

පහත සඳහන් ප්‍රතිඵලයන්ට අදාළ කටයුතු ආරම්භ කර ඇත.

- අධික වර්ෂාපතනය සහ එහි ප්‍රතිඵලයක් ලෙස භූගත ජල පීඩනය වැඩි වීම පිළිබඳ 24 පැය පූර්ව අනාවැකි පළකිරීමේ තාක්ෂණය දියුණු කර ඇත. වැසි-ප්‍රේරිත වේගවත් දිගු ගමන් සහිත නායයෑම් ස්ථාන සහ ඒවා චලනය වන ප්‍රදේශයන් හඳුනා ගැනීමේ තාක්ෂණය සංවර්ධනය කර ඇත.
- කඳුකරයේ සහ ප්‍රාදේශීය නගර ආශ්‍රිත ව ජීවත් වන ප්‍රජාවන් වෙත ඵලදායී අවදානම් සන්නිවේදනය සඳහා තාක්ෂණය හා අවශ්‍ය උපකාරක ව්‍යුහයන් සංවර්ධනය කර ඇත.
- වැසි-ප්‍රේරිත වේගවත් දිගු-ගමන් සහිත නායයෑම් පිළිබඳ පූර්ව ඇඟවීමේ පද්ධතියක්, නියමු අධ්‍යයන ස්ථානවල ඒකාබද්ධ පර්යේෂණ මත පදනම් ව ඉහතින් සඳහන් කරන ලද තාක්ෂණයන් ඒකාබද්ධ කිරීම තුළින් සංවර්ධනය කර ඇත. මාර්ගෝපදේශ සහ අත් පොත් සහිත සංවර්ධිත පද්ධතිය ශ්‍රී ලංකාවේ අනෙකුත් ප්‍රදේශවල භාවිතය සඳහා සපයා ඇත.
- සංවර්ධිත තාක්ෂණයන් මහජනතාවගේ ආරක්ෂාව සහ අවදානමට ලක් විය හැකි ප්‍රජාවන්, නායයෑම් සහ ඒ ආශ්‍රිත උවදුරුවලින් ආරක්ෂා කිරීම සහතික කරනු ඇත.

නව ව්‍යාපෘති කාර්යාලය ශ්‍රී ලංකාවේ ජා. ගො. ප. සංවිධානයෙහි පිහිටුවා ඇති අතර ජා. ගො. ප. සංවිධානයෙහි විද්‍යාඥයින් දෙදෙනෙකු ආචාර්ය උපාධි සම්පූර්ණ කර ඇත. අනෙකුත් ආචාර්ය උපාධි සහ පශ්චාත් උපාධි සිසුන් මේ වන විටත්, ජපානයේ විශ්වවිද්‍යාලයන් හි අධ්‍යයන කටයුතු සිදු කරමින් සිටී. ධාරිතා සංවර්ධනය යටතේ අඛණ්ඩ වැඩි දියුණු කිරීම් සඳහා ජා. ගො. ප. සංවිධානයේ විද්‍යාඥයින් පස් දෙනෙකු සඳහා MSSG පුහුණුව සහ LS-Rapid පුහුණුව ජපානයේ දී ලබා දීම සිදු කර ඇත.
(Undrain Ring Shear Apparatus) ඇතුළු නවීන උපකරණ සහිත භූතාක්ෂණික ඉංජිනේරු අංශයේ විද්‍යාගාරය ශක්තිමත් කිරීම සඳහා උපකරණ ස්ථාපනය කර ඇත. ජා. ගො. ප. සංවිධානයේ (NBRO) සහ නායයෑම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනයේ (ICL) සහයෝගීතාවයෙන් නායයෑම් තාක්ෂණික සංසදය, 2023 අගෝස්තු මස 25 දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (Jasmine) ජැස්මින් ශාලාවේ දී සාර්ථක ව පවත්වන ලදී. මෙම වැදගත් අංගයන් ජපානයේ කීර්තිමත් විද්‍යාඥයින්ගෙන් මෙන් ම නායයෑම් සහ පූර්ව අනතුරු ඇඟයීම් පද්ධති පර්යේෂණ පිළිබඳ ජා. ගො. ප. සංවිධානයේ විද්‍යාඥයින්ගේ පූර්ණ දායකත්වයෙන් සිදු විය.



නායයෑම් තාක්ෂණික සංසදය - බණ්ඩාරණායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සම්මන්ත්‍රණ ශාලාව

SATREPS - RRLL ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකාවේ භූ කම්පන මාන ස්ථාපනය කිරීම

SATREPS වැටසටහන යටතේ වන 'වැසි-ප්‍රේරිත වේගවත් හා දිගු ගමන් සහිත නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් තාක්ෂණය සංවර්ධනය කිරීම' ව්‍යාපෘතියෙහි අංගයක් ලෙස භූ කම්පන මිණුම් උපකරණ, වර්ෂා මාපක සමඟ ඒකාබද්ධ ව රට පුරා හඳුනාගත් නායයෑම් ස්ථානයන් හි උපායමාර්ගික ව යොදවා ඇත. මෙම ස්ථාපනයන් හි මූලික පරමාර්ථය වන්නේ කලාපීය සහ ප්‍රාදේශීය භූ කම්පන ක්‍රියාකාරකම් අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම මෙන් ම එමඟින් නායයෑම් ආරම්භ වීමේ සහ සක්‍රිය වීමේ සම්බන්ධතාවන් තක්සේරු කිරීමේ පහසුකම් සැලසීමයි.

ආරම්භක වශයෙන් මහනුවර, අරණායක, අත්වැල්තොට සහ කළුගල වැනි ප්‍රධාන ප්‍රදේශයන් ආවරණය වන පරිදි ස්ථාපනයන් සිදු කිරීම සඳහා වඩාත් උචිත ස්ථානයන් හතරක් ඉතා ප්‍රවේශමෙන් තෝරාගැනීම සිදු කරන ලදී. ඉන් අනතුරු ව, අධීකෂණ ආවරණයන් පුළුල් කිරීමේ වැදගත්කම අවබෝධ කර ගනිමින්, කොත්මලේ සහ අරණායක යන ප්‍රදේශයන් හි අතිරේක ස්ථාපනයන් දෙකක් සිදු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ නායයෑම් අවදානම් සහිත විවිධ ප්‍රදේශයන් හරහා භූ කම්පන මාන පහලොවක් මේ වන විට උපායමාර්ගික ව ස්ථාපනය කර ඇත.





ස්ථාපනය කරන ලද භූකම්පනමානයන්



භූ කම්පන මිනුම් ස්ථාන

මෙම ස්ථාපනයන් වර්ෂාව නිසා ඇති වන නායයෑම් ආශ්‍රිත සංකීර්ණ කතිකාවන් පිළිබඳ අපගේ අවබෝධය වර්ධනය කිරීමේ තීරණාත්මක ඉදිරි පියවරක් නියෝජනය කරන අතර ඒ ආශ්‍රිත අවදානම් අවම කිරීම සහ අවදානමට ලක් විය හැකි ප්‍රජාවන් ආරක්ෂා කිරීම අරමුණු කරගත් පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධති සංවර්ධනයෙහි ලා අපගේ කැපවීම අවධාරණය කරයි. භූකම්පන දත්ත අඛණ්ඩ ව අධීක්ෂණය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින්, අපගේ අවදානම, පෙර සූදානම සහ ප්‍රතිචාර යාන්ත්‍රණයන් ශක්තිමත් කිරීමට අප උත්සාහ ගනිමින් සිටිමු. අවසාන වශයෙන් ජීවනෝපායන මාර්ගයන්ට සහ ජීවිතවලට ඇති වන බලපෑම් අවම කර ගැනීමට කටයුතු කරමු.

බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයෑම් අවදානම සහ දේශගුණික බලපෑම් මත සිදු වන හානි පිළිබඳ විමසා බැලීමේ සහයෝගීතා ව්‍යාපෘතිය

2023 වර්ෂයේ දී ජා. ගෝ. ප. සංවිධානය විසින් ශ්‍රී ලංකාවේ කෑගල්ල දිස්ත්‍රික්කයේ බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ නායයෑම් අවදානම, මිනිස් සංචලනයන් සහ දේශගුණික හේතූන් මත සිදු වන විපත් සහ නායයෑම් පිළිබඳ සංකීර්ණ ගතිකත්වයන් විමසා බැලීම අරමුණු කර ගනිමින් විස්තරාත්මක ව්‍යාපෘතියක් ‘SLYCAN’ ආයතනය සමඟ හවුල්කාරිත්වයෙන් ක්‍රියාත්මක කිරීම කෙරිණ. මෙම සහයෝගීතා මූලාරම්භය කලාපයේ විපත්වල, විශේෂයෙන් ම නායයෑම්වල ඉහළ සංඛ්‍යාතය සහ බරපතල කම හේතුවෙන් පැන නගින තියුණු අභියෝගයන්ට මුහුණ දීමේ මාර්ගයන් විමසා බැලීම සඳහා විය.

දිස්ත්‍රික්කය තුළ නැවත පදිංචි කිරීම, අධි අවදානම් පදිංචි වීම් සහ මධ්‍ය අවදානම් පදිංචි වීම් ඇතුළත් අන්‍ය ක්ෂේත්‍ර 3ක් උපායමාර්ගික ව තෝරා ගන්නා ලදී. ව්‍යාපෘතිය මඟින් පරිපූර්ණ දත්ත තක්සේරුවක් සිදු කරන ලද අතර ප්‍රාදේශීය සහ ජාතික මට්ටමේ පාර්ශවකරුවන් උපදේශනයන් සඳහා දායක විය. මෙම ක්‍රියාවලිය හරහා දේශගුණික අවදානම් හඳුනා ගනිමින්, පවතින ප්‍රජා ධාරිතාවන් ඇගැයීමට ලක් කරන ලද අතර, පාඩු සහ හානි වීම්වලට අනුවර්තනය වීමේ අන්තරයන් පිළිබඳ ව විමසා බැලීම සිදු විය.

මෙම අධ්‍යයනය අතීත සන්දර්භය තුළට ප්‍රවේශ වෙමින් නායයෑම් ඉතිහාසය සහ මානව සංචලනය අතර සම්බන්ධතා තහවුරු කරන අතර ම අවදානම ලක් විය හැකි ප්‍රජාවන් මුහුණ දෙන සමාජ-ආර්ථික ප්‍රතිවිපාක පිළිබිඹු කිරීම සිදු කරයි. මූලික සොයා ගැනීම් මඟින් විශේෂයෙන් සැළසුම් සහගත නැවත පදිංචි කිරීමේ සන්දර්භය තුළ ප්‍රජාවගේ අදහස් සලකා බැලීම ඉස්මතු කරයි. තව ද, ව්‍යාපෘතිය මඟින් ප්‍රධාන ජාතික හා ජාත්‍යන්තර රාමු සමඟ එහි ප්‍රයත්නයන් පෙළගස්වමින්, සක්‍රීය ප්‍රතිපත්ති අවකාශය විමසා බැලීම සිදු විය.

ලංකාව තුළ නායයෑම් අවදානම, මානව සංචනලය සහ දේශගුණය නිසා ඇතිවන විපත් හා හානි වීම් හේතුවෙන් මතුවන බහු විධ අභියෝග අවම කිරීම සඳහා සැලකිය යුතු අවබෝධයක් සහ උපායමාර්ගික බිහිකිරීම් සඳහා ජා. ගො. ප. සංවිධානය සහ SLYCAN Trust අතර මෙම සහයෝගීතා ප්‍රයත්නය තුළින් අවකාශ සැලසීම සිදු වේ. සොයාගැනීම් සහ මෙම ව්‍යාපෘතිය මඟින් ජනිතවන නිර්දේශයන් ප්‍රජාවන්ගේ ඔරොත්තු දීමේ හැකියාව සවිමත් කිරීම මෙන් ම, නායයෑම් අවදානම් ප්‍රදේශවල ඇති විය හැකි අවදානම අවම කිරීම අරමුණු කර ගත් ප්‍රතිපත්තීන් සහ ක්‍රියාමාර්ගයන් පෙන්නුම් කිරීම අපේක්ෂා කෙරේ.





බුලත්කොහුපිටිය නැවත පදිංචි කිරීම සහ අධි අවදානම් සහිත ස්ථානයන්

කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල පූර්ව මෝසම් දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා සීමා සහිත “ජාන තාක්ෂණ GTE” ආයතනය, ජා. ගො. ප. සංවිධානය සමඟ උපායමාර්ගික සහයෝගීතාවන්

ජා. ගො. ප. සංවිධානය විසින් ‘ජාන තාක්ෂණ GTE’ සමඟ හවුල්කාරී ව විස්තීරණ දැනුවත් කිරීමේ වැඩසටහන් කෑගල්ල සහ රත්නපුර දිස්ත්‍රික්කවල නායයෑම් හා ආපදා තර්ජනයන්ට ඔරොත්තු දීමේ හැකියාවන් වැඩි දියුණු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කිරීමට සම්බන්ධ විය.

සමාරම්භක වැඩසටහන 2023 සැප්. මස 26 දින කෑගල්ල දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ දී පවත්වන ලද අතර ඒ සඳහා ආසන්න වශයෙන් පුද්ගලයන් 80ක ගේ පමණ ක්‍රියාකාරී සහභාගීත්වය සනිටුහන් විය.

අනතුරු ව, රත්නපුර දිස්ත්‍රික් ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් 2023 ඔක්. මස 31 දින රත්නපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලීය ශ්‍රවණාගාරයේ දී 85 දෙනෙකුගේ පමණ සහභාගීත්වයෙන් දෙවන වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. මෙම වැඩසටහන්වල දී අනිවාර්ය අංගයක් ලෙස නායයෑම් අවදානම් පැතිකඩ, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ නායයෑම් අවදානම් තත්ත්ව වාර්තාව ඇතුළු ලෙජර පසුම්බි, ප්‍රා. ලේ. කොා. මට්ටමේ අවදානම් පැතිකඩ නිරාවරණ සිතියම් මෙන් ම, දත්ත සමුදායන් වැනි තීරණාත්මක බෙදාහැරීම් ප්‍රධාන බලධාරීන් සහ පාර්ශවකරුවන් වෙත විධිමත් ලෙස ඉදිරිපත් කිරීම සිදු විය.

හරිත හා තුලනාත්මක සංවර්ධනය තුළින් ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම සඳහා කැපවී සිටින නැගී එන සංවිධානයක් වන සී.ස. 'ජාන තාක්ෂණ GTE' මෙම වැඩසහන්වල සාර්තකත්වය සනිටුහන් කිරීමෙහි ලා විශාල කාර්යභාරයක් ඉටු කරන ලදී. ජා. ගො. ප. සංවිධානය සමඟ ඔවුන්ගේ ස්ථීර සහයෝගීතාව, ආපදා කළමනාකරණය සහ ප්‍රජා සවිබල ගැන්වීම් සඳහා ක්‍රියාශීලී කැපවීමක් පෙන්නුම් කරයි.



කෑගල්ල වැඩමුළුව සඳහා සහභාගීවූවන්



රත්නපුර වැඩමුළුව සඳහා සහභාගීවූවන්

ඉතාලියේ ප්ලොරන්ස් හි හයවන ලෝක නායයෑම් සංසදයේ ජා. ගො. ප. සංවිධාන සහභාගීත්වය

ලොව පුරා සිටින විද්‍යාඥයින්, ඉංජිනේරුවරුන්, වෘත්තිකයින්, ව්‍යාපාරයන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් ගෝලීය පරිමාණයෙන් නායයෑමේ අවදානම් අවම කිරීමේ ප්‍රගතිය බෙදා ගැනීම උදෙසා සෑම වසර 3ට වරක් ලෝක නායයෑම් සංසදය රැස්වීම සිදු කෙරේ.

6වන ලෝක නායයෑම් සංසදය 2023 නොවැ. 14 දින සිට ප්ලොරන්ස් හි පැවැත්විණ. එය නායයෑම් පිළිබඳ ජාත්‍යන්තර සම්මේලනය සහ යුනෙස්කෝ සභාපතීත්වය දරන ප්ලොරන්ස් විශ්වවිද්‍යාලීය භූ ජල විද්‍යාත්මක උපද්‍රවයන් වැළැක්වීමේ සහ තිරසාර කළමනාකරණය පිළිබඳ යුනෙස්කෝ සභාපතීත්වය දරන, එක්සත් ජාතීන්ගේ සංවිධාන 5ක (UNESCO, WMO, FAO, UNDRR, UNU) සහ ජාත්‍යන්තර විද්‍යාත්මක සංවිධාන 4ක (ISC, WFEO, IUGS, IUGG) සහයෝගීතාව ලබන නායයෑම් පිළිබඳ ජාත්‍යන්තර වැඩසටහන (IPL) සම සභාපතීත්වයෙන් පවත්වන ලදී.

රටවල් 60ට වැඩි ගණනක් නියෝජනය කරමින් 1100ට අධික සහභාගීත්වයෙන් යුක්ත ව දින 4ක් පුරා, සාමාන්‍ය පූර්ණ සැසි, සමාන්තර විද්‍යාත්මක සැසි, තාක්ෂණික ප්‍රදර්ශන වැඩමුළු සහ විවිධ පරිපූරක ක්‍රියාවන්ගෙන් සමන්විත ව සංසදය ක්‍රියාත්මක විය.

සංසදයේ ප්‍රධාන තේමාව වූයේ 2030 වන විට එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කර ගැනීමේ දී අනෙකුත් උපද්‍රවයන් අතර නායයෑමේ බලපෑම ආමන්ත්‍රණය කිරීමේ තීරණාත්මක කාර්යභාරය අවධාරණය කරමින් "තිරසාර සංවර්ධනය උදෙසා නායයෑම් විද්‍යාව" යන්න යි.

අධ්‍යක්ෂ ජනරාල්තුමා, ජෙෂ්ඨ විද්‍යාඥයින් සහ විද්‍යාඥයින් ඇතුළු පර්යේෂකයින් 14 දෙනෙකු ජා. ගො. ප. සංවිධානය නියෝජනය කරමින් ඔවුන්ගේ නව්‍ය පර්යේෂණයන් ඉදිරිපත් කළහ.

ලොව පුරා විද්‍යාඥයින්, පාර්ශවකරුවන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින්හට නායයෑම් විශ්ලේෂණය, ආපදා විමර්ශනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධ අදහස් හුවමාරු කරගැනීමට මෙන් ම, ඔවුන් අතර සම්බන්ධකම් ඇති කර ගැනීම සඳහා මෙය කදිම වේදිකාවක් විය. මෙම හමුව ජා. ගො. ප. සංවිධානය වෙත ගෝලීය පරිමාණයෙන් අනාගතයේ දී සැලකිය යුතු අවස්ථාවන් පිළිබඳ ව දැනුවත් වීමේ මහඟු අවස්ථාවක් විය.



6වන ලෝක නායයෑම් සංසදයේ ජා. ගො. ප. සංවිධාන කණ්ඩායම

ඔරොත්තු දෙන ප්‍රජාවන් ගොඩනැගීම සඳහා "MOBILISE 3.0" ඩිජිටල් මෙවලම් කට්ටලය

MOBILISE ව්‍යාපෘතිය ජා. ගො. ප. සංවිධානය සහ එක්සත් රාජධානියේ (UK) සල්ෆර්ඩ් විශ්වවිද්‍යාලයේ THINKlab ආයතනය අතර සහයෝගීතා ප්‍රයත්නයක් මෙන් ම, ආසියානු ආපදා සූදානම් කරන මධ්‍යස්ථානය (ADPC) හා ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වේ. මෙමඟින් ඩිජිටල් යටිතල පහසුකම් ශක්තිමත් කරමින් ආපදා අවදානම අවම කිරීම (DRR) සඳහා වන ක්‍රියාකාරකම් උදෙසා ශ්‍රී ලංකාවේ තාක්ෂණික හැකියාවන් ඉහළ නැංවීම කෙරෙහි කැපවීම සිදු කරයි.

2023 වසර පුරාවට MOBILISE ව්‍යාපෘතිය සැලකිය යුතු සංධිස්ථාන කිහිපයක් පසු කිරීමෙහි සමත් විය. එමඟින් ඩිජිටල් යෙදුම් 3ක් හඳුන්වා දීම සිදු විය. එනම්, 'බහු-උවදුරු පූර්ව අනතුරු ඇඟවීම් උපකරණ පුවරුව' (Multi-Hazard Early Warning Dashboard), 'මෙගා'(Megha) ජංගම යෙදුම සහ MOBILISE අවකාශය වේ. මෙම යෙදුම් නව්‍ය සහ ඔරොත්තු දෙන විසඳුම් සැපයීම සඳහා නිර්මාණය කර ඇති අතර, MOBILISE අවකාශය මේ වන විට, දත්ත ස්ථරයන් 888ක් සඳහා සත්කාරකත්වය සපයමින් හානි තක්සේරු කිරීම ඇතුළු ව විස්තීරණ අවස්ථාවන් විශ්ලේෂණයන් සක්‍රීය කරයි.

ව්‍යාපෘතියෙහි ප්‍රධාන ත ම ජයග්‍රහණයක් වන්නේ දේශීය ආපදාවලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම අරමුණු කරගත් නව්‍ය ක්‍රියාකාරකම්වල දේශීය පාර්ශවකරුවන් සාර්ථක ලෙස සම්බන්ධ වීම යි. ජංගම යෙදුම සඳහා පවත්වනු ලැබූ පුහුණු සැසි 14ක් ඇතුළු බොහෝ ආදර්ශන සහ පුහුණු සැසිවාරයන් මඟින් මෙය පහසු කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් ලෙස කළුතර දිස්ත්‍රික්කයේ 60% ට අධික නිලධාරීන් ප්‍රමාණයක් මූලික අදියරේ දී යෙදවුම බාගත කරගෙන ඇත. විශේෂයෙන් ම නායයෑම් පිළිබඳ පූර්ව අනතුරු ඇඟවීම් ජංගම යෙදුම හරහා ප්‍රචලිත කිරීමට ව්‍යාපෘතිය ප්‍රගතියක් අත් කර ගෙන ඇති අතර අනාගතයේ දී ගංවතුර පූර්ව අනතුරු ඇඟවීම් සඳහා ද මෙම සේවාව ව්‍යාප්ත කිරීමට සැලසුම් කර ඇත.

ඉදිරි දැක්ම අනුව, (Living Lab concept) MOBILISE ව්‍යාපෘතියෙහි කළුතරින් ආරම්භ කර ශ්‍රී ලංකාව පුරා ඔරොත්තු දෙන ප්‍රජාවන් බිහි කිරීම සඳහා තාක්ෂණික විසඳුම් සහ හවුල්කාරිත්වයන් ඉදිරියට ගෙන යාමේ ප්‍රධාන කාර්යභාරයක් ඉටු කිරීමේ සූදානමින් සිටී. 'Living Lab concept' නියමු අදියරේ දී පොදුවේ භාවිතා කළ හැකි දත්ත වේදිකාවක් නිර්මාණය කිරීමට, දේශීය අවදානම් විශ්ලේෂණය කිරීම සහ ප්‍රජා මූලික පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම සඳහා තාක්ෂණය ඵලදායී ලෙස භාවිත කිරීම පෙන්නුම් කර ඇත.

'Living Lab concept' හි අරමුණ වන්නේ දේශීය ඩිජිටල් වැඩසටහන් ප්‍රයෝජනයට ගැනීම සහ ඔරොත්තු දෙන ප්‍රජාවන්හට සහාය දැක්වීම සහ සහයෝගී, සාක්ෂි පදනම් කරගත්, තීරණ ගැනීම සඳහා බහු-උපද්‍රව පූර්ව අනතුරු ඇඟවීමේ උපකරණ පුවරුව, MOBILISE වේදිකාව සහ 'මෙඝා' (Megha) ජංගම යෙදුම වැනි විසඳුම් භාවිතයේ යෙදවීම යි. දිස්ත්‍රික්-ප්‍රදේශීය ලේකම් කාර්යාල සමඟ එක් ව ශ්‍රී ලංකාවේ සියලුම දිස්ත්‍රික්කවලට ඔරොත්තු දීමේ සැලසුම්, මාර්ගෝපදේශ සැපයීම සඳහා මානව ජනාවාසවල ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැගීම උදෙසා 'විශිෂ්ටත්වයේ මධ්‍යස්ථානය ලෙස තම සේවාව සලසමින් ජා. ගො. ප. සංවිධාන පරිශ්‍රයෙහි' ඔරොත්තු දීමේ සැලසුම් කිරීමේ කේන්ද්‍රස්ථානයක්' ස්ථාපනය කිරීමේ සැලසුම් ක්‍රියාත්මක වෙමින් පවතී.



කළුතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ස්ථාපිත 'Living Lab' පහසුකම්

ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රකාශනයන්

ජා. ගො. ප. සංවිධානයෙහි 13වන වාර්ෂික පර්යේෂණ සමුළුවෙහි - සමුළු ප්‍රකාශනය

ජා. ගො. ප. සංවිධානයෙහි 'වාර්ෂික පර්යේෂණ සමුළු ප්‍රකාශනය' නම්; වාර්ෂික ජා. ගො. ප. සංවිධාන පර්යේෂණ සමුළුවෙහි දී ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකාවන් සහ ශාස්ත්‍රීය අධ්‍යයන එකතුවකි. මෙම ප්‍රකාශනය තුළින් ගොඩනැගිලි සහ නිවාස ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නවතම පර්යේෂණ සහ වර්ධකයන් එළිදැක්වෙන අතර ව්‍යුහාත්මක ඉංජිනේරු විද්‍යාව, ද්‍රව්‍ය විද්‍යාව, ගොඩනැගිලි කේත සහ ප්‍රමිතීන් මෙන් ම ස්වභාවික උපද්‍රව සහ ආපදා අවදානම් කළමනාකරණ අති පුළුල් පරාසයක මාතෘකා ආවරණය කරයි. ජා. ගො. ප. සංවිධානයෙහි 13වන වාර්ෂික පර්යේෂණ සමුළු ක්‍රියාවලියේ දී මෙම ක්ෂේත්‍රයන් හි නවතම පර්යේෂණ සහ වර්ධකයන් නියෝජනය කරන සාරාංශයන් 36ක් අන්තර්ගත වේ.



ඉලෙක්ට්‍රොනික පුවත් පත්‍රිකා

2023 වසරේ දී ජා. ගො. ප. සංවිධානය විසින් ඉලෙක්ට්‍රොනික පුවත් ලිපි දෙකක් ප්‍රකාශයට පත් කර ඇත.






නායයෑම් අවදානම් කළමනාකරණය පිළිබඳ සමාජ මාධ්‍ය (Facebook, YouTube, Twitter සහ අනෙකුත්) හරහා නායයෑම් පිළිබඳ දැනුවත් කිරීම

ජා. ගොා. ප. සංවිධානය විසින් Facebook, twitter and WhatsApp වැනි සමාජ මාධ්‍ය හරහා 2023 මෝසම් දෙක ඉලක්ක කර ගනිමින් ආපදා පෙර සූදානම පිළිබඳ ව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් කිපයක් දියත් කරන ලදී. ජා. ගොා. ප. සංවිධානය සහ WFP අතර තාක්ෂණික සහයෝගීතාව යටතේ දැනුවත් කිරීමේ ද්‍රව්‍ය සංවර්ධනය කිරීම සිදු කරන ලදී.









තාක්ෂණික සහයෝගීතාවය යටතේ NBRO සහ WFP විසින් සංවර්ධනය කරන ලද දැනුවත් කිරීම්

PRESIDENT'S AWARDS FOR SCIENTIFIC RESEARCH

organised by
National Research Council Sri Lanka



Aiming to build a vibrant scientific and technological community in the country, the National Research Council has designed and implemented the NRC President's Awards since 1999. It recognizes a distinguished piece of Sri Lankan research and bestowing awards from the President of Sri Lanka, as a national honor to efforts of our scientists. This felicitates the authors and inventors of publications and patents of years 2019 and 2020.

The President's Awards for Scientific Research (PASR) for publication years 2019 and 2020 was held on the 21st November 2023 at the Sirimavo Bandaranaike Memorial Exposition Centre of the BMICH, Colombo 07.

Eng. (Dr.) Asiri Karunawardena, the Director General of the National Building Research Organisation and Mr. R. M. S. Bandara, Project Director, RLVMMP and Mr. H. D. S. Premasiri, Director, Environmental Studies and Services Division received President's Awards for three separate Scientific publications for years 2019 and 2020, organized by the National Research Council (NRC).

The awards were presented for following research publications

1. Khang Dang, Kyoji Sassa, Kazuo Konagai, **Asiri Karunawardena, R. M. S. Bandara**, Kiyoharu Hirota, Qinwen Tan, Nguyen Duc Ha (2019), Recent rainfall-induced rapid and long-travelling landslide on 17 May 2016 in Aranayaka, Kegalle District, Sri Lanka Landslides, Vol 16,pp 155-164

2. Qinwen Tan, Kyoji Sassa, Khang Dang, Kazuo Konagai, **Asiri Karunawardena, R. M. S. Bandara**, Huiming Tang, Go Sato (2020) Estimation of the past and future landslide hazards in the neighboring slopes in the 2016 Aranayake Landslide, Sri Lanka Landslides, Vol 17, pp 1727-1738

3. Mahesh Jayaweera, Buddhika Gunawardana, Manju Gunawardana, **Asiri Karunawardena**, Viraj Dias, **Sarath Premasiri**, Janith Dissanayake, Jagath Manatunge, Nimal Wijeratne, Dhananjith Karunarathne, Saman Thilakasiri (2019) Management of municipal solid waste open dumps immediately after the collapse: An integrated approach from Meethotamulla open dump, Sri Lanka Waste management, Vol 95, pp 227-240.

පුහුණු වැඩසටහන්වල සම්මන්ත්‍රණය සහ වැඩමුළු

ජා. ගො. ප. සංවිධාන පුහුණු සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් යටතේ 2023 වසර තුළ පහත ක්‍රියාකාරකම් සිදු කර ඇත.

ජා. ගො. ප. සංවිධානය විසින් TECHNO 2023 ප්‍රදර්ශනයේදී ප්‍රවීණතා සහ නවෝත්පාදන ප්‍රදර්ශනය කරයි

ජා. ගො. ප. සංවිධානය විසින් TECHNO 2023 ප්‍රදර්ශනයේ දී සිය විවිධ හැකියාවන් සහ අති නවීන පර්යේෂණ සඳහා කැපවීම ප්‍රදර්ශනය කරන ලදී. 2023 සැප්තැම්බර් මස 20 සිට 22 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ (BMICH) පවත්වන ලද මෙම ප්‍රදර්ශනය ජා. ගො. ප. සංවිධානය වෙත පුළුල් ප්‍රේක්ෂක පිරිසක් සමඟ සම්බන්ධ වීමට සහ සිය බහුවිධ විශේෂඥතාවන් පිළිඹිඹු කිරීමෙහි ලා ප්‍රමුඛ අවස්ථාක් හිමි විය.

ජා. ගො. ප. සංවිධානයෙහි ප්‍රදර්ශන කුටියට පැමිණි ප්‍රේක්ෂකයින්හට ගැඹුරු අධ්‍යාපනික අත්දැකීමක් ලබා දෙන ලද අතර, සංවිධානයෙහි පුළුල් පරාසයක නිපුණතාවන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමේ අවකාශ හිමිවිය. මානව ජනාවාස සැලසුම් සහ පුහුණු කිරීම්වල සිට නායයෑම් පර්යේෂ සහ අවදානම් කළමනාකරණය, ව්‍යුහාත්මක ඉංජිනේරු පර්යේෂණ සහ ව්‍යාපෘති කළමනාකරණය, ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම් හා පර්යේෂණ, භූ තාක්ෂණික ඉංජිනේරු මෙන් ම පාරිසරික අධ්‍යයන සහ සේවා ක්ෂේත්‍ර හරහා ජා. ගො. ප. සංවිධානය සිය විවිධ පර්යේෂණ සහ සංවර්ධන ප්‍රවීනත්වයන් මෙහිදී ප්‍රදර්ශනය කරන ලදී.





TECHNO 2023 ප්‍රදර්ශනයෙහි ජා. ගො. ප. සංවිධාන කුටිය

ජා. ගෙ. ප. සංවිධානය තම තාක්ෂණික දියුණුව ප්‍රදර්ශනය කිරීමෙන් ඔබ්බට යමින් අර්ථවත් අන්තර් ක්‍රියාකාරකම් සහ දැනුම හුවමාරු කරගැනීම සඳහා වේදිකාවක් ලෙස TECHNO 2023 ප්‍රදර්ශනය යොදා ගන්නා ලදී. කර්මාන්ත වෘත්තිකයන්, පර්යේෂකයන් සහ පාර්ශවකරුවන් ඵලදායී සාකච්ඡාවන් හි නිරත වූ අතර සහයෝගීතා අවස්ථා තවදුරටත් වර්ධනය කරගැනීම සහ අනාගත හවුල්කාරිත්වයන් සඳහා මංපෙත් හෙළිකර ගැනීම සිදු විය.

TECHNO 2023 හි ජා. ගෙ. ප. සංවිධාන සහභාගීත්වය ඉංජිනේරු භූ ප්‍රදර්ශනය හැඩගැන්වීමේ තම ප්‍රධාන භූමිකාව නැවත තහවුරු කිරීම පමණක් නොව, පාරිසරික තිරසරභව සහ ඔරොත්තු දෙන මානව ජනාවාස සඳහා සිය කැපවීම ඉස්මතු කිරීමට සමත් විය.





TECHNO 2023 ප්‍රදර්ශනයෙහි ජා. ගෙ. ප. සංවිධාන කුටිය

නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨයේ සිවිල් ඉංජිනේරු කාර්මික ශිල්පීන් ජා. ගෙ. ප. සංවිධානයෙහි පාරිසරික සහ අධ්‍යාපනික චාරිකාවක නිරතවීම

2023 මැයි 11 දින ත්‍රිකුණාමලයේ නාවික සහ සමුද්‍රීය විද්‍යාපීඨයේ සුළු නිලධාරී සුදුසුකම් ලැබීමේ පාඨමාලාවට බඳවාගන්නා ලද නිලධාරීන් සහ නාවිකයින් පිරිසක් ජා. ගෙ. ප. සංවිධානයෙහි අධ්‍යාපනික චාරිකාවක් ආරම්භ කරන ලදී. ඔවුන්ගේ චාරිකාවෙහි අරමුණ වූයේ ජා. ගෙ. ප. සංවිධානය තුළ පවතින විවිධ අංශයන් පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම යි.

සහභාගීවූවන්ට මුළින් ම ආපදා අවදානම අවමකිරීමෙහි (DRR) ජා. ගෙ. ප. සංවිධාන භූමිකාව පිළිබඳ ව දේශන කිහිපයක් සඳහා අවස්ථාව සලසන ලදී. සංවිධානයේ ඉතිහාසය, එහි අධිකාරිය සහ විවිධ වැඩසටහන් මෙන් ම ව්‍යාපෘති පිළිබඳ ව ද ඔවුන් දැනුවත් කරන ලදී. ආපදා අවදානම අවම කිරීමෙහි (DRR) වැදගත්කම මෙන් ම වඩාත් ඔරොත්තු දෙන ශ්‍රී ලංකාවක් ගොඩනැගීම උදෙසා ජා. ගෙ. ප. සංවිධානය විසින් ඉටු කරනු ලබන කාර්යභාරය පිළිබඳ ව ද ඔවුන් දැනුවත් විය. මෙම චාරිකාව තුළ දී ගොඩනැගිලි ද්‍රව්‍ය සහ පරීක්ෂා කිරීම් පරීක්ෂණාගාරය; භූ තාක්ෂණික ඉංජිනේරු විද්‍යාගාරය, පරිසර අධ්‍යයන සහ සේවා පරීක්ෂණාගාරය ඇතුළු ජා. ගෙ. ප. සංවිධායෙහි නවීන ත ම ජාත්‍යන්තර ප්‍රමිති ආයතන (ISO) ප්‍රතීතන පරීක්ෂණාගාර ගවේෂණය කිරීම සඳහා සහභාගිවූවන්හට සුවිශේෂී අවස්ථාවක් හිමි විය. මෙම ප්‍රායෝගික අත්දැකීම් ජා. ගෙ. ප. සංවිධානය විසින් සපයනු ලබන සුවිශේෂී පරීක්ෂණාගාර සේවාවන් සියැසින් දැක ගැනීමට ඔවුන්ට අවස්ථාව හිමි විය





වැඩමුළුවල දී ජා ගො ප සංවිධානයේ නිලධාරීන්ගේ ඉදිරිපත් කිරීම්

විද්‍යාත්මක ලේඛන සහ ප්‍රකාශනයන් පිළිබඳ වැඩමුළුව

ජා. ගො. ප. සංවිධානය සත්කාරක දායකත්වයෙන් ආපදා අවදානම් සහ ඒ ආශ්‍රිත විෂයයන් පිළිබඳ පර්යේෂකයන් සඳහා විද්‍යාත්මක ලේඛන සහ ප්‍රකාශනයන් පිළිබඳ අවධානය යොමු කරන වැඩමුළුමක් පවත්වන ලදී. මෙම වැඩමුළුව එක්සත් රාජධානියේ හඩර්ෆිල්ඩ් විශ්වවිද්‍යාලයේ මහාචාර්ය ඩිලන්ති අමරතුංග සහ මහාචාර්ය රිචඩ් හේ (Richard Haigh) විසින් මෙහෙයවන ලදී. ගොඩනගන ලද පරිසරයේ ආපදා ඔරොත්තු දීමේ ජාත්‍යන්තර සඟරාවේ ගෞරවනීය සංස්කාරවරුන් විසින් වැඩමුළුව තුළ ප්‍රකාශන ක්‍රියාවලියේ ප්‍රධාන අංගයන් ආවරණය කරන ලදී.

මෙම වැඩමුළුව සඳහා එම අවස්ථාවේ දී පෞද්ගලික ව සහභාගී වූ විද්‍යාඥයින් 40 දෙනෙකුගේ පමණ උද්යෝගිමත් සහභාගීත්වයක් දක්නට ලැබිණි. මීට අමතර ව, hybrid ආකාර ඉසව්වක් නිර්මාණය කරමින් අන්තර්ජාලය හරහා පැවැත්වූ වැඩමුළුව සඳහා තවත් 30 දෙනෙකු පමණ වූ විද්‍යාඥයින් පිරිසක් වැඩමුළුව සඳහා සක්‍රිය ව සම්බන්ධ විය. එය භෞතික හා මාර්ගගත යන දෙයාකාර සම්බන්ධ වීමකි. පර්යේෂණ ප්‍රකාශයට පත් කිරීම වගකීමක් පමණක් නොව, එයින් අධ්‍යයන ප්‍රජාවට දැනුමින් දායක වීමට අවස්ථාවක් ලැබෙන බවත්, එහි වැදගත් කමක් පිළිබඳ ව සහභාගීවූවන් දැනුවත් කෙරිණ. මෙම වැඩමුළුව තුළ දී උචිත සඟරා තෝරා ගැනීම, සුසංයෝගී ලේඛන දර්ශකයක් සැකසීම සහ සදාචාරාත්මක ප්‍රකාශන පිළිවෙත් පිළිබඳ ව අගනා අවබෝධයක් ලබා දීම සිදු විය. මෙම අංගයේ සහයෝගීතා අවකාශය තුළින් පර්යේෂකයින්හට අන්තර් ක්‍රියාකාරී සාකච්ඡාවල නිරත වීම සඳහා ඉඩහසර සලසන ලද අතර ලොව පුරා ආපදා ඔරොත්තු දීමේ ක්ෂේත්‍රයේ ධනාත්මක වෙනසක් වර්ධනය කරමින් ඔවුන්ගේ පර්යේෂණ සොයාගැනීම් ඵලදායී ලෙස සන්නිවේදන කිරීම පිණිස අවශ්‍ය මෙවලම්වලින් සන්නද්ධ කිරීම සිදු විය.





විද්‍යාත්මක ලේඛන පිළිබඳ වැඩමුළුව අතරතුර

ජා. ගො. ප. සංවිධානය පාසල් ප්‍රදර්ශනයකට සහභාගී වීම

අතුරුගිරිය බප/ජය මහාමාත්‍ය විද්‍යාලයේ තාක්ෂණික සංගමය විසින් 2023 ඔක්. 26 දින පාසල් පරිශ්‍රයේ දී අධ්‍යාපනික ප්‍රදර්ශනයක් පවත්වන ලදී. මෙම අවස්ථාවට ඉංජිනේරු තාක්ෂණය, තාක්ෂණය සඳහා විද්‍යාව, භූගෝල විද්‍යාව මෙන් ම තවත් බොහෝ විෂය ක්ෂේත්‍රයන් වෙනුවෙන් වෙන් වූ ප්‍රදර්ශන කුටි ඇතුළත් විය.

ප්‍රදර්ශකයින් අතුරෙන් ජා. ගො. ප. සංවිධානය තම ප්‍රමුඛස්ථානය ඉස්මතු කර ගනිමින් නායයෑම්, ඔරොත්තු දෙන ඉදිකිරීම්, ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂා කිරීම සහ පාරිසරික අධීක්ෂණයන් ආශ්‍රිත පරීක්ෂණ සම්බන්ධ වැදගත් තොරතුරු ප්‍රදර්ශනය කිරීම සිදු විය.

ජා. ගො. ප. සංවිධානය ප්‍රදර්ශනය තුළින් තම වපසරිය තුළ සංවිධානයේ විශේෂඥතාව සහ දායකත්වය පිළිබඳ අගනා අවබෝධයක් ලබා දීමට කටයුතු කරන ලදී. සිසුන්ට, අධ්‍යාපනඥයින්ට මෙන්ම අමුත්තන්හට ජා. ගො. ප. සංවිධානයේ නියෝජිතයන් සමඟ සම්බන්ධ වෙමින් සහ ක්ෂේත්‍රයේ භාවිතවන තාක්ෂණයන් සහ ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් වීමේ අවස්ථාව හිමි විය.

මෙම අධ්‍යාපනික මූලාරම්භය සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි දායකත්වය දැනුම ව්‍යාප්ත කිරීම උදෙසා වූ සිය කැපවීම ශක්තිමත් කිරීමක් පමණක් නොව, නායයෑම් සහ පාරිසරික පරීක්ෂණයන් වැනි තීරණාත්මක අංශයන් හි වටිනා තොරතුරු වෙත ප්‍රවේශ වීමේ අවකාශ අමුත්තන් වෙත සලස්වන ලදී.



තාක්ෂණික සමාජ ප්‍රදර්ශනයේ ජා. ගො. ප. සංවිධාන කුටිය

ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ ප්‍රථම ප්‍රතිචාර අභ්‍යාසලාභීන් නායයෑම් අවදානම කළමනාකරණ සහ පර්යේෂණාගාර සේවා පිළිබඳ අත්දැකීම් ලබා ගැනීම පිණිස ජා. ගො. ප. සංවිධානය වෙත පැමිණීම

2023 ඔක්. 25 දින ශ්‍රී ලංකාවේ ගුවන් හමුදාවේ ‘අංක 34 ආපදා කළමනාකරණය සහ ප්‍රතිචාර මූලික පාඨමාලාවේ’ අභ්‍යාසලාභීන් සහ උපදේශකයින් පිරිසක් ජා. ගො. ප. සංවිධානය වෙත පැමිණීම සිදු විය. මෙම සංචාරයේ දී ආපදා අවදානම අවම කිරීම (DRR) සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි මැදිහත් වීම පිළිබඳ ව පැහැදිලි කිරීම් මෙන් ම ආපදා අවස්ථාවන් හි දී ප්‍රථම ප්‍රතිචාර පිළිබඳ අත්දැකීම් බෙදා ගැනීමේ සැසිවාරයක් පැවැත්වීම ද සිදු විය.

අභ්‍යාසලාභීන්හට ජා. ගො. ප. සංවිධානයෙහි නවතම ISO ප්‍රතිතන පරීක්ෂණාගාරයක් වන පාරිසරික අධ්‍යයන හා සේවා පරීක්ෂණාගාරය, ගොඩනැගිලි ද්‍රව්‍ය පර්යේෂණ සහ පරීක්ෂා කිරීමේ විද්‍යාගාරය, භූ තාක්ෂණ ඉංජිනේරු පර්යේෂණාගාරය, භූගෝලීය සහ බුද්ධි විද්‍යාගාරයක් මගින් සපයන සේවාවන් පිළිබඳ ව ද වටිනා අවබෝධයක් ලබා ගැනීමේ අවස්ථාවක් හිමි විය.






ජා. ගො. ප. සංවිධානයෙහි පරීක්ෂණාගාර අත්දැකීම් ලබා ගැනීම

විගණනය සහ කළමනාකරණ කමිටු වාර්තාව

2023 වසර සඳහා ජා. ගො. ප. සංවිධානයේ විගණන සහ කළමනාකරණ කමිටු වාර්තාව

2023 දෙසැ. 31 දිනට ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ (ජා. ගො. ප. සංවිධානය) විගණන සහ කළමනාකරණ කමිටුවේ (AMC) සංයුතිය පහත සඳහන් පරිදි වේ.

අංකය	නම, තනතුර සහ ආයතනය	කමිටුවේ දරන තනතුර
01	එස්. ජාලතීපන් මිය, අධ්‍යක්ෂ මූදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව	සභාපති
02	ඒ. කේ. කරුණානායක මයා, අධ්‍යක්ෂ ජනරාල්, කාළගුණ විද්‍යා දෙපාර්තමේන්තුව	කමිටු සාමාජික
03	එච්. යූ. ආර්. ෆොන්සේකා මයා, ප්‍රධාන ගණකාධිකාරී, ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය	කමිටු සාමාජික
04	ජේ. ඒ. ඩබ්. කේ. ජයකොඩි මිය, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ආපදා කළමනාකරණ අංශය, ආරක්ෂක අමාත්‍යාංශය	නිරීක්ෂක
05	එල්. බී. ජී. සඳමාලි මිය, විගණන අධිකාරී, ජාතික විගණන කාර්යාලය	නිරීක්ෂක

ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන ලද විගණන විමසුම පිළිබඳ ව ජා. ගො. ප. සංවිධානයෙහි අභ්‍යන්තර විගණන ඒකකයෙහි (Internal Audit Unit) නිරීක්ෂණයන් විගණන කළමනාකරණ කමිටු රැස්වීම්වල දී සාකච්ඡා කරන ලදී. විශේෂයෙන් ම සංවිධානයෙහි අභ්‍යන්තර විගණන ඒකකය විසින් 2023 වර්ෂය සඳහා සකස් කරන ලද වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම තව දුරටත් සමාලෝචනය කරන ලද අතර සංවිධානයෙහි මෙහෙයුම්, පාලනය සහ අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් විගණන නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කරන ලදී. විගණන කළමනාකරණ කමිටුව විසින් මෙම විගණන නිරීක්ෂණයන් වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කර ඇත. ඒ අනුව, මූල්‍ය රෙගුලාසි 133 සහ 134 හි දක්වා ඇති භූමිකාවන්, කළමනාකරණ සහ විගණන දෙපාර්තමේන්තුවේ, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවෙහි, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති පිළිබඳ චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් පරිදි සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධානයන් සංවිධානයෙහි අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ජා. ගො. ප. සංවිධානයෙහි කළමනාකරණයට මඟපෙන්වීම පිණිස විගණන කළමනාකරණ කමිටුවේ දී සැලකිල්ලට ගෙන ඇත. විගණන විමසුම සහ වාර්තාවල විගණන සහ කළමනාකරණ කමිටුවෙහි පරීක්ෂණ සහ නිර්දේශ මත සංවිධානය විසින් සිදු කරන ලද නිවැරදි කිරීම් හා නිර්දේශයන් හි ප්‍රමාණාත්මක මෙන් ම ගුණාත්මකභාවය ද පරීක්ෂා කරන ලදී.

2023 වසරේ දී විගණන සහ කළමනාකරණ කමිටු රැස්වීම් හතරක් පවත්වා ඇති අතර, අභ්‍යන්තර පාලන පද්ධති නිසි හා නිවැරදි ලෙස පවත්වා ගෙන යාමට අවශ්‍ය මඟපෙන්වීම් ලබා දෙන ලෙස කමිටුව විසින් කළමනාකාරීත්වයට උපදෙස් ලබා දී ඇත.

විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

LKR

	ඇමුණුම් අංක	2023.12.31 දිනට		2022.12.31 දිනට
ජංගම වත්කම්				
මුදල් හා ඒ ආශ්‍රිත වත්කම්	1		59,593,612	14,641,682
ලැබිය යුතු ණයගැතියන්	2	113,408,556		190,290,744
විවිධ ලැබීම්	3	43,546,053	156,954,609	24,982,172
			216,548,221	**229,914,598**
බඩු තොග	4		28,029,316	4,575,467
කාර්යමණ්ඩලයෙන් ලැබිය යුතු	5		57,027,968	73,827,278
පෙර ගෙවීම්	6		17,892,008	31,290,393
අනෙකුත් ජංගම වත්කම්				
ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති	7	99,307,574		69,984,069
කාලීන නැක්පතු	8	751,212,055	850,763,628	592,710,492
ජංගම නොවන වත්කම්			**1,170,017,141**	**1,002,302,296**
යටිතල පහසුකම්, යන්ත්‍ර හා උපකරණ	9	338,247,547		150,971,425
ඉඩම් සහ ගොඩනැගිලි	9	54,520,404		53,506,140
අස්පෘශ්‍ය වත්කම්	9	20,737,239		4,201,850
බදු ඉඩම්	9	7,965,000		7,965,000
ඉදිවෙමින් පවතින නව පර්යේෂණාගාර ගොඩනැගිල්ල		735,171,684		648,610,080
ඉදිවෙමින් පවතින කුඩා පර්යේෂණාගාරයන්		1,380,000	1,158,021,873	1,380,000
මුළු වත්කම්			**2,328,149,016**	**1,868,936,789**
වගකීම්				
ජංගම වගකීම්				
පියවිය යුතු ගෙවීම් සේවාදායකයන්ගෙන් ලද අත්තිකාරම්	10	379,533,198		295,853,607
විවිධ ගෙවීම්	11	169,575,835	549,109,034	129,789,852
ජංගම නොවන වගකීම්				
දීර්ඝ කාලීන ප්‍රතිපාදන				
පාරිතෝෂික වෙන්කිරීම්	12	81,356,254	81,356,254	86,940,688
මුළු වගකීම්			**630,465,288**	**512,584,148**
ශුද්ධ වත්කම්			**1,697,683,727**	**1,356,352,641**
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය				
රජයේ සහ වෙනත් ආයතනවලින් දායක කරන ලද ප්‍රාග්ධනය	13	589,982,586		589,982,586
වෙන්කිරීම් –අතිරික්තය නැවත ගණනය		122,657,548		27,875,989
			712,640,134	
සමුච්චිත අතිරික්තය/ (ඌනතාව)				
ඉදිරියටගෙන ආ අතිරික්තය	14		749,664,033	471,508,338
වර්ෂය සඳහා අතිරික්තය			235,379,561	266,985,728
ශුද්ධ වත්කම් / ප්‍රාග්ධනය			**1,697,683,727**	**1,356,352,642**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන්වූ වසර සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අදායම	ඇමුණුම	2023 වසර	2023 අයවැය	2022 වසර
පාරිසරික අධ්‍යයන සහ සේවා අංශය	15	63,326,050	65,600,000	55,843,122
භූ තාක්ෂණික ඉංජිනේරු සහ පරීක්ෂණ අංශය	16	226,450,351	294,000,000	252,180,913
නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ අංශය	17	208,493,060	214,000,000	248,413,086
මානව ජනාවාස සැලසුම් සහ පුහුණු අංශය	18	44,675,761	252,200,000	46,763,750
ගොඩනැගිලි ද්‍රව්‍ය හා පරීක්ෂණ අංශය	19	45,752,750	47,950,000	40,157,465
ව්‍යාපෘති කළමනාකරණ අංශය	20	68,091,580	149,800,000	159,768,826
සම්පූර්ණ මෙහෙයුම් ආදායම		**656,789,552**	**1,023,550,000**	**803,127,162**
වෙනත් ආදායම්	21	137,043,311	60,000,000	90,920,313
මුළු ආදායම		**793,832,863**	**1,083,550,000**	**894,047,475**
අඩුකළා - වියදම්				
වැටුප්, පඩිනඩි හා සේවක ප්‍රතිලාභ	22	356,286,366	425,747,000	437,423,552
භාවිත කරන සැපයුම් සහ පරිභෝජන	23	206,598,762	520,123,000	241,709,502
ක්ෂය වීම	24	35,862,471	80,300,002	59,156,349
දේපළ ඌනතා, පිරියත සහ උපකරණ	25	27,019,323	29,149,200	20,875,246
වෙනත් වියදම්	26	20,956,938	27,397,000	22,259,111
මූල්‍ය පිරිවැය	27	184,734	36,000	75,833
මුළු වියදම		**646,908,594**	**1,082,752,202**	**781,499,593**
බදුවලට පෙර ශුද්ධ ලාභය		146,924,269	797,798	112,547,882
ආදායම් බදු			-	9,000,000
ඒකාබද්ධ අරමුදල සඳහා බද්ද		44,077,281		
බදු අයකිරීමෙන් පසු ශුද්ධ ක්‍රියාකාරී ලාභය		**102,846,988**	**797,798**	**103,547,882**
විනිමය නොවන ආදායම	28	207,196,487	10,000,000	178,504,297
අඩුකළා: ප්‍රධාන වත්කම් සඳහා ක්ෂය සහ පරිභෝජන ද්‍රව්‍ය	24	74,663,914	6,000,000	15,066,452
වසර සඳහා මුළු අතිරික්ත		**235,379,561**	**4,797,798**	**266,985,727**

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

රු.

	2023	2022
අතිරික්තය / (හිඟය)	**235,379,561**	**266,985,728**
ගැලපුම්		
ක්ෂයවීම්	76,540,986	74,222,800
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	9,822,587	15,863,377
පාරිතෝෂික ගෙවීම	(15,407,021)	(13,621,058)
අඩු/වැඩි ණය ගැනියන් සඳහා ප්‍රතිපාදන	(131,814)	(264,760)
අඩු/වැඩි ආදායම් බදු ගෙවීම සඳහා ප්‍රතිපාදන	(385,301)	
අඩු/වැඩි ඒකාබද්ධ අරමුදල සඳහා ගෙවීම් ප්‍රතිපාදන	(31,064,365)	
ස්ථාවර වත්කම් බැහැර කිරීම		(299,299.06)
නුවමාරු නොකළ ආදායම	(207,196,487)	(178,504,297)
බැර නොවූ පොලී අදායම	(32,971,196)	(24,021,439)
ක්‍රියාකාරී ප්‍රාග්ධන වෙනස්කම් සිදු කිරීමට පෙර මෙහෙයුම් අතිරික්තය (හිඟය)	**34,586,950**	**140,361,053**
ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වෙනස්වීම්		
ලැබිය යුතු මුදල් වර්ධනය	(4,179,027)	-156,696,278
කාර්යමණ්ඩලයෙන් ලැබීම් වර්ධනය	16,799,310	16,417,775
පූර්ව ගෙවීම වර්ධනය	13,398,385	29,392,230
බඩු තොග වර්ධනය	(23,453,850)	(236,383)
ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ වර්ධනය	(20,752,184)	113,793,763
තැන්පත් වර්ධනය	(158,501,563)	(149,089,328)
සේවාදායකයන්ගෙන් ලැබුණු මුදල්	83,679,590	(220,674,197)
විවිධ ණය හිමියන්ගේ වැඩිවීම	39,785,984	22,981,860
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලැබුණු ශුද්ධ මුදල් ප්‍රවාහය	**(18,636,405)**	**(203,749,506)**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලැබුණු මුදල් ප්‍රවාහය		
පොලී ආදායම	95,600,344	58,632,012
ස්ථාවර වත්කම් මිලදීගැනීම්	(239,208,494)	(247,953,041)
ස්ථාවර වත්කම් සඳහා බැහැර කිරීම		370,000
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය	**(143,608,151)**	**(188,951,029)**
මූල්‍යකරණ ක්‍රියාකාරකම් තුළින් මුදල් ප්‍රවාහය		
ප්‍රතිපාදන	207,196,487	178,504,297
වෙනත් රජයේ ප්‍රතිපාදන		
මුදල් යෙදවීමේ ක්‍රියාකාරකම්වලින් මුදල් ප්‍රවාහ	**207,196,487**	**178,504,297**
මුදල් සහ මුදල් ආදේශකයන් හි ශුද්ධ වෙනස් වීම	44,951,929	(214,196,238)
කාලසීමාව ආරම්භයේ දී මුදල් හා මුදල් ආදේශක	14,641,682	228,837,920
31.12.2023 දිනට මුදල් හා මුදල් ආශ්‍රිත	**59,593,613**	**14,641,682**
සටහන: මුදල් සහ මුදල් ආදේශක		
බැංකුවේ සහ අත ඇති මුදල්	59,593,612	14,641,682
	59,593,612	**14,641,682**

ගිණුම් සටහන්

1. ගිණුම් සඳහා වූ පදනම

වරලත් ගණකාධිකාරී ආයතනය විසින් වරින් වර හඳුන්වා දෙනු ලබන සාමාන්‍ය පිළිගත් ගිණුම්කරණ මූලධර්මල මූලික උපකල්පනල රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන් සහ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූල ව සහ පහත සඳහන් කරුණු සලකා බලා මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇතග

(අ) ලාභ සහිතව පවත්වාගෙනයන ආයතන

(ආ) ගිණුම් ප්‍රතිපත්ති අඛණ්ඩව භාවිත කිරීම

(ඇ) උපචිත පදනමින් ආදායම සහ වියදම් හඳුනාගැනීම

(ඈ) ප්‍රමිතිවලින් බැහැරවීම හෙළි කිරීම

2. සාමාන්‍ය ගිණුම් ප්‍රතිපත්ති

2.1 ක්ෂය කිරීමේ ප්‍රතිපත්ති

(a) භාවිතා කළ දින ගණන අනුව ක්ෂයවීම් ලබා දේ

(b) පහත සඳහන් ප්‍රතිශතයන් අනුගමනය කරමින් සරල මාර්ග පදනම් කරගෙන ස්ථාවර වත්කම් ක්ෂය කරනු ලැබේ.

ස්ථාවර වත්කම් වර්ගය	%
ගොඩනැගිලි	2.5
යන්ත්‍රසූත්‍ර සහ විද්‍යාගාර උපකරණ	20
ලී බඩු සහ සවිකිරීම්	10
වාහන	20
සාමාන්‍ය කාර්යාලයීය උපකරණ	20
පරිගණක දෘඩාංග සහ උපාංග	20
පරිගණක මෘදුකාංග	20
කාර්යාලීය ඇඳීම් උපකරණ	10
මෙවලම්	50
පුස්තකාල පොත්	5
ගිනි නිවීමේ උපකරණ	10

2.2 අවසාන තොග ගණනය කිරීම, භාවිත නොකරන ලද භාණ්ඩ තොග පිරිවැය මත ගණනය කර ඇත.

2.3 පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

පාරිතෝෂිකය සඳහා ගණනය කිරීම් තක්සේරු ක්‍රමය මතවන ක්‍රියාවලියක් මත සිදුකරන අතර, පාරිතෝෂික පනත පදනම් කරගනිමින් ගෙවීම් සිදු කරනු ලබයි.

2.4 අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන

පහත සඳහන් කරුණු පදනම් කොට අවිනිශ්චිත ණයකරුවන් සඳහා ප්‍රතිපාදන සපයා ඇත:

(අ) අවු 2-10 පුරා හිඟ ණය සඳහා 1 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

(ආ) අවු 10 ක් පුරා හිඟ ණය සඳහා 25 % ප්‍රතිපාදන සපයනු ලැබේ.

2.5 ප්‍රතිපාදන ලැබීම්

'SLPSAS 11' ට අනුව , දේපළ , යන්ත්‍ර සහ උපකරණ මිලදී ගැනීම සඳහා ලැබුණු දේශීය සහ විදේශීය ප්‍රදාන විනිමය නොවන ප්‍රදාන භාවිත කරමින් දැනට ක්‍රියාත්මක වන අසම්පූර්ණ ව්‍යාපෘති කොටස්, ආදායමක් ලෙස හඳුනා නොගත් වත්මන් වගකීම් ලෙස සලකනු ලැබේ.

7 ඒ වගන්ති අනුව මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම් ප්‍රකාශය

The Accounting policies & Notes to Accounts on pages 06 form an integral part of these Financial Statements. The Board of Directors is responsible for the preparation and presentation of these Financial Statements. These Financial Statements were approved by the Board of Directors and signed on their behalf.

Chief Financial Officer of NBRO

K.K.H.Randeny
Director (Finance)
National Building Research Organisation

K.K.H. RANDENY
DIRECTOR FINANCE
NATIONAL BUILDING RESEARCH ORGANIZATION
FINANCE DIVISION
99/1, JAWATTA ROAD,
COLOMBO - 05.

Chief Executive Officer of NBRO

Eng.(Dr.) Asiri Karunawardena
Director General
National Building Research Organisation

Eng. (Dr.) Asiri Karunawardena
Director General
National Building Research Organisation
No. 99/1, Jawatta Road,
Colombo 5, Sri Lanka.

Member of the Interim Management Committee of NBRO

H. U. R. Fonseka
Chief Accountant
Disaster Management Division
Ministry of Defence

H.U.R.Fonseka
Chief Accountant
Ministry of Defence
Disaster Management Division
Vidya Mawatha, Colombo 07.

Chairman of the Interim Management Committee of NBRO

General Kamal Gunarathne (Retd.) WWV RWP RSP USP ndc psc MPhil
Secretary
Ministry of Defence

General Kamal Gunaratne (Retd)
WWV RWP RSP USP ndc psc MPhil
Secretary
Ministry of Defence.

විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } ඩීඑම්ජී/ඒ/එන්බීආර්ඕ/01/23/12 ඔබේ අංකය உமது இல. Your No. } දිනය திகதி Date } 2024 මැයි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ("සංවිධානය") 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

